

# පාරාජික පාලි

HOW DOES THE THÉRAVÁDA LINGANTHARADHAŃA EVOLVE?

# පාරුපන පාලි.

---

සඞ්ක්ෂිප්ත සාරය.

---

කතෘ:-
අහංගම විද්‍යාචක්‍ෂු පරිවෙනාධිපති පණ්ඩිත (කෝද්දෙගොඩ)
ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ.

---

ප්‍රකාශක:-
මීරිගම ඩී. ජේ. ජයකොඩි නොතාරිස් රාළහාමි.

1939.

# අවතරණිකා.

1. මනුෂ්‍යයන් වශයෙන් නම්, වස්ත්‍ර වලැ දිග පළල ගැන වේ ව යි, හඳනා පොරෝනා ක්‍රමයක් ගැන වේ ව යි, කියයුතු නො වේ. "මෙ තරම් වස්ත්‍ර ගෙන මෙ ලෙසින් ඇඟ වැසුව හොත්, එයින් මනුෂ්‍ය බව දත හැකිය"යි නියම කළ ලිඞ්ගයක් නැති හෙයිනි. එබැවින් ඒ ඒ ජාතිවලැ මනුෂ්‍යයෝ තත් අයුරින් ඇඳුම් ඇඟලා යෙති. කාලයේ සැටියෙන් වයසේ සැටියෙන් දෙශයේ සැටියෙන් අභිමත ලෙසෙකින් හැඳ පෙරෙවැ ගැනුම මිනිසුන් ගේ සිරිති.

2. දෑග සව් පරපුරින් පැවැතැ එන, බුදුන් ගේ පුත්‍රයන් වශයෙන් නම්, හඳනා පොරෝනා ගැන ද, හඳනා පොරෝනා ක්‍රම ගැන ද, 'නියමයක්' තිබිය යුතු මැ යි. "මෙ තරම් වස්ත්‍ර ගෙන, මෙලෙසින් ඇඟ වැසුව හොත්, එයින් බුද්ධපුත්‍ර බව දත හැකිය"යි 'නියම' ලත් 'ලිඞ්ග'යක් තිබියයුතු හෙයිනි. එතරම් වස්ත්‍ර ගෙන එලෙසින් ඇඟ නො වැසුව හොත්, එයින් බුද්ධපුත්‍ර බව දක්වන 'ලිඞ්ග'ය මැ වෙනස් වූයේ හෝ, නො පෙනී ගියේ හෝ, වෙයි. මේ වරද සුලු ද? සුලු නො වේ.

3. මැටියෙන් වේවයි, ගලින් වේවයි, අනෙකෙකින් වේවයි, රූපයක් තනා ලිය හෙයි. ඒ රූපය බුදුන් හැඳ පෙරෙවැ ගත් ආකාරය ඇත හොත්, 'බුද්ධරූප'ය යි කියනු ලැබේ. ඒ ආකාරය නැත් නම්, 'බුද්ධරූප' යයි කිය හැකි ද? නො හැකි යැ. එය රූපයක් බව සැබැ වුව ද, එහි 'බුද්ධරූප' යෙක් නැති. බුදුන් ඇඟ වසා ලූ ආකාරය එහි නැති හෙයිනි. 'බුද්ධරූප' නො වූවක් 'බුද්ධරූප' ය යි තනා පානවුන් 'අපායට' නො යත් හොත්, කවුරු නම්, යෙත් ද? මෙ කරුණ මැ මේ ශාසනයේ ඇඟ වසන ක්‍රමය නම්, තමන් හඳුන්වා ලන 'ලිඞ්ග'ය බව දැන ගන්නට ප්‍රමාණ යි.

4. බුද්ධපරිනිර්වාණයෙන් වර්ෂ සියයක් යන තුරු එක මැ 'ථෙරවාද'ය වියැ. ඉන් මැත නානාවාදයෝ පහළ වූහ. දෙවැනි 'සඞ්ගායනා'යෙන් පන්නා හළ, දස දහසක් පාපී භික්ෂූහු 'මහා සඞ්ගීති' නම්, ආචාර්යවාදය ඇති කළහ. තෙවන 'සඞ්ගායනා' යෙන් පන්නා හළ පාපීභික්ෂූහු සැට දහසෙකි. දෙවන තෙවන 'සඞ්ගායනා' වලින් පන්නා හළ පාපීභික්ෂූහු 'ලිඞ්ගපරිවර්තන,ය කළහ. මේ බව 'දීපවංස'යෙහි ප්‍රකාශිත යි. 'ලිඞ්ගපරිවර්තන,ය නම්, 'ථෙරවාද'යේ ආ 'ලිඞ්ග'ය හැර පියා අන් සැටියෙකින් ඇඟ

වසන්නට පටන් ගත් බව යි. මොවුන් කළ මේ ශාසනවිලොපය කෙසේ ද? යනු 'ගන්ධාර'දි දෙශ වල දක්නට ලැබෙන දෙවුර වසා ලූ රූපවලින් දත හැකි යැ. මේ අප බුදුන් ගේ සතුරන් වන ඒ මහායානවාදීන් කළ දරුණු විපතෙකි. 'විභජ්‍යවාද' නම් ලද නිර්මලශාසනයට විරුද්ධ මේ ව්‍යාපාර බුදුන් පිරිනිවී දෙවන ශත වර්‍ෂයේ වී ය යි බෞද්ධෙතිහාසයෙන් පෙනේ.

5. 'සඞ්ගායනා' තුනෙකින් පවිත්‍ර වැ පැවැතැ ආ 'විභජ්‍ය වාද' නම් ලද මුල් පිරිසේ තෙරවරු මෙබඳු විපත් නො කළහ. බුදුන් ගේ ධර්‍මය ත්, මුල් පිරිස ත් ආරක්‍ෂා කර ගැනුම පිණිස මැ 'සඞ්ගායනා'ද කළහ. "**තං වණ්ණයිස්සං විනයං අමිස්සං**" යි 'විනය අටුවා' යේදී අප ගේ 'විනය ධර්‍ම'ය පළමු කී බුදු සතුරන් ගේ මත හා අමිශ්‍ර බව වදාළේ ත් එහෙයින් මැ යි. එසේ වුව ද, 'අමිශ්‍ර'ය යි වර්‍ණිතා කළ ඒ නිර්මල ධර්‍මය ලක්දිවට ගෙන ආ 'මිහිඳු' මාහිමිහු පවා අද නම්, පළමු කී බුදුසතුරන් ගේ වෙෂයෙන් දක්වා ලති. බෙහෙවින් සංවාදපත්‍ර වල 'මිහිඳු' මාහිමි නම් තබා සිත්තරුන් ලවා අඳවා පළ කරන විකාරරූප මෙයට සාධක යි. ඒ රූප ශ්‍රමණයකු විසින් ධැරිය යුතු 'ආකල්ප'ය ගත් බව 'මිහිඳු' මාහිමියන් ගෙන ආ විනයධර්‍මයෙන් නො දක්වා ලිය හැකි ය. 'මිහිඳු' මාහිමියන් ගෙන ආ ධර්‍මය නම්, 'ලලිතවිස්තර-මහාවස්තු, ආදියේ වත් මූත්, මේ තෙවළාහි නැති යි අද දක්වා නො කීහ. ටික කාලෙකින් ඒ ද කියති යි සිතිය හැකි යි. 'මිහිඳු' මාහිමි පවා විනයධර්‍මයෙහි විචාරබුද්ධිශූන්‍යයකු ගේ අයුරින් දක්වා ලීම් ආදි මේ සැහැසිකම් ආගමය දන්නා භක්තිමත් ඇත්තන් ගේ සිත් කම්පා කළ ද, ඒ රූප පළකරන්නවුන්හට නම්, ප්‍රීතිය පිණිස මැ වෙයි.

6. සද්ධර්‍මප්‍රතිරූපක වන ග්‍රන්ථ තනා ශාස්තෲශාසනය බිඳ නානාප්‍රකාර විලොප ඇති කළ භික්‍ෂුප්‍රතිරූපකනිකායන් වැද ගෙන දඹදිව වසා සිටි 'මහායානසම්ප්‍රදාය' යෙහි මුත්, එයින් කිලිටි නො වූ 'විභජ්‍යවාද' යෙහි ඔවුන් අයත් වෙෂය නො ආයේ නම්, මේ අප ගේ භික්‍ෂු පරම්පරා වල දෙවුර වැසුම කෙසේ ඇති වී ද? යනු දත ගත යුත්තෙකි. මෙ රට 'සියම්' යැ 'අමරපුර, යැ 'රාමඤ්ඤ' යැ යන නම් වලින් හඳුන් වන උභයාංසවාදී තෙරවරු තමන් 'විභජ්‍යවාදී' බව පිළිගනිති. මේ පෙළ-අටුවා ත් පිළිගනිති. එසේ වුව ත්, පළමු කී 'ගන්ධාරරූපා'දිය ආදරයෙන් සිහිපත් කරනට ත්, එහිවත්, දක්නට නො ලැබෙන ලෙසෙකින් ඇඟ වසනට ත්, හෙතුව නම්, මේ 'විනයධර්‍ම'ය වරදවා තේරුම් ගැනුම්. බොහෝ දෙනකු ත් කැඳවා ගෙන තමන් අපාය ගත වන බව තුමූ ම නො දනිත්. ඔවුන් වරදවා තේරුම් ගත් සැටි කෙසේ ද? යනු සඳහන් කළ යුත්තෙනි.

7. බුරුම රට **'සීහසූර'** රජු දවස 'කොකුමත්' නුවර **'බුද්ධඞ්කුර'** තෙර යැ, 'දීප' නුවර **'සුනන්ද'** තෙර යැ, 'තලපප' නුවර **'ජයබාහු'** තෙර යැ, 'අන්ධ' නම් ගම **'කල්‍යාණ'** තෙර යැ, සතර තෙරවරු ශිෂ්‍යයන් ලවා දෙවුර වස්වා ඔවා දෙමින් විසූහ. එවකට මේ 'විභජ්‍යවාද'යේ **'ලිඞ්ගාන්තර්ධාන'**ය පටන් ගත් බව දුටු 'තුන්න' නම් ගම **'ගුණාභිලඞ්කාර'** නම් තෙරණුවෝ මේ දරුණු අපරාධයට විරුද්ධ වැ නැඟී සිටියහ. මේ වනාහි **"සාසනවංසප්පදීපිකා"** නම් ඉතිහාසග්‍රන්ථයෙන් මධ්‍යස්ථ කෙනකුට වැටහී යන සත්‍යය යි. මේ ග්‍රන්ථය ලියන ලද්දේ උභයාංසවාදී කෙනකු විසිනි. මේ ගත්කරු 'දෙවුර වැසුම' විභජ්‍යවාදයේ පැවැත ආ 'ලිඞ්ග'ය බව දක්වන්නට ඕනෑ බව සිතී යැ. **'ධම්ම චෙතිය'** රජු දවස කළ ශාසනශුද්ධිය නිසා මෙ වකට බුරුම රට භික්ෂූහු ලක්දිව විහාරපරම්පරායෙහි බැස සිටියෝ වූහ. ඔවුනතර පැවැත ආ 'ලිඞ්ග'ය දෙවුර වැසුම නො වී යැ. මේ ගත්කරු එය මැනැවින් මැ දනි. එසේ වුව ද, බුදුන් රහතුන් පටන් අතින් අත ගෙන එන 'ලිඞ්ග'ය කොට දක්වන්නට නම්, තමන් ගේ ගුරු පරපුරේ පැවැත ආ බව කියයුතු මැයි. එබැවින් ආර්යෝපවාද අකුශල යක් වන මෘෂාවාදයක් ගොතා **"ඉච්චේවං 'සිරිමහාසීහසූර සුධම්මරාජෙන්ද්‍ර කාලෙ පාරුපනභික්ඛු නානා හුත්වා විරූපං ආපජ්ජිත්වා 'එකංසිකගණෝ' නාම විසුං භිජ්ජි"**යි 'සීහසූර' රජු දවස දෙවුර වසන භික්ෂූන් ගෙන් **'එකංසිකගණ'** ය යි කොට සක් කැඩුණු බව කියමින් සත්‍යය යට පත් කොට තබාලී යැ. මේ රජු දවස සතර තෙර කෙනකුන් ගේ නම් වෙන් කොට දක්වා, ඔවුන් ශිෂ්‍යයන් ලවා දෙවුර වස්වා ලූ බව තමන් මැ කී හෙයින් පළමු කී පවතත් පසුවැ කී පවතත් අත්‍යර්ථයෙන් මැ පරස්පර විරුද්ධ යි. මෙසේ පූර්වාපරසන්ධි ගැලපීම් නැති මේ කථායෙන් අපට මෙසේ වැටහෙයි.

බුරුම රට භික්ෂූහු 'විභජ්‍යවාදී', බැවින් එකාංස කොට ඇඟ වැසූහ. මෙහි කී 'බුද්ධඞ්කුර'දී තෙරවරුන් හට 'සුපටිච්ඡන්න' ශික්ෂායෙන් දෙවුර වැසුම 'ලිඞ්ග'ය සේ වැටහෙයි. එසින් එකාංස කොට ඇඟ වැසීමෙක් කවර ලෙසෙකින් වත්, නො වැටහෙයි තමන් ගත් සැටිය මැ ගුරු පරපුරේ පැවැතෑ අවුත්, පසු වැ නැති වී යන්නට ඇතැ යි සිතෙයි. මෙසේ තමන් ගේ වැටහීම මැ මිස අනෙකෙක් සත්‍ය නො වේ ය යි දෘෂ්ටිග්‍රාහයෙන් ගෙන සවකීය වෙෂය ඇගසවි පරපුරෙහි දූ, නගා ලමින් බොරු ගොතා කථා කරන්නට බිය නො වූ බව පෙනේ.

එකෙක් ඇත. එවකට බුරුම භික්ෂූහු දැන් මෙ රට එකාංස කාරකුවන් මෙන් ගැටවට්ටූ පස්වට්ටූ බැඳලීම් නො මැති වැ ක්‍රම

විරුඬ වැ එකාංස කොට ඇඟ වසා ගියහ යි සිතිය හැකි යි. "ඔවුහු ආචාය්‍ය්‍ය පරම්පරායෙහි එකාංස **කිරිම** පැවැතැ එන බව කියන්නට දත හ්, තුන්සිවුරු එකතරම් බව නො දත් හෙයින් පැවැතැ ආ නිසි මඟ ත්, කලින් කල ඇති වුණු වෙනස් කමු ත්, කියන්නට නො දත්හ" යනු දු, සිතිය හැකි යි.

8. ආචාය්‍ය්‍යපරම්පරාව බැලිම ත් විනධම්යෙහි නියමි. අප ගේ සබ්‍රම්සරුන් විසින් ආචාය්‍ය්‍යප්‍රවෙණිය බැලිය යුතු මැ යි. තමන් දෘගසච්පරපුර හා සම්බන්ධ හෙයිනි. මෙසේ හෙයින් ප්‍රවෙණිය බලක් මැ, ඒ ප්‍රවෙණියේ නො පැවැති සිරිතෙක් නු යි, 'සුනන්ද, ආදී තෙරවරු ඇති කළ උභයාංසවාදය ගුරුපරපුර ගරු කළ බුරුම භික්ෂූන් නො පිළිගත් බව පෙනේ. මෙසේ හෙයින් මෙය ගැන බුරුම රට බලවත් විවාද ඇති විය.

9. 'සීහසූර' රජු දවස ඇති කර ගත් මේ වාදය 'අලෞංප්‍රා, රජු දවස අවසන් වුණුබව පෙනේ. ඒ අවසානය නම්, බුරුම රට සියලු භික්ෂූන් විසින් 'උභයාංසවාද'ය පිළිගත යුතුය යි නිකුත් වුණු රාජාඥයෙන් විය. මෙ තෙකින් බුරුම රට මේ විලොපය මුදුන් පැමිණියේ විය. මෙසේ **'අලෞංප්‍රා'** නම් රජු දවස වර්ෂ දෙදහසක් පමණ 'විභජ්‍යවාද'යේ ඇති නො වුණු ශාසන සමයට සර්වප්‍රකාරයෙන් විරුඬ අභිනව 'ලිඞ්ග'යක් 'උභයාංසවාද' නමින් බුරුම ශාසනයේ මස්තකප්‍රාප්ත විය යි දතයුතු. මේ **'ලිඞ්ගානනකාන'**ය පටන් ගත් සැටි යි.

10. විස්තරාර්ථීන් හට **'සාසනවංසප්පදීපිකා'**ව හෝ, අප විසින් ලියන ලද **'පාරුපන සිඛ'** නම් ග්‍රන්ථයෙහි 'උභයාංසෙතිහාසය, හෝ බැලීම ප්‍රයොජනවති.

11. අප විසින් **පරීක්ෂා** කළ යුත්තේ ඒ ඒ වාදීන් විසින් කවර කවර විනයප්‍රදෙශ ඉදිරි පත් කරන ලද ද? යනු යි. ඔවුනොවුන් ගේ වාගාඩම්බරයෙන් වත්, මතිමාත්‍රයෙන් වත්, වැඩ නැති හෙයිනි. 'සාසනවංසප්පදීපිකා'යෙහි ලිඞ්ගපරිවර්තනය කළවුන් ඉදිරි පත් කළ එක ද විනයප්‍රදෙශයෙක් සඳහන් වැ නැත. ප්‍රවෙණිපාලකයන් ඉදිරි පත් කළ සාධක දෙකක් සඳහනි. පළමු වැන්න නම්, ආචාය්‍ය්‍යප්‍රවෙණියෙහි දෙවුර වසා ගම් වැදීම නො පැවැති බව යැ. දෙවැන්න නම්, ගම් වදනා කල එකාංස කොට පෙරෙවැ සිවුර මත පටියක් බැඳ යායුතු බව **'චූලගණ්ඨිපද'** යෙහි එන බව යි.

12. 'සාසනවංසප්පදීපිකා,කාරයෝ 'චූලගණ්ඨිපද, යෙහි එසේ එන බව සැබැවැ යි ද, ඒ නො පිළිගතයුතු පොතෙකැ යි ද, කීහ. ඒ නො පිළිගතයුතු පොතක් වන්නට හෙතුව නම්, දෙවුර

වසා සිවුර මත පටියක් බැඳ ලීම නො කළ හැකි බව පෙනියාම සි. 'ලිඞ්ගපරිවර්තිත'ය කළවුන් 'චීවරබන්ධ'ය ස්වවෙෂයට බාධක නු සි, නානාතර්කණ නඟමින් ප්‍රතික්ෂෙප කරන බව පෙනේ. එහි එක් තර්කණයෙක් නම්, බුදුන් එබන්දක් නො බැන්ද බව සි. මේ කාරණය සත්‍ය විය හැකි සි සිතිය හැකි යැ. බුදුන් 'අංසකාඩක්,ද ධැරූ බව නො පෙනේ. තවත් තර්කණයෙක් නම්, අටපිරිකරෙහි පටි දෙකක් නියම නැති බව සි. මෙ ද සැබව. අටපිරිකරෙහි 'අංසකාඩ'ද නැති බව පෙනේ. තවත් තර්කණයෙක් නම්, පෙළෙහි කිසිදු තැනෙකැ පටි දෙකක් නියම නැති බව සි. මෙ ද සැබැව. පෙළෙහි කිසිදු තැනෙක 'අංසකාඩ'ද නියම නැති. තවත් තර්කණයෙක් නම්, 'කටිසූත්‍ර'ය විනයධර්මයෙහි තහනම් බව ත්, සිවුර මත පටිය බඳනා තැන කටිපර්‍යාපන්න බැවින් ඒ පටිය කටිසූත්‍ර සඞ්ඛ්‍යාවට යේ නු සි, වරද බවත් යැ. **"අම්බගහපිටියේ"** හෙරණුන් වහන්සේ ආදී පිරිස අධිශීලය ලැබැ ලක්දිවට එද්දී බුරුම රටින් ලක්දිවට එවන ලද සන්දෙශයෙහි:- **"උදරබන්ධනවෙඨනන බන්ධනබන්ධනඤ්ච කටිපරියාපන්නමෙ'ව"**සි සඳහනි. සිවුර මත බඳනා පටිය කටිපර්‍යාපන්න බව මේසින් කියා. මේ හෙතුයෙන් ඒ වරද වෙසි නම්, අඳනය මත පටිය බඳනා තැන ත් කටිපර්‍යාපන්න නු සි, එ ද හළ යුතු සි. තවත් තර්කණයෙක් නම්, 'චීවරබන්ධ'ය සූත්‍රානුලොමාදීන්හි අප්‍රවිෂ්ට බව සි. එසේ නම්, 'අංසකාඩ'ත් අප්‍රවිෂ්ට සි.

මෙසේ ලිඞ්ග පරිවර්තිතය කොළෝ ස්වකීය වෙෂයට බාධක වැ සිටි 'චීවරබන්ධ'ය විනයධර්මයෙන් පන්නා හරනට කුතර්ක මතු කරලූහ. ඒ තර්කීයන්ගෙන් බෙහෝ තර්කී තමන් ගේ 'අංසකාඩ' මත ද වැටෙන බව තුමූ මැ නො දත්හ. මේ ඇත්තන් මෙසේ කිව ත්, 'චීවරබන්ධ'ය 'භක්තග්‍රවත' දක්වන තැන 'විනය අටුවා' යෙහි වදාළහ. එ ද, 'අටුවා නියමයක් බව' එහි මැ වදාළහ. එබැවින් එය ගැන 'පෙළ' සොයා වෙහෙසීම විඵලප්‍රයත්නයෙකි. 'විනය අටුවා' ප්‍රමාණ කොට ගත් 'චූලගණ්ඨිපද, යට දෙස් නගා ලියා තැබීම බලවත් වරදෙකි. මේ වාදීන් පෙළ ත් අටුවා ත් සසඳා නො බැලූ බව පෙනේ. සසඳා බැලූහු නම්, කුතර්ක ත් මතු නො වේ. බුරුම රට ආචාර්‍යප්‍රවෙණිය කෙරෙහි ද; ස්නෙහය ඇති වේ. මේ පොතේ 16-17-18 පිටු වල මේ ගැන පෙළ අටුවා මැනැවින් සසඳා දක්වා ඇත. බුරුමරට උභයාංසවාදීන් විසින් එරට ආචාර්‍ය ප්‍රවෙණියට විරුද්ධ වැ නැඟ කරන ලද්දේ බලවත් ශාසනවිලොපයක් බව මෙ රට බුරුම නිකායික ගුණවතුන් හට වැටහී යන සැටියෙන් අටුවානියමය මතු කර ඇත. 'ගඩලාදෙණි' වෙහෙර ඉපැරණි 'බුද්ධ ප්‍රතිබිම්බ'යක් 'චීවර බන්ධ'යෙන් සැදුණු බව ඇසූම්හ. **ශ්‍රී. ඩී. පී.**

ධම්මරතන මහනුවර නොතාරිස් රාළහාමි ගේ ත් **සයිමන් විතාරණ** මහතා ගේ ත් ආරාධනායෙන් මේ ප්‍රතිමාව දක්නට ගියෙමු. "ඒ විභජ්ජවාදීන් ගේ බුඩප්‍රතිමායෙක් නො වේ" යනු අප අදහස යි. එහි පෙනෙනුයේ 'චීවරබන්ධ'ය ද නො වේ. මෙයට ත් විශාල මෙ බදු රූප දෙකක් දෙමට ගොඩ 'ධම්ප්‍රාසාද'යේ ද ඇත.

13. බුරුම රට 'ලිඞ්ගපරිවර්තන'ය කළ තෙරවරුන් ඇරූ පෑ 'ප්‍රමාණපාඨ' නම් කිම? යනු 'සාසනවංසප්පදීපිකාකාර'යන් නො කිව ත්, **"ජාගර"** මහා සථවිරයන් වහන්සේ විසින් ලියන ලද **"ලඞ්කා සාසන විසුද්ධි කථා"**යෙහි ප්‍රකාශිත යි. **"ගණ්ඨිකං පටිමුඤ්චිත්වා"** යනාදි අටුවා ත්, **"සාරත්ථදීපනී-විමතිවිනොදනී"** ටීකා පාඨ ත් දක්වා උභයාංසවාදය පිළිගතයුතු බව එහි කථිත යි. මෙ රට වාදීන් දන්නා පාඨ මුත්, අනෙකෙක් එහි නැත.

**"තථා අකත්වා පන ජත්තුං වා උරං වා විවරිත්වා ගච්ඡන්තස්ස දුක්කටං"** යන අටුවා පාඨය **"තථා අකත්වා පන ජණ්ණුං වා උරං වා විවරිත්වා ගච්ඡන්තස්ස දුක්කටං"**යි 'ජාගර, මහා සථවිර යන් වහන්සේ දැක්වූහ. 'ජාතු'යි දසරුවට නම් නො වන හෙයින් මේ අපපාඨයෙකි. මේ පාඨයට අර්ථ කියමින් **"කඞ්ඛාවිතරණී පිට්ඨපොතෙ"**හි **"ජත්තුං වා, දසරුව හෝ"**යි අර්ථ කීහ. දන විවෘත කර ගෙන යාම නිසා වදාළ 'සුපටිච්ඡන්න' ශික්ෂායෙක් ද නැති. 'යට කය වැසීම'යැ 'උඩු කය වැසීම'ය යි පෙරෙවුම දෙවැදෑරුම්. යට කය පෙරෙවුම අඳනයෙනු දු, උඩු කය පෙරෙවුම පොරෝනයෙනුදු, සිඩ යි. දන දෙක යට කය වැසීමෙහි ඇතුළත්. මෙ තන්හි එය සිහි කරනට වත් කාරුණ්‍ය නැති. උන්වහන්සේ දක්වා ලූ ඉතිරි පාඨ අප රට උභයාංසවාදීන් එළවන පාඨ මැයි. බුරුම රට 'ලිඞ්ගපරිවර්තන'ය කළෝ ත්, ලක්දිව 'ලිඞ්ගපරිවර්තන'ය කළෝ ත්, '**සුපටිච්ඡන්න**' ශික්ෂාවම ප්‍රමාණ පාඨ කොට අර්ථ වරදවා ගෙන සිටියහ.

14. **"චීවරං පාරුපිත්වා"** යනාදි පාඨ ත් ඇතැම් බුරුම තෙරවරුන් 'උභයාංසවාද'යට නිදර්ශන කරන බව පෙනේ. 'සිවුර පෙරෙ වැ, කියනට හෙතුව, නො පෙරෙ වැ සිටීම යි. නො පෙරෙ වැ සිටීම් නම්, එකාංස කොට සිටීම යි. පෙරෙ වැ සිටීම නම්, දෙවුර වසා ලීම යි, යනු ඔවුන් අදහස බව සිතිය හැකි යි. 'චීවරං පාරුපිත්වා' යනාදි තන්හි 'චීවර'යි වදාරන ලද්දේ සඟළ සිවුර යි. එසින් ඒ කියන ලද්දේ 'සඟළ' ගැටවට්ටි ලීම ගැන යි. **"පත්තචීවරමාදාය"** යනාදී පාඨයන්ගෙන් 'චීවර'යි කියන ලද 'සඟළ' නො පෙරෙවැ ගෙන යන බව පෙනේ. ග්‍රාමසමීපයෙහි එය පෙරෙවැ ගැනුම සිරිති. මෙසේ හෙයින් 'චීවරං පාරුපිත්වා' යනාදියෙහි **චීවරං, සඟළ ; පාරුපිත්වා, සුපිළිසන්සිඳගෙන වදාළ ලෙසින්,**

**ගැටමඝ වමු ගන්වා පෙරෙවැ**"යි අපි **කි**යයුතු යි. බුරුම තෙරවරුන්ගේ වාද ගැන මෙයට වඩා යමක් ලියයුතු නො වේ. 'සුපටිච්ඡන්න, ශික්ෂායෙහි තාත්පර්යය මේ ග්‍රන්ථයෙහි හෙළි වන හෙයිනි. දැන් අප විසින් පරීක්ෂා කළ යුත්තේ ලක්දිව විවාද මාර්ග ගැන යි.

15. **'සිප්කඩුවේ ශ්‍රීසුමඞ්ගල**, නායක ස්වාමීන්ද්‍රයන් ලිඞ්ග පරිවර්තනය කළ හෙයින් ලක්දිව මේ විවාදය උත්පන්න විය. 'සුපටිච්ඡන්න' ශික්ෂායෙහි වදාළ අටුවා පාඨයෙහි තේරුම කුමක් ද? දෙවුර වැසුම පැවැසෙයි ද! නොහොත් 'එක උරය වැසුම, පැවැසෙයි ද! යනු විනිශ්චය කළ යුතු විය. මේ කාරණය ගැන කරන ලද විවාදයන් අතුරෙන් විශෙෂයෙන් සැලකියයුත විවාදය නම්, 'කැලණි වාද'ය යි. ක්‍රිස්තුවර්ෂයෙන් 1883 වැනි වර්ෂයේදී 'කැලණි විහාර'යේ දී **'ශ්‍රීසුමඞ්ගල'** නායක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ පක්ෂයේ ද, ශ්‍රීධර්මාලෝක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ ලිඞ්ගපරිවර්තනය නො කළ පක්ෂයේ ද, විවාදය විය.

'ශ්‍රීසුමඞ්ගල' නායක ස්වාමීන්ද්‍රයන් හට මේ තෙරවරු වහල් වැ කරුණු මතු කර දුන්හ:-

**මුල්කිරියාවේ ගුණරතන,**
**තලාහේනේ අමරමොලි,**
**රත්මලානේ සුමනතිස්ස,**
**කොටුවේගොඩ ඤාණානන්ද,**
**හෙයියන්තුඩුවේ දේවමිත්ත,**
**පොල්වත්තේ සෝමානන්ද,**
**කොස්කඳවල සුනන්ද,**
**වලානේ ධම්මානන්ද.**

මේ තෙරවරු එදින 'උභයාංස වාද'යට කරුණු සපයා දුන් ආධාරකාරීහු යැ.

'ශ්‍රීධර්මාලෝක' ස්වාමීන්ද්‍රයන් හට මේ තෙරවරු වහල් වැ කරුණු සපයා දුන්හ:-

**පොතුවිල ශ්‍රී ඉන්දජෝති,**
**රත්මලානේ ශ්‍රී ධර්මාරාම,**
**මාතර රේවත,**
**ජල්තර සුමන,**
**බැදිගම ශ්‍රී රතනපාල,**
**බත්කරමුල්ලේ සුභූති,**

**බොරලැස්ගමුවේ අත්ථදස්සී,**
**කැලණියේ සඞ්ඝරක්ඛිත.**

මේ එ දින 'උභයාංසවාද'ය නො පිළිගතයුතු බවට කරුණු සපයා දුන් ආධාරකාරීහු යැ. මේ විවාදය ලිපි මගින් කරන ලද් දෙකි. 'විනිශ්චය' නුවර උභයමහාවිහාරගත සඞ්ඝසභාගේදී ගතයුතු ලෙස සම්මත කර ගන්නා ලදී.

---

'ශ්‍රී සුමඞ්ගල' නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මතු දක්වන ප්‍රශ්න 'ශ්‍රී ධර්මාලොක, ස්වාමීන්ද්‍රයන් අතින් ඇසූහ:-

1. භික්ෂූන් විසින් අන්තරඝරයට වැදීමේ දී උත්තරාසඞ්ගය ත් සඞ්ඝාටිය ත් දෙක එකට අල්ලා ගණ්ඨිය පාසේ අමුණා පෙරෙවිය යුතු ද? නැද් ද?

2. අන්තරඝරයට යන විට ත්, එහි හිඳින විට ත්, යන කාල දෙකෙහි විවෘත වැ තිබෙන අවයව වල වෙනස කිම?

3. ගිය අවුරුද්දේ නුවරගම මහාසඞ්ඝසභාවෙන් සිවුරු පෙරෙවීම පිළිබඳ කොට ලියුම් එවන කාලෙ පාත රට සියාම් සමාගමේ භික්ෂූන් අතරේ ගණ්ඨි අමුණා පෙරෙවීමෙක් තිබුණාද? නො තිබුණා නම්, වරද නො වේ ද?

4. අන්තරඝරයට යන විට ග්‍රීවා වසා යායුතු නො වේ ද?

5. "තථා අකත්වා භික්ඛුස්ස
ජත්තූනි'පි උරම්පි ච"

යන්නෙන් 'ජත්තු, නමින් කියා තිබෙන්නේ කුමක් ද?

6. පිණ්ඩචාරික භික්ෂූන් විසින් දායකයන් දෙන භික්ෂාව පිළිගන්නට පාත්‍රය එළවනු පිණිස සඞ්ඝාටිය ඔසවන්ට ත්, භික්ෂාව දුන්නාට පසු සඞ්ඝාටියෙන් පාත්‍රය වසාගන්ට ත්, ඕනෑ ද? එසේ කරන්ට ඒකාංස කොට පොරොවා ගෙන පුළුවන් ද?

7. "සඤ්චිච්ච ගීවං මණිබන්ධඤ්ච අපටිච්ඡාදෙන්තස්ස ආපත්ති" යන මෙහින් ග්‍රීවා වත්, මිණිබහන වත්, නො වසා පොරොවා ගෙන ගිහි ගෙයට යන්නවුන්ට ඇවැත් බව සැබෑ ද?

8. ග්‍රීවා වසන ඉඩමක් නියම කර තිබේ ද?

9. **"ගලවාටකතො පට්ඨාය සීසං, මණිබන්ධතො පට්ඨාය හත්ථෙ** ......................"

මෙහි කියා තිබෙන ලෙස අත් දෙකේ මැ විවෘත කරනු ලබන්නේ මණිබන්ධයෙන් පාත නො වේ ද?

10. "ජඞ්ඝෙය්‍ය-ගීවෙය්‍ය" කරන්නට නියම කර වදාළ ප්‍රඥප්තියක් වත්, නො කොළොත් වන ඇවතක් වත් තිබේ ද?

11. "පරිමණ්ඩලං පාරුපිතබ්බං-සුපටිච්ඡන්නෙන අන්තර ඝරෙ ගන්තබ්බං-සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ නිසීදිතබ්බං" යන තුනේ මැ කියා තිබෙන්නේ එක මැ පාරුපනයෙක් ද?

12. **"කීර්ති ශ්‍රී රාජ"** කාලයෙහි 'අයොධ්‍යා පුර' යාන සඞ්ඝපරම්පරාවේ සියාම් රටේ දැන් වසන සඞ්ඝයා අතරේ දැන් කරන සුපටිච්ඡන්න පෙරෙවීමෙහි උභයාංසය වැසීමක් තිබේ ද? නැද්ද?

---

**'ශ්‍රී ධම්මාලොක'** ස්වාමීන්ද්‍රයන් වහන්සේ මතු දක්වන ප්‍රශ්න **'ශ්‍රී සුමඞ්ගල'** නායක ස්වාමීන්ද්‍රයන් අතින් ඇසූ හ:—

1. විහාරාරාමධම්මශාලාප්‍රවෙශ හා දීසිමාගීගමනයෙහි දී "සුපටිච්ඡන්න" නො වි යා යුතු ද?

2. එකාංස කොට පෙරෙවීම වැරදි ද?

3. නුවරගම භික්ෂූන් වහන්සේ ලා අතරේ උභයාංස ප්‍රාවරණයෙක් තිබේ ද?

4. බුරුම නිකායේ පවත්නා උභයාංසප්‍රාවරණවිධිය ත්, නුවරගම පවත්නා උභයාංසප්‍රාවරණවිධිය ත්, එක සමාන ද?

5. අසමාන නම්, දෙකින් දෙශනානුකූල වන්නේ කවර විධිය ද?

6. "පරි මණ්ඩලං පාරුපිතබ්බං උභො කණ්ණෙ සමං කත්වා" යන දෙශනාපාළියෙහි දක්වා තිබෙන ප්‍රාවරණ විධිය එකාංස ප්‍රාවරණයෙක් ද? උභයාංස ප්‍රාවරණයෙක් ද?

7. "පරිමණ්ඩලං පාරුපිතබ්බං උභොකණ්ණෙ සමං කත්වා" යන මෙහි "උභො කණ්ණෙ' යි කියේ කවර දෙකොන ද?

8. මෙහි "සමං කත්වා" කීයේ කොබඳු සමකිරීමකට ද?

9 මෙහි කී "පරිමණ්ඩල ප්‍රාවරණ" ය වදාළේ වෙහෙර ට ත්, ගමට ත්, දෙකට ද? වෙහෙර ට පමණක් ද?

10. "පරිමණ්ඩලප්‍රාවරණ" ලක්ෂණ කියා තිබෙන්නේ කෙසේ ද?

11. 'පරි මණ්ඩල ප්‍රාවරණ' යෙන් වෙන් වූ සියලු පෙරෙවුම් 'ගිහිපාරුපන' නොවේ ද?

12. 'සුප්‍රතිච්ඡන්න' උභයාංස ප්‍රාවරණ විධිය දක්වා තිබෙන්නේ කවර පෙළ-අටුවා ආදියෙක ද?

---

බුරුම වාද මෙන් මැ මේ වාදය ත් **"තුන් සිවුරට සමාන ශික්ෂා යැ, සමාන අවකාශ යැ"** යනු කල්පනා නො කොට කළ වාදයෙකි. එසින් මැ ඔවුනොවුන් ගේ උත්තර ප්‍රත්‍යුත්තර මෙහි ඇද දැක්වීම නිෂ්ප්‍රයොජන සි.

"**වත්ථුම්පි පුච්ඡි, නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි,**' යනාදීන් 'විනය අටුවා' යේ දී 'විනය ධර්ම' ය සඞ්ගායනා කළ සැටි වදාළහ. "විනය ශික්ෂා" වක් තේරුම් ගන්නට ප්‍රශ්න නඟාලිය යුතු ක්‍රමය ත්, එය මැ වෙයි. මේ විවාදය ඒ යා යුතු මාර්ගයේ නො ගියේ කිම් ද? යනු ආශ්චර්යයි සි.

'ශ්‍රී සුමඞ්ගල' නායක ස්වාමීන්ද්‍රයන් විසින් නඟන ලද ප්‍රශ්න ගැන අප ගේ වැටහීමේ සැටියෙන් කියයුතු කාරුණු කිහිපයෙක් ඇත. 'ශ්‍රී සුමඞ්ගල' නායක ස්වාමීන්ද්‍රයන් ගේ 4-7-8-10 වන ප්‍රශ්න අර්ථයෙන් නම්, එක මැ ප්‍රශ්න යෙකි. 'බෙල්ල වැසුම' සිත තබාගෙන අසන ප්‍රශ්න හෙයිනි.

මෙහි අපට වැටහෙන සැටි මෙසේ සි. 'විනය අටුවා' යෙහි ඇඟ වසන සැටි දක්වමින් **"අනුවාතකෙනෙන ගීවං පටිච්ඡාදෙත්වා"** සි වදාළ බව සැබැව. දෙවනු වැ විවෘත වැ තිබිය යුතු තැන් දක්වමින් **"ගලවාටකතො පට්ඨාය සීසං"** යී ත් වදාළහ. වසන සැටි වදාළ තැන 'ගීවා' ශබ්දයෙන් සම්පූර්ණ ගලය ගත මනා නම්, ඒ වැසීමෙන් හසු නො වී පැවැතිය යුතු අවයව වදාරන දෙ වන තැන **"ගලතො පට්ඨාය සීසං"** සි 'ගලය පටන් හිසය' සි කිය යුතු යැ. "**ගලවාටකතො පට්ඨාය සීසං**' සි "ගලවළු පටන් හිසය" සි වදාරන්නට හෙතුව කිම! එකාන්තයෙන් මැ '**ගීවං පටිච්ඡාදෙත්වා**' යන තන්හි 'ත්වා' ශබ්දයෙන් සම්පූර්ණ ගලය නො ගැනුම්. එසේ නම්, එසින් ගලයේ කවර ප්‍රදෙශයෙක් ගැණේ ද? ගලවළු දක්වා ගැණේ. ඒ ගලප්‍රදෙශය මුත් ඉන් වැඩියක් නො ගැණියන බව හැඟී යන්නේ නො වැසී තිබිය යුතු තැන් වදාරමින් '**ගලතො පට්ඨාය සීසං**' සි නො වදාරා '**ගලවාටකතො පට්ඨාය සීසං**' සි වදාළ දෙ වන වචනයෙනි.

මෙසේ හෙයින් '**ගීවං පටිච්ඡාදෙත්වා**' යන තන්හි 'ගීවා' ශබ්දයෙන් දෙ පස ගත යුතු 'ඉඩම' ගලවළු දක්වා යැ යනු අටුවාහි මැ ප්‍රකාරාන්තරයෙකින් නියම කොට වදාළ බව පෙනේ.

ලිඞ්ගපරිවර්තනය පටන් ගත් කාලයේ පටන් මැ මේ ප්‍රශ්නය ප්‍රශස්තප්‍රශ්නයක් වැ තුබුණේ යැ. ප්‍රශස්ත වන්නට හෙතුව නම්' **'ගණ්ඨිකං පටිමුඤ්චිත්වා'** යනාදි පාඨයෙන් එකාංසයක් හා එක්මිණි බහනක් මැ වැසී යන සැටියෙන් නුවා යෙන් ග්‍රීවා වැසිය යුතු කොට වදාළ බව ප්‍රකාශයට නො යාම යි. දැන් ඒ අටුවායෙන් අංස දෙක හා මිණිබහන් දෙක වැසීයන සැටියෙන් නුවායෙන් බෙල්ල වැසුම නො වැ, එකාංස යක් හා එක්මිණි බහනක් මැ වැසීයන සැටියෙන් නුවායෙන් බෙල්ල වැසුම නියම බව ප්‍රකට නු යි, පූර්වොක්ත ප්‍රශ්නය නිරායාසයෙන් මැ ගිලෙයි. එකාංසයක් වැසී යන පරිද්දෙන් දෙපස ගලවළු දක්වා මුත්, බෙල්ල වටා වැසුමක් අසිඬ හෙයිනි.

පස්වනු වැ මතු කරන ප්‍රශ්නයෙන් තමන් වහන්සේ ගත් අදහස **'සුද්ධපච්ඡාදවිහාවිනි'** යෙන් පෙනේ. **'කායං විවරිත්වා'ති, ජත්තුම්පි උරම්පි විවරිත්වා**, යන තන්හි **'ජත්තුම්පි උරම්පි විවරිත්වා'**යි වදාළේ 'එකාංසකොට පෙරෙවැ ගෙන'යනු දක්වන්නට යැ යනු එහි කල්පනාව යි.

**"සවග මහණුන් එකාංස කොට පොරෙවා ඇතුළුගමෙහි ගිය හෙයින් ඒ වළක්වනු පිණිස මේ තුන්වන ශික්ෂාපදය පණවා වදාළ බව ප්‍රකාශ කරණ ලද්දේ"යි.**

දැක්වුණු අටුවා වචනය විවරණ කළ 'සුඬපච්ඡාදවිහාවිනී' පාඨ යි. 'විනයවිනිශ්චය'යේ ත් **'ජත්තුනි'පි උරම්පි ච'** යන්නෙ නු දු, "උරහිස් දෙක වසාගෙන යා යුතු බව මැ ප්‍රකාශිත යැ"යනු ත් 'සුඬපච්ඡාදවිහාවිනි' යේ කල්පනාව යි. මේ පිළිගත හැකි ද? 'ජත්තු'යනු දසරුවට නම් වන හෙයින් නො මග ගොස් මේ කලපනා ඇති කර ගත් බව පෙනේ. ලිඞ්ගපරිවර්තනසඞ්ඛ්‍යාත දරුණු විපතේ මූල නම්, මේ වැරදි කලපනාව බව කිය යුතු යි. මෙ තන්හි යථාර්ථය මේ ග්‍රන්ථයෙහි 5-6-7-8 පිටුවල ඇතුළත්හි.

සවන ප්‍රශ්නය ත් ලිඞ්ගපරිවර්තනය කළවුන් තමනට බො හෝ ප්‍රයොජනවත් කොට සිතූ තැනෙකි. එ ද ප්‍රයොජනවත් වූයේ 'විනය අටුවා'යෙහි ගම් වදනා කළ එකාංස කොට මැ ඇඟ වැසිය යුතු කොට වදාළ බව අප්‍රකට වැ තුබුණු ගත වුණු කාල යේ යැ

**"වාමහත්ථෙන සඞ්ඝාටිං**<br>
**උච්චාරෙත්වා'ථ භාජනං**<br>
**දක්ඛිණෙන පණාමෙත්වා**<br>
**භික්ඛං ගණ්හෙය්‍ය පණ්ඩිතො"**

වමතින් සඟළ ඉවත් කොට දකුණතින් පය ප්‍රණාමය කොට පිඬු ගත යුතු බව ප්‍රකාශිත යි. මෙහි 'සඞ්ඝාටි'යි කීයේ සඟළේ එක

දේශයකි. පාත්‍රය වසන චීවරප්‍රදේශය "**පත්පිටු**" යි ඉපැරණි විනය ප්‍රකරණයෙක එයි. "**වම්දතින් පත්පිටු බහා**"යි ඒ "සිබ වළඳ විතිස"යි.

11 වන ප්‍රශ්නය නිරවුල් කර ගන්නට බැලිය යුත්තේ ශික්‍ෂා වල අභී පරීක්‍ෂා කරනට වදාළ මාර්ගයේ යාමෙනි. එහි මඟ නම් 'උපන් වරද' ආදිය බැලීම යි. දෙ කොළවර විෂම කොට පෙරෙවීම නිසා '**පරිමණ්ඩලං පාරුපිතබ්බං**' යනු එයි. ඒ පෙරෙවී මෙන් වැසුණු උර හිස ත් ළය ත් විවෘත කර ඇතුළු ගෙහි යාම නිසා '**සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං**' යනු එ යි. ඇතුළු ගෙහි එලෙස හිඳීම නිසා '**සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ නිසීදිතබ්බං**' යනු එයි. 'සුඛවණ්ණාදවිභාවිති' යේ කල්පනාව නම්, සතර පලක් පෙනී යන සේ යා යුතු බව හා, පස් පලක් පෙනී යන සේ හිඳ ගත යුතු බව යි. දෙ වන ප්‍රශ්නය ත් මේ අදහස මැ ගහී කොට ගෙතූ බව සිතිය හැකි යි.

විශෙෂයෙන් සැලකිය යුතු 9 නව වන ප්‍රශ්නය මේ ග්‍රන්ථයේ මැනැවින් මැ එන නිසා මෙ තන්හි කිසි දු කිය යුතු නො වේ. මේ අප ලක්දිව සිද්ධ වුණු සැලකිය යුතු විවාදයේ ප්‍රශ්න යි. මේ ප්‍රශ්න ලොකයා ට ප්‍රයොජන වත් විය හැකි යි. විවාදයට හෙතු වූයේ කවර කවර කරුණු ද? යනු මෙයින් දත හැකි හෙයිනි.

උභයාංස පක්‍ෂයෙන් මතු වුණු 1–3 වන ප්‍රශ්න ගැන එකාංස කරන ඇත්තන් විසින් සිත් යොමු කළ යුතු යි. "**තුන් සිවුරේ දිග පලල එක තරම්**" යි නො දන්නා සියල්ලෝ මැ සගුණ කිරීම යැ, ගැට වටු පස් වටු බැඳලී ම යැ, දෙ කොළවර සම කිරීම යැ යනාදිය ත් නො දනිත් මැ යි. "**කොළින් සිවුරු**" සකස් කිරීම ගැන කියනු කිම?

තවද, උභයාංසවාදයට බලවත් සාධක කොට කියන දෑ යෙක් නම්, 'සිවුරු ගැබ' යි. 'සිවුරු ගැබි'න් අත් නගා ලූ බව අටුවා වලැ එ යි.

"**සන්ධා චීවරගබ්භතො හත්ථං පසාරෙත්වා එථ භික්ඛවෙ චරථ බ්‍රහ්මචරියන්ති ආහ**" යනු 'ධම්පියාටුවා' යෙහි 'අග්ගිදත්ත බ්‍රාහ්මණකථා'යි.

"**සිවුරු ගැබින් නෙරූ අත් පහරයි-දෙජන් වසා පොරො-වන බැවින් සිවුරුගැබ්හි සැඟවුණු අත් එයින් නෙරයි, පහ රයි, යූෂේයි**" යනු 'ධම්පියාටුවා ගැටපදසන්නය'යි.

මේ සන්නයෙහි පැරණි අත් පොත් වලැ "**දෙජන් වසා—දෙඅන් වසා—දෙඅත් වසා**"යි පාඨ තුනක් එන බව "**ශ්‍රීමත්**

**ජයතිලක තුමා"** කියයි. එතුමා විසින් සංශොධිත 'ගැටපද සන්නය'ය බැලිය යුතු. එයින් 'දෙඅත්' යනු 'දෙඅන්' යන්න වෙනස් කර ලියා ගත් පාඨ යි. 'දෙඅන්' යනු 'දෙජන්' යන්න වෙනස් කර ලියා ගත් පාඨ යි. මූල පාඨය 'දෙජන්' යනු යි. ඉතිරි පාඨ දෙක එයින් නිපන් පාඨදොෂ යි. 'විනය අටුවා' යෙහි එකාංස කොට ගැට වටු ගන්වා ලියයුතුබව මැ වදාළෙන් "ගැටපද ය අටුවාවට විරුද්ධ නො වේ නු යි" පළමු පාඨ දෙක අපපාඨ බව පැහැදිලි වැ සිතිය යුතු යි.

**"දෙජන් වසා"** යි විවරණ කරනට හෙතු කිම ය න්? මේ වනාහි බුදුන් හිඳ ගත් අවස්ථා හෙයින් ඒ අවස්ථා බලා විවරණ කළ යුතු බැවින් එසේ විවරණ කළ හ. **"සත්ථා වාලුකාරාසිමත්ථකෙ නිසීදි"** යි මේ කථායෙහි අටුවායෙහි වදාළ හ. වැලි ගොඩ මත හිඳ ගෙන ධම් දෙසා සිවුරු ගැබින් අත් තහා ලූ හෙයින් යථොක්ත විවරණය සටින වෙයි. 'චීවර ගබ්භ' යනු එකාංස කොට ඇඟ වසා ලූ බුදුන් ගේ ශරීරයෙහි ගබ්භාකාර ව සිටි, හෙවත් ශරීරය වටා සිටි සිවුර යි. ඒ සතර ඉරියව්හි දී මැ ඇත.

මේ කථායෙහි වේව යි, අන් තැනෙක වේව යි, පලක් බැඳ හිඳ ගත් කල ශ්‍රී හස්ත යම් තැනෙක තැබිය යුතු නො වේ ද? තැබිය යුතු මැ යි. කොතැන ද ඒ තැබිය යුතු තැන? සිවුරු ගැබ මත යි. හෙතුව කිම? අන් තැනක් නැති හෙයිනි. එබැවින් ඒ අත තහන්නේ නම්, සිවුරු ගැබින් තහන්නේ යැ. හුබුයේ සිවුර ඇතුළේ නො වැ සිවුරු ගැබ මත බැවිනි. මෙසේ හෙයින් දක්වනලද 'ගැටපද' යේ අර්ථ මෙසේ යි:-

"දෙදත වසා ප්‍රාවරණය වන බැවින් 'චීවර ගබ්භයෙහි-ගබ්භාකාර චීවරය මත සණ්ඨාපිත-පටිසාමිත-තැන්පත් වුණු ශ්‍රී හස්ත ය එයින්-ඒ තුබුණු තැනින් තහා ගෙන, පහරුය යි කී පරිදි යි" යනු යි.

මෙහි **'සැඟවුණු'** යනු **'පටිසාමිත'** යන අර්ථ යි. **'සණ්ඨපිත-පටිසාමිත'** යන අර්ථ දෙන්නට මේ ගැටපදයෙහි යථොක්ත වචනය බෙහෙවින් එයි. **'පටිසාමෙතබ්බා'ති, සණ්ඨාපෙතබ්බා'** යනු විනය අටුවා යි. **'සැඟවුණු'** යනු 'සණ්ඨාපිත' ශබ්දයා ගේ **සිංහල** වචන යි.

ගමන යැ, හිඳුම යැ, සිටුම යැ, ශයන යැ යි ඉරියව් සතරෙකි. මේ සතර ඉරියව් හි මැ 'සිවුරු ගැබ' ඇත. අත් තැඹුම් ද කළ හැකි යැ. එසේ වුව ද, 'සිවුරු ගැබින් අත් තගා ලීම' නම් පලක් බැඳ හිඳ ගත් කල මිස, අන් ඉරියව් වල නො කළ හැකි යි. සිවුර මත දකුණත් තබා ලීම හිඳ ගත් කළ මුත්, අන් ඉරියව් වල නැති හෙයි නි.

“හත්ථං පසාරෙත්වා” යි ‘අත් පහරා’යි කිව, පමණි. ‘චීවර ගබ්භතො’ යි ‘සිවුරු ගැබින්’ යි වෙනසක් කියන්නට හෙතුව නම්, ‘චීවරභොග’ ය තුළ-(සිවුර ඇතුළේ) අත තුබුණු බව පව සන්නට යැ. දෙවුර වැසූ කල මුත්, එකාංස කළ කල මේ නො ලැබේ” යනු ලිඞ්ගපරිවර්තනය කළ වුන් ගේ තර්කණ යි.

‘අත් පහරා’ යි කිව පමණි. ‘සිවුරු ගැබින්’ යි වෙනසක් කියන්නට හෙතුව, පලක් බැඳ හිඳ ගත් බුදුන්ගේ සිවුර මත අත තුබුණු බව යි. මේ මෙහි සත්‍යය යි.

‘අත් නගා’ යන්නට ‘සිවුරුගැබින්’ යි වෙනසක් යෙදූ යේ සිවුර ඇතුළේ අත තුබුණු හෙයිනි, යනු සැබෑ නම්, සිට ගෙන නගන අත ත් සිවුරු ගැබිනැ යි කිය යුතු යි. උභයාංසවාදීන් මතයේ සැටියෙන් “සිවුරු ගැබින් පාත්‍රය එළියට ගත් හ” යි එන තැනු දු, තිබිය යුතු යි. එබඳු තැන් නැති.

සිට ගෙන අත් නගා ලූ තැන් නම්, අඞ්ගුලිමාල දමනා, නාලාගිරි දමනාදිය යි. ඒ තන්හි අටුවා වල ‘සිවුරගැබින්’ යන වෙනස කියන වචනය නැති. මේ දමනා ‘අමා වතුරු ධර්ම ප්‍රබන්ධ’ යෙහි දු එයි. පෙළ ආ සැටිය මැ මිස අන් සැටියක් සිංහලයට නො නගන ‘ගුරුළුගෝමි’න් ගේ ඒ වාක්‍ය ත් බැලිය යුතු.

හිඳ ගත් කළ නගන අත ‘සිවුරුගැබිනැ’ යි වෙනස් කාර කියනට ත්, සිට ගැනුම් ආදී අන් ඉරියව් වල දී නගන අත ගැන එසේ නො කියනට ත්, හෙතුව කිම?

මෙහි කාරණය නම්, බුදුන් එකාංස කොට ඇඟ වසන බව යි. අප ලක්දිව විහාර වල එකාංස කොට ඇඟ වසා පලක් බැඳ ගෙන සිවුර මත ශ්‍රී හස්ත තබා ගත් අයුරු දක්වන බුඞ ප්‍රතිමා ඇත. ඒ පිළිම හිමි දකුණත් නගන්නේ නම් ‘සිවුරු ගැබින්’ නගන්නේ යැ, ගර්භාකාර චීවරය මත අත තුබුණු බැවිනි. ඒ එකාංස කළ පිළිම හිමි මැ සිට ගනිමින් හෝ, යාම් ඊම් කරමින් අත් නගන්නේ නම්, ‘සිවුරු ගැබින්’ නැඟීමෙක් නැත. එවිට දකුණත සෘජුව එල්බ ගත් බව මුත්, කිසි තැනක නො තැබූ බැවින.

මෙසේ ‘සිවුරු ගැබින් අත් නගා ලීම’ ඊර්යාපථ හෙද යෙන් පරීක්ෂා කාර ලීම, පූර්වෝක්ත ගැටපදසත්‍යය තේරුම් ගන්න ට ත්, දෙ වුර වැසුම තිම්ලශාසනයේ පැවති ‘ලිඞ්ග’ය නො වන බව තේරුම් ගන්නට ත්, නුවණැතියන් හට නම්, අහෙදූවා රයෙකි.

‘සිවුරුගැබින්’ අත් නැඟුම් එන බොධිමූලාදිය ගැන කිය යුතු නො වේ. බොධිපර්‍යඞ්ක යැ, අනිමිෂලොචන යැ, චඞ්ක්‍රමණ යැ, රතනගෘහ යැ, යන සති සතර වනෂණ්ඩයෙහි වූ බොධිසමීපයෙහි ගත කළ බව සැබැ ව. “ඒ අරණ්‍යයෙහි හුදෙකලා වැ එකි සති සතර මැ ගත කර ලමින් දෙවුර වසන්නට කරුණු නැත” යනු උභයාංසවාදීන් ස්වමතස්ථාපනයට ගත් ව්‍යාවස්ථායෙන් ඔවුනට මැ සිද්ධ සි. ඒ වන ළැහැබ අනන්තරසරය වත්, අනන්තරසරයට යන මඟ වත්, ජනසන්නිපාතස්ථානය වත්, නො වන හෙයින් බොධිමූලයෙහි දෙවුර වසන්නට කරුණු නැත’ යනු උභයාංසවාදීන් විසින් මැ කිය යුතු. සත් දිනක් මැ නො නැගිට එකාංස කොට පෙරෙව භාවනානුයොගී වැ බද්ධපර්‍යඞ්කයෙන් හිඳ මාරයා පැමිණි වේලේ ‘සිවුරුගැබින්’ අත් නඟා පොළොවට පෑ බව එයි. මෙ තන්හි ‘සිවුරු ගැබින්’ අත ගත්තේ එකාංස කොට පෙර වැ ගෙන මැ ය සි ප්‍රකට ව පෙනේ.

ගමනාගමනාදි ඊර්‍යාපථ වල ත් නඟා ලූ අත ගැන ‘සිවුරු ගැබිනැ’ සි වෙනස වදාළ වචනයක් ‘අටුවා’යෙන් දක්වා ලිය හේ නම්, එකාන්තයෙන් මැ ඒ යෙදුමින් දෙවුර වසා ලූ බව මැ ප්‍රකාශ වන්නේ යැ. එසේ වුව ද, ‘විනය අටුවා’යෙහි එකාංස කොට මැ ගැටවවූ ගන්වා ලිය යුතුය සි කෙළින් මැ වදාළෙන් එබඳු යෙදුමක් ‘දකුණු බුද්ධාගම’ නමින් ප්‍රකට ‘මහා විහාර වංශ’ යට අයත් ‘අටුවා වචන’ යෙකින් නම් නො දක්වා ලිය හේ මැ සි.

තවද, කිය යුත්තෙකි. **‘චීවරගබ්භන්තරතො’** කියා ත් පාඨ සි. මේ **‘ර’** යන්න මෑත කාලයෙහි ලියා ගත් එකෙකි. **‘චීවරබ්භන්තරතො’** සි **‘අබ්භන්තර’** ශබ්දය ‘සුඩවජ්ජාද විභාවිනි’ යෙහි ලියා ගත්තා මෙනි. **‘චීවරගබ්භතො’** යනු ත් **‘චීවරගබ්භන්තතො’** යනු ත් සුපාඨ සි. මෙ තන්හි **‘අන්තර’** ශබ්දයේ අර්ථයෙක් නැත. ‘අමා වතුර’ ආදි සිංහල ධර්ම ප්‍රබන්ධ වල ද මෙ තන්හි **‘අන්තර’** ශබ්දය ඇති බව අඟවන විශෙෂාර්ථයෙක් ආයේ ද නො වෙසි. ස්වාර්ථයෙ හි **‘අන්ත’** ප්‍රත්‍යය යෙක් එයි. “**සුපිනො එව සුපිනන්තො**” යනු ‘විනය අටුවා’ සි. ‘**ගාමන්ත-වනන්ත-කම්මන්ත-සුත්තන්ත**’ ආදිය ද සිතිය යුතු සි.

මෙසේ හෙයින් ස්වාර්ථයෙහි “**අන්ත**” ප්‍රත්‍යය මෙ තන්හි සිතිය යුතු සි. “**පංසුකූලන්ත** ’ යනාදිය ත් මෙලෙස මැ කල්පනා කළ යුතු සි. සිංහලයෙහි “**සරනක-බුවනක**” ආදි තන්හි එන ස්වාර්ථයෙ හි “**අත්**” යනු ද, මෙයින් නිපන් සි සිතේ. මේ ඉතා මෑත අපට වැටහී ගිය කරුණෙකි. ‘විනය අටුවා’ හි වදාළ මඟට

වෙනස් ක්‍රමයක් ඇතැම් ශාබ්දිකයෝ කියත්. "**කාම කර්ණාන්ත භූමිජු**" යන තන්හි 'වාග්භට ටීකා'වත්, "**ජම්බූවනාන්තනාඃ**" යන තන්හි මල්ලිනාථයන් ගේ "මෙඝටීකා" වත් අර්ථීන් විසින් බැලිය යුතු යි.

17. "**හත්ථානඤ්ච පාදානඤ්ච සරස්ස ච නිමිත්තං අග්ගහෙසි**" යනු 'සුදින්න' තෙරුන් ගේ කථායෙහි එයි. මේ පෙළ යි. "හස්තයන් ගේ ද, පාදයන් ගේ ද, ස්වරයා ගේ ද, නිමිති ගතු" යනු අර්ථ යි.

මේ පෙළින් 'සුදින්න' තෙරුන් ඒකාංස කොට සිටි බව වත් දෙ වුර වසා සිටි බව වත්, ප්‍රකාශ වන්නේ නැත.

මෙ තන්හි දෙවුර වසා සිටි බව ප්‍රකාශ කළහොත්, මැනැවැ යි 'හස්තයන් ගේ' යන්නට "**මණිබන්ධතො පභුති**" යි "මිණිබන්ධන පටන්" යි 'අටුවා' හි දී එකතු කළහ යි ද, ඒ එකතු කිරීමේ ප්‍රයොජනය ත්, දෙ වුර වසා සිටි බව ප්‍රකාශ කිරීම මුත්, අනෙකෙක් නො වේ ය යි ද, ලිඛිතපරිවර්තනය කළ වුන් කල්පනා කරන සැටි ය යි හැඟේ.

'හස්තයන් ගේ' යන්නට 'මිණිබන්ධන පටන්' යි එකතු කෙළේ දෙ වුර වසා සිටි බව ප්‍රකාශ කරන්නට නො වේ. හස්ත ලක්ෂණ දක්වන්නට යි. ඒ එසේ මැ යි.

'හස්තයන් ගේ ලකුණු' යි කී කල විමතියෙක් වෙයි, බාහු මූලය දක්වා හස්තයන් ගේ දෝ! නොහොත් හස්ත ප්‍රදෙශයක්හු ගේ දෝ! යන විමති ය යි. සුපිළිසන් වන සැටි වදාළ ලෙසින් ඒකාංස කොට ඇඟ වසා ගියහු ගේ දකුණත උරහිස දක්වා ත්, දැක්ක හැකි යැ. මෙ තන්හි '**හස්ත-පාද**' ශබ්ද සම්පූර්ණ හස්තපාදයන්හි නො වැටෙන බව ත්, අතුල් පතුල් වල වැටෙන බව ත්, එයින් මැ මෙ තන්හි 'හස්ත' ශබ්දයෙන් ගත යුත්තේ මිණිබන්ධනින් යට 'පාණිප්‍රදෙශ,ය බව ත් දක්වන්නට අටුවා කළහ. 'හස්ත ලක්ෂණ' දක්වන්නට වදාළ වචනය දෙවුර වසා සිටි බව අඟවන වචනයෙකැ යි සිතීම මිරිඟු දැක ජලය යි සිතීම වැනි යැ.

18. මැදුම් සඟියට සන්නයක් කළ **පණ්ඩිත කේ. ශ්‍රී ධර්මානන්ද** ස්ථවිරයන් වහන්සේ සවිය සන්නයෙහි මතු දක්වන විවරණය ලියූහ;—

"බුද්ධා නාම ගණ්ඨිකං පටිමුඤ්චිත්වා පටිච්ඡන්නසරීරා පරිසතිං ධම්මං දෙසෙන්ති, අථ භගවා ගලවාටකසම්මුඛට්ඨානෙ චීවරං ගහෙත්වා චතුරඞ්ගුලමත්තං ඔතාරෙසි"

‘බුදුවරයෝ වනාහි ගණ්ඨි ඇමුණු සිවුරෙන් වැසූ ශරීර ඇතුව පිරිසෙහි දහම් දෙසති. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ගෙළුවළු ඉදිරියෙහි තැන සිවුර අල්වා සතරඟුලක් පමණ පහතට හෙළුයේය’ යනු මෙහි අදහසයි.

ශරීරය මනාව වසාගෙණ පිරිසෙහි දම් දෙසීම සම්බුද්ධ චාරිත්‍රය බව අවිලඞ්ඝනීය මේ දෙසනා පාඨයෙන් ඊෂත්මාවෙන් අන්ධ නොවූ කාට නම් නො වැටහේ ද?

මෙහි මනාව වැසීම නම්, සමන්ත පාසාදිකා විනය මහ අටුවා යෙහි මෙසේ දක්වන ලදී.

“සුපටිච්ඡන්නො’ති, නසීසං පාරුතෙන, අථඛො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභො කණ්ණෙ සමං කත්වා පටිසංහරිත්වා යාවමණිබන්ධං පටිච්ඡාදෙත්වා” යන පාඨයෙන් ද, “ගලවාටකතො පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩික මංසතො ච පට්ඨාය පාදෙ විවරිත්වා” යන පාඨයෙන් ද, උඩින් හිස ද, යටින් කෙණ්ඩා මසින් යට පා ද, දෑතින් මැණික් කට්ටුවෙන් පිටත අත් ද, පෙණෙන සේ ඉතිරි ශරීරය වසා සිවුරු හකුලා ගණ්ඨි අමුණා පෙරවීම සම්බුදුයන් වහන්සේ ට පුරුදු වූ යහපත් සිවුරු පොරොවන ක්‍රමය බැව් මින් ප්‍රශ්න රහි තව පෙණේ”

මේ පූර්වෝක්ත සන්නයෙහි එන විවරණය යි. මෙහි දක්වන ලද අටුවා පාඨ එකී පොත්වල එන බව සැබැව. එසේ වුව ද, ‘සුපටිච්ඡන්නොැති’ යනු ‘සුපටිච්ඡන්නෙනා’ති’ යි ඒ පාඨයේ එන ශුද්ධ යෙදුම යි

‘චූළසච්චකසූත්‍ර’අටුවායෙන් ගත් පාඨයෙහි “පටිච්ඡන්න සරීරා” යන්නට “සුපටිච්ඡන්න ශික්ෂායෙහි වදාළ සැටියෙන් පිළි සන් සිරුර ඇතුව”යි අර්ථ කල්පනා කළ යුතු යි.

විනය අටුවායෙන් ගත් පාඨ දෙක මැ එකාර්ථ කොට කල්පනා කළා වරද යැ. එහි ඇඟ වසන සැටි දැක්වුණු පාඨය නම්, මුල් පාඨය යි. එහි අර්ථ ත්, දෙවන පාඨයේ අර්ථ ත්, මේ ග්‍රන්ථයෙන් උන්වහන්සේට ත් වැටහිය යුතු යි.

“එක් අංශයක් වැසීමෙන් නම්, සිවුර පාත්කොට නොදැක් වූවත්, සච්චකට සිරුරෙහි ඩහ ඇති නැති බව පෙනෙයි. සිවුරෙන් ඇඟ වැසී තිබුණු හෙයින් මැ නිසැක වීමට සිවුර පාත් කොට පෙන්වන්ට උවමනාවිය”

මේ උන්වහන්සේ ගේ විවරණයේ අවසානය යි.

ඝන ඇති නැති බව නම්, සිවුර මඳකු දු, පාත් නො කළ ද, නලල-කම්මුල් ආදියෙන් දත හැකි යැ. මෙසේ හෙයින් නඟා ගත් අදහස අසත්‍ය බව පෙනේ. එසේ නම්, සිවුර පාත් කර ලීම කුමට යැ යත්!

''ඔබ ගේ නලල-කම්මුල්-අතුල්-පතුල්-දකුණු උරහිස් ආදියේ ඝන නැති බව අපට පෙනේ. ඇතුළේ ඇති දෝ! නැති දෝ'' යනු මහ ජනයාට උපන් සැකය යි. ඒ සැකය වළහන්නට ගල වළහමුයෙහි ගැටය මුදා සිවුර සතරඟුලක් පමණ පාත් කළහ. 'අඤ්ඤෙන සෙදස්ස අත්ථිතා වා නත්ථිතා වා කථං සක්කා ඤාතුං''යි, අටුවාහි සැක ඇති කළ සැටි වදාළහ.

''ඊර්ෂ්‍යාවෙන් අන්ධ නො වූ කාට නම්, නො වැටහේ ද!''යි පරහට නිඳුපුම් උපාරම්භ නඟාලන මේ ස්ථවිරයන් වහන්සේ ත් දෙවන සච්චකසූත්‍රයෙහි දී අන්ධ වූහ:-

''භගවා එවරූපෙ සමයෙ රත්තදුපට්ටං නිවාසෙත්වා, කාය බන්ධනං බන්ධිත්වා, පංසුකූලචීවරං එකංසං පාරුපිත්වා, ගන්ධකුටිතො නික්ඛම්ම භික්ඛු සඞ්ඝ පරිවුතො ගන්ධකුටිපමුඛෙ අට්ඨාසි, තං සන්ධාය ''එකං සමයං'ති ච, තෙන ඛො පන සමයෙනා'ති ච, 'පුබ්බණ්හසමයං'ති ච, වුත්තං'' යනු 'සච්චක සූත්‍ර' අටුවා යි.

''පිඬු පිණිස පිවිසීම සඳහා මනාව හැඳ කොතැන්හි හැසිරෙම් දැ යි සලකමින් ගඳකිළිය පෙරටූයෙහි වැඩ සිටි කාලය සඳහා එකංසමයං තෙන ඛොපන සමයෙන පුබ්බණ්හ-සමයං යන පද ත්‍රය කියන ලදී'' යනු අටුවා පාඨයේ භාවය දුන් සැටි ය.

මේ අටුවා පාඨයෙහි එන ''පිඬු පිණිස පිවිසීම සඳහා මනාව හැඳගත් බව'' පෙනිණ-ඊ ළඟ ''පංසුකූල චීවරං එකංසං පාරුපිත්වා''යි වදාළ වචනය නො පෙනිණ. මෙයින් පණ්ඩිත ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ ගේ අන්ධ නො වූ ඇස්වල සැටි සියල්ලන් හට මැ පෙනේ.

මේ සච්චකකථායෙහි දු බුදුන් වහන්සේ 'සුපටිච්ඡන්න' ශික්ෂායෙහි වදාළ ලෙසින් ඇඟ වසා හුන්හ.

19. මේ ග්‍රන්ථයෙහි බුඬවචනය ත්, අට්ඨකථාව ත් ප්‍රමාණ පාඨ කොට තුන් සිවුරේ දිග පළල එක තරම් බව දක්වන ලදී. 18-19-20-21-22-23-24-25-26 පිටු බැලිය යුතු සි. පරිමණ්ඩලනිවසනය ත්, පරිමණ්ඩලප්‍රාවරණය ත්, යන මෙයට වුවමනා වස්ත්‍රප්‍රමාණය තුන් සිවුරේ ප්‍රමාණ සි. එය තමන් තමන් ගේ කායප්‍රමාණයෙන් මිනිය යුතු සි. මේ කාරණය මේ පෙළ අටුවා ඇති තාක් නික්ෂෙප කළ හැකි නො වේ. මෙ හෙයින් මැ මේ දෙවුර වසා ලීම 'ස්ථවිරීය' වංශයේ පැවැත ආ ආකල්පය නො වන බව ප්‍රකට ව මැ පෙනේ මැ සි.

මේ උද්ඝොෂණය මතු වීමෙන් පසු '**කඞ්ඛා විතරණී පිට පොත**' මුද්‍රණයෙන් ප්‍රකාශයට පමුණුවන ලදී. මෙහි ශොධක යෝ නම්, **කළුකොඳයාවේ පඤ්ඤාසෙඛර** ස්ථවිරයන් වහන්සේ යැ. 'පිටපොතේ' එන '**තාසස-තිචීවරස්ස**' යන විවරණය '**තාසා'ති, චීවරස්ස**' යි වෙනස් කර ලූහ. මේ ග්‍රන්ථයෙහි 25 වන පිට බැලිය යුතු සි. "තුන් සිවුරු එක තරම් බව දක්වන විනයප්‍රදෙශ ක්‍රම ක්‍රමයෙන් නැතිකර දැමූව හොත් මැනව" යන කල්පනාව යට කී මකා දැමීමට හෙතු සේ පෙනේ. උන්වහන්සේ ගේ ශුද්ධියට වහල් කොට ගත් අත්පොතක් බැලුම්හ. **පණ්ඩිත කඹුකුරුන්දේ දෙවානන්ද** ස්ථවිරයන් වහන්සේ ඔබට සපයා දුන් පොත සි. එහි '**තාසස**' යන වචනය ලියා අඟලක් පමණ ඈත් කොට '**තිචීවරස්ස**' යි ලියා තිබේ. මෙසේ හෙයින් උන්වහන්සේ කළ ක්‍රියාව අනාථියෙන් මැ නිශ්චිත සි. වැරදීමෙකින් හෝ නො දන්නාමෙකින් කළ වෙන සෙක් නම්, අප මෙය මතු කර ලීම, උන්වහන්සේට ත් සතුට පිණිස වෙයි.

20. "තුන් සිවුරු එක තරම් බව සැබැව" යනු පිළිගත් විට හෝ "විනයයෙහි නියම කොට වදාළ මිටිතුන්රියන් තුන් සිවුර හඳිනා පොරෝනා සැටියෙන් කවර සිවුරක් වුව ද, හැන්ද යුතු යැ, පෙරෙවිය යුතුය"සි පිළිගත් විට, ඇතැම් වාදීන් මෙසේ සිත නවා ඇත. "අප දෙ වුර වසන සැටි වැරදි සි, හරි ක්‍රමය නම්, 'චීන ජපන්-ඉන්දියා' ආදි දෙශ වල ඇතැම් ගල් රූප වල එන සැටි සි. එක් අතක් හෝ, දැන මැ පොරෝනයේ යට සරස නුවාව යටින් එළියට ඇද ගෙන යාම යැ, නැත් නම්, '**මහාත්මා ගාන්ධි**' ආදීන් පොරෝනා සැටි සරි ය" සි සිතන්නට පුළුවන. එබඳු රූප එන බව සැබැව. ඒ 'මහායානසම්ප්‍රදාය' සි. 'මහාවිහාරපරම්පරා'යෙහි ආ සැටි දක්වන්නට 'සුපටිච්ඡන්න' ශික්ෂා

වත්, එයට වදාළ විනයඅටුවාපාඨය ත්, එහි විවරණය වන, 'විනය විනිශ්චය' ත් මේ ග්‍රන්ථයේ 12 වන පිට තෙක් විස්තර කර දක්වා ඇත.

21. අප ඇති කළ උද්ඝොෂණය විනයධර්මය ප්‍රමාණත්ව යෙන් ගන්නා විනයවාදී බුද්ධ පුත්‍රයන් හට අර්ථ පිණිස පවතු දු, ඇතැමුන් ගේ බලවත් අමර්ෂයට කරුණු වුණු බව රහසෙක් නො වේ. සමහරු විදෙශවල ඇවිද අවුත්, ශාසන සමය නො දන්නා බෞද්ධයන් මුළා කරන අටියෙන් ඒ රටවල මෙ කල භික්ෂූන් අඳිනා පොරෝනා සැටි කියා පාන්නට වන්හ. ඒ රට වල වුණු විපර්‍යාස ත්, ශාසනයේ පැවත ආ සැටි ත්, පෙළ-අටුවා හි එන සැටි ත්, පහදා දී තිබියදී, **"නන් දොඩා ලීම"** උදාර අදහස් නැති පුරුෂයන් ගේ ලක්ෂණ යි. මහත් හඬ නගතු දු, ඇතුළ හිස් වැ ගිය බෙර මෙන්, මහත් ශාසන සඞ්ග්‍රහ කියා පාතු දු, ඇතුළේ සාධු ගුණ නැතියෝ කුමට රට තොට ගැන කථා කෙරෙද් ද? මෙ කල අප රට ශාසනයේ වන විපර්‍යාස ග්‍රන්ථා-රූඪ නො වුව හොත්, එන දවස ත්, පත පොත හැර පියා රට තොට මැ "විනය" කොට ගන්නන් ඇති විය හැකි යැ.

**හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල** නායක ස්වාමීන්ද්‍රයන් නිසා බොහෝ දෙනකුන් අන්‍ය ආකල්පයක් වැළඳ ගත් බව ප්‍රසිද්ධ යි. මෙය ඉතිහාසගත විය යුතු යි. එන දවස ඇති වන්නන් ගේ ප්‍රයොජනය පිණිස යි.

**පණ්ඩිත යගිරල පඤ්ඤානන්ද** නායක ස්ථවිරයන් වහන්සේ ගේ 'මහාවංස' යෙහි මෙය ඇතුළු ත් නො වී යැ. ස්වකීය ධර්මාචාර්‍යයන් වහන්සේ මහත් වෙහෙස විඳ කළ යථොක්ත විපර්‍යාසය බලවත් ශාසන සඞ්ග්‍රහයෙක් නම්, ඒ බව සඳහන් නො කිරීම ඌනත්වයෙකි. එක් අතෙකින් ගුරුද්‍රොහි කමක් මෙන් ද පෙනේ. බලවත් ශාසනවිලොපයෙක් නම්, ඒ බව හෝ සඳහන් කළ යුත්තෙකි. ලක්දිව දෙ වුර වසා 'බුද්ධප්‍රතිමා' කරනට පටන් ගත් කාලය ද, එයට හෙතු ද, යථොක්ත ග්‍රන්ථයෙහි ඇතුළත් විය යුතු නැති. මේ ශාසන විලොප මෑත කාලයෙහි පටන් ගත් බැවිනි. මේ ආදී කරුණු ඉතිහාස පොත් වලට නො ගැනීම අනාගත පරපුර මහත් අඳුරෙක වැටී යන්නට අවකාශ තබා ලී මෙකි

22. මෙයින් වර්ෂ කිහිපයකට පෙර අප විසින් 'පාරුපනපාළි' නම් ග්‍රන්ථය ලියන ලදී. අප පිරිවෙන්හි ප්‍රධාන කැප කරු **ඇම්. වයි. හෙමචන්ද්‍ර** මහතාණන් ගේ ප්‍රසාදයෙන් ඒ මුද්‍රිත වි යැ. ඒ දිනවල ලක්දිව ඒ ඒ තෙරවරුන් අතර මහත් නො සන්සුන් බවෙක් පහළ වි යැ.

"ඇතැම් පණ්ඩිතයෝ 'පාරුපනපාළි' යට විරුද්ධ ව පොතක් ලියම්හ" යි තන්හි තන්හි ප්‍රකාශයක් කළහ. ඇතැම්හු රැස් වීම් ද, පැවැත් වූහ. රහස් රැස්වීම් ද බොහෝ වි යැ. ඇතැම් කෙනෙක් බුරුම රට විනයධරයන් කරා ත් පොත යැවූහ. එතරම් කැළඹීම් ඇති වුව ද, බඩජීහව වුණු බව පෙනේ.

**"අප බුදුන් ගේ තුන් සිවුරු ඔබ වියතින් උස ස යැ, දිග නව යැ"** යන මෙ කාරුණ ද, **"භික්ෂූන් ගේ තුන් සිවුරට සමාන ශික්ෂා යැ, සමාන අභිසාථා යැ"** යන මෙ කාරුණ ද, **"තමන් තමන් ගේ මිටි රියනින් තුන් මිටිරියන් උස්වූ ත්, පස් මිටිරියන් දිග් වූ ත් තුන් සිවුරක් විනයයෙහි නියමිත යැ"** යන මෙ කාරුණ ද, **"ඒ තුන් සිවුරු අඳනා පෙරෝනා සැටියෙන් සාවර සිවුරක් වුව ත් ඇන්ද යුතු යැ, පෙරවිය යුතු යැ"** යන මෙ කාරුණ ද, **"මෙ තෙකිනු ත් මේ දෙ වුර වඝනා සෑහි නම්, දූග සව් පරපුරින් ලත් අල්ප වූ ත් උපදේශයක් නැති ආකල්පයෙක"** යන මෙ කාරුණ ද, **"විනය අටුවාහි දු, විනය විනිශ්චයයෙහි දු, ගම් වදනා කල එකාංසයක් හා එක් මිණ්ඩහනක් වැසි යන සැටියෙන් මැ නුවායෙන් බෙල්ල වසා ගෙන යා යුතු බව මැ වදාළේ යැ"** යන මෙ කාරුණ ද, මේ "විභජ්‍යවාදශාසන" යේ නම්, ප්‍රතික්ෂේප නො කළ හැකි යැ. වැලි එකෙක් කළ හැකි යැ. ශත වර්ෂ කිහිපයක් යතන ධරා ත්, ලොකයේ කිසිවකු විසිනු දු මෙ කාරුණු හෙළි නො කළ බව යි. මෙ ද කිය හැක්කේ නියම පාණ්ඩිත්‍යය ඇති සත්‍යවාදී උතුමන් විසිනි. ගුණ හීනයන් විසින් නම්, කිය හැක්කේ "සුලු කාරුණෙකි" යන මෙපො කි. තමන් කෙරෙහි පිහිටිය යුතු "ලිඞ්ගශුද්ධි" ය ගැන එබඳු වචන කියන පින්වතුන් ඉදිරියේ **"ඉධෙ'ව තෙ උපජ්ජන්ති මොඝ පුරිසා යෙ ඉමං සද්ධම්මං අන්තරධාපෙන්ති"** යනාදිය ප්‍රකාශ කර ලීම මුත්, අන් කිය යුතු වචනයෙක් නැති.

එ කල "ලක්මිණිපහනේ" වුණු විවාදය ද, සිහි කළ යුත්තෙකි. එහි **"තලපිටියාගම උපතිස්ස"** ස්ථවිරයන් වහන්සේ දක්වා ලූ නිභීය කම ගැන පැසැසිය යුතු වියැ. **මුනිදාස කුමාරණතුඩග** මහතා යථෝක්ත විවාදය පිණිස පත්‍රයේ අවකාශය දීමෙන් ලොකයාට අභියක් මැ කෙළේ යැ.

23. මූලගිරිමහාවිහාරාධිපති ගෞරවාහී **ශ්‍රී සොමානන්ද** නායක ස්වාමීන්ද්‍රයන් ගේ ආරාධනායෙනු දු, ඔබ නිසා ලත් මිල වියදමිනු දු, අප විසින් ලියන ලද "පාරුපනසිබ" නම් ග්‍රන්ථය ද මුද්‍රිත වි යැ. එහි 'පා රු ප න පා ළි යෙ හි' නො එන බොහෝ කරුණු ද, ලිඞ්ගපරිවර්තනයේ ඉතිහාසය ද, අන්තර්ගත සි. "මේ මේ ඇත්තෝ හැදීම පෙරෙවීම ගැන බොහෝ කරුණු දැන සිටිය හ. මසුරු කම නිසා ලෝකයාට නො දී මිය ගියහ" යනු ඇතැම් මහ තෙර වරුන් කියන සැටි අසන්නට ලැබිණ. එසින් ඇපි බොහෝ කරුණු රැස් කර යථොක්ත ග්‍රන්ථයෙහි ඇතුළත් කෙළෙමු. පසුව අපට මෙසේ වැටහිණ. "බොහෝ පාඨ අසුලා ලීම ත්, නානා තර්කණ මතු කර ලීම ත්, හිස් වැඩෙකි. විනය ධර්මයේ ඌනත්වයෙක් නැත. එසින් වදාළ ශික්ෂාව ත්, එහි අටුවා ත්, විනය විනිශ්චය අටුවා ත්, ප්‍රමාණ සි. එහි ආ සැටි මැ බැලිය යුතු" යනු සි. එබැවින් 'පාරුපනපාළි' යේ එළැවුණු ඒ කරුණු ක්‍රමානුකූල වැ යොදමින්, අර්ථය විශද කිරීම පිණිස අන්‍ය කරුණු ද දක්වමින් 'පාරුපනපාළි' යේ 'සඞ්ක්ෂිප්තසාර' ය වශයෙන් මේ කුඩා ග්‍රන්ථය ද, ලියන ලදී. මීරිගම **ඩී. ජ්. ජයකොඩි** නොතාරිස් රාළහාමි මේ ග්‍රන්ථය මුද්‍රණයෙන් ප්‍රකාශ කර ලන්නට භාර ගැනුම අපට මහත් ධෛර්යයෙක් වි යැ. මේ විනය ග්‍රන්ථ'ය ප්‍රකාශයට පමුණුවා ලීමෙන් ඒ මහතාණන් ලත් පින අත්‍යුදාර යැ. මේ කාර්යය ද, ඒ මහතාණන්ට සර්වප්‍රකාරයෙන් ප්‍රීති එළව සි.

24. ශතවර්ෂකිහිපයක් තුළ ලොකයේ සිය-දහස් නුවණැති යන් යතන කල ද, කිසිවකු විසිනු දු, යථාර්ථ වශයෙන් නො දුටු සුපිළිසන්සිබයේ අටුවා පාඨය හා විනයවිනිශ්චය ත් මෙහි ව්‍යාඛ්‍යාත සි. අමරපුර-රාමඤ්ඤ නිකාය වාසි තෙරවරුන් ගේ බුරුම රට අතීත පරපුරෙහි පැවති ආකල්පය 'දෙවුර වැසුම' නො වන බව ඉතිහාසානුසාරයෙන් දර්ශිත සි. මෙසේ හෙසින් ඒ තෙරවරුන් විසින් කළ යුතු ඉතා උදාර ශාසනසඞ්ග්‍රහය නම් විනයඅටුවායෙහි දු, විනය විනිශ්චයයෙ හි දු, සැක නො තබා එහි වදාළ සැටි පරීක්ෂා කර ලීම සි. මේ ග්‍රන්ථය එයට දොර සි. අප නිකායයෙහි උභයාංසවාදීන් විසිනු දු, මේ සිතිය යුතු සි. නාමන් හට අයත් 'ආකල්ප' ය පසෙක තිබිය දී නියමලිඞ්ගයෙන් වියෝ වැ සිට **"නිකාය සංස්කරණය කරම්හ — ශාසන සංග්‍රහ කරම්හ"** සි කරන කියන දැය සිනාවට මැ කරුණු සි. ශාසන සමය නො දන්නා සැදැහැති මිනිසුන් මුළා වුව ත්, ශාසන

සමය දන්නෝ නම්, “නියම ආකාලපය පවා පිළිගන්නට **නො කැමැතිය වුන් සංස්කරණාදිය කරන්නේ කෙසේ ද**”යි නිත්‍යපූර්වක වැ සිතාසෙති. අප ගේ හැඟීමේ සැටියෙන් උභයාංශ වාදය මේ ‘ස්ථවිරීයවංශ’යෙහි පැවැති ‘ලිඞ්ග’ය නො වේ නු යි, ඒ මිථ්‍යාග්‍රාහය හැර නො දමූ කෙනකු ශාසන සඞ්ග්‍රහ කරනට නැඟ සිටීම ලොව මුළා කිරීමෙක් මැ යි.

අපට මෙහි අත්‍යල්ප වූ ත් සැකයෙක් නම් නැත. අප උතුම් “මහා විහාර වංශ”ය මැ නිර්මල ශාසනපරම්පරාව බව ඒකාන්ත කොට පිළිගනුම්හ. ඒ විහාරවංශයට අයත් ‘විනය අටුවා’ව ද ‘විනයවිනිශ්චය’ද, ඒ විහාර වංශයේ පැවැත් ආ ‘ලිඞ්ග’ය පහදා දෙන හෙයින් මෙහි දක්වා ලූ ක්‍රමය අප බුදුන් ගේ ආකාලපය මැ යි. මේ අප ගේ හෘදය මැ නිර්භීය වැ විශාරද වැ දෙස් කියන සත්‍යය යි. ආහාර සහිත වූ කල වම්තෙහි ආධාර නො ලැබැ දකුණතින් ඉසිලිය හැකි පාත්‍රයක් පරිහරණය කරන භික්ෂුවට මෙහි දක්වා ලූ ත්‍රිචීවර ප්‍රමාණය ද, සර්වප්‍රකාරයෙන් මැ යොග්‍ය යි.

මේ කාරුණු මෙ කල මහ තෙරවරු පිළිගනිති යි අපි දූ නො සිතම්හ. එසේ වුව ද, ශාසනයෙන් භාගයක් අවසන් වන්නට ළං වැ සිටි මේ කාලයේ මේ ගැඹුරු ප්‍රශ්නය විනිශ්චය කර තබන්නට මේ යත්නය වියැ. ‘සුපිළිසන් සිඛ’යෙහි වදාළ ඒක අටුවා පාඨය වරදවා ගනිමින් දීර්ඝකාලයක් අඳුරේ ගමන් කළ අප සොහොවුරු ස්ථවිර-නවක-මධ්‍යම හැමදෙනා වහන්සේට මෙසේ එළිය දෙන්නට ලැබීම අප ගේ ජන්මසාඵල්‍යය යි. විත කලෙකින් නැසී යන අප ගේ ආත්මභාවය මෙතෙකින් මැ සඵල කොට සිතම්හ. “අප බුදුන් ගේ පුත්‍රයකු විසින් ඔබ ගේ ශාසනයට කළ යුතු ඉතා උදාර මෙහෙයක් කළම්හ”යි සිහි කරන අපි ඉමහත් ප්‍රීතිප්‍රමෝද්‍යයක් මැ විඳුම්හ.

25. මෙසේ මේ විනය ග්‍රන්ථය සකස් කර ලිමෙන් මහත් පිනක් ලදුම්හ. ඒ කුශලය අප මේ ශාස්තෘශාසනයේ පැවිදි කොට ධර්ම විනයයෙහි හික්මවා ලූ ඇල්ගිරියේ මහින්දපරිවෙණාධිපති පූජ්‍යාචාර්ය **දෙහිගස්පේ ශ්‍රී ගුණානන්දා**භිධාන අප ආචාර්යෝත්තම මහාස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ හට ද, අපට ධර්ම විනය උගන්වා සකලාභිවෘද්ධියෙහි මාර්ගදෙශක වැ සිටි **‘විද්‍යාචන්ද්‍ර’** පිරිවෙන්හි අධ්‍යක්ෂක පරදූව **ශ්‍රී ජිනරතනා**භිධාන අප ආචාර්යෝත්තම ස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ හට ද, අපට ආචාර්ය වැ සිටි විද්‍යාලංකාරපිරිවෙන්හි පූජ්‍යාචාර්ය **පණ්ඩිත මාඇවිට ශ්‍රී ඥානානන්ද** ස්වාමීන්ද්‍රයන් වහන්සේහට ද, පළමු වැ ගුරු ගෞරවයෙන් පිරිනමම්හ.

එක්බිති මේ ව්‍යාපාරයෙහි පළමු වැ මැ මහත් ධන වියදමක් කළ **‘විද්‍යාචන්ද්‍ර’** පිරිවෙන පිහිටුවාලිමෙහි කාර්යකා වැ මේ කල අප ගේ සකල ශාසනික කාර්‍යයන්හි වහල් වැ සිටින අහංගම **ඇම්.වයි. හේමචන්ද්‍ර** මහතා ඇතුළු සැදැහැති අප දායකයන්හට ද, මේ ග්‍රන්ථය ලියන්නට ආරාධනා කළා වූ ද, ප්‍රකාශයට පමුණු

වාලිමම කළා වූ ද, මිරිගම ඩී. ජ්. ජයකොඩි නොතාරිස් රාළහාමි ඇතුළු පින් කැමැති සියලු සැදැහැතියන් හට ද, මේ කුශලය මෑ භවනිස්සරණය පිණිස කරුණු වේ වා සි ද පතම්හ.

කැමැත්තෙක් යම් ඒ දෑයක් කියාවා කවුරුන් කුමක් කිව ද, නිකායාන්තර මතයෙන් අසම්මිශ්‍ර වූ අප උතුම් **'ථෙරවාද'**යේ බුද්ධපුත්‍රයන් විසින් ධැරිය යුතු **'ලිඞ්ග'** ය වදාළ 'විනය අටුවා' පාඨය හා 'විනයවිනිශ්චය' ලෝකයේ නිරාකූලභාවයට ගිය සැටි දක්නට කැමතියන් විසින් **'පාරුපනපාලි'** ය හා එහි මේ **'සඞ්ක්ෂිප්තසාර'**ය බැලිය යුතු යෑ.

ඒ ඒ නිකායවල ස්ථවිර-මධ්‍යම-නවක හැමදෙනා වහන්සේ මෑ අප ගේ විනය ධර්මය ශාස්තෘ කොට දකිමින් ශාසන දියුණුව ත්, සඞ්ඝසාමග්‍රියත් පතමින් හැම දෙනා වහන්සේගේ මෑ අතීත ගුරු පරපුරේ පැවැත ආවාවූ මෙහි එළෑ වූ විනය විනිශ්චය පිළිගනිත් වා සී ද, පතම්හ. එය පසෙක දමා ශාසනය නගා ගන්නට ගන්නා යත්න නියම ඵල ලැබෙන්නේ නො වෙසි.

ශාසනභාරධාරි මහොත්තමයකු විසින් ඉසිලිය යුතු මහත් ශාසනා සඞ්ග්‍රහයක් කරනට අපි ප්‍රමාණ නො වම්හ. එබැවින් අප අතින් දු, යම් යම් වරද විණි නම්, ධර්ම විනයධරයෝ අප දන්වත් වා සි ද, සඳහන් කරම්හ.

මේ ග්‍රන්ථය මුද්‍රණය පිණිස අත් ලිපි සකස් කිරීමේ දී අප ශිෂ්‍ය **ඔමාරේ ඥානසාර** භික්ෂු නම ද, මුද්‍රණාවස්ථායෙහි දී මේ පිරිවෙන්හි ශිෂ්‍යාචාර්ය්‍ය **පාතේගම මඞ්ගල** භික්ෂුනම ද, වහල් වුණු බව ද, මෙහි සඳහන් කරම්හ.

අප ගේ මේ කුඩා විනය ප්‍රකරණය ශාසනාන්තය තෙක් හැම දෙනාට මෑ **'සුපටිච්ඡන්න'** ශික්ෂාව තේරුම් ගැනුමට එලිය දේවා සි ද, අවසාන වශයෙන් පතම්හ.

**“යො'ධ සෙවති දුස්සීලෙ**
**සීලවන්තෙ න සෙවති**
**වත්ථුවීතික්කමෙ දොසං**
**න පස්සති අවිද්දසු”**

**“යෙ නාම කෙචිදි'හ නඃ ප්‍රථයන්ත්‍ය'වඥාං**
**ජානන්ති තෙ කිම'පි, තාන් ප්‍රති නෛ'ෂ යත්නඃ**
**උත්පත්ස්‍යතෙ මම තු කො'පි සමානධර්මා**
**කාලො හ්‍ය'යං නිරවධිර්විපුලා ච පෘථ්වී”**

**කෝදගොඩ ඤාණාලොක භික්ෂු**

ශ්‍රී බුද්ධ පරිනිර්වාණයෙන්
දෙවාදහස් සාරසිය දෙයාසූ
වෙන් මතු හවුරුදු ශුද්ධ නිකිණි
පුර පෑලවිය ලත් බුධ දින
අහංගම විද්‍යාවංශ පිරිවෙන්හිදී යෑ.

# පාරුපන පාළි.

(සඞ්ක්ෂිප්ත සාරය)

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

—— ° ——

**සිද්ධාය සබ්බඤ්ඤු නම'ත්ථු තථාගතාය**
**බොධිං ජයාසනගතාය විසාරදාය**
**මාරාදිදප්පමථනෙ ච කුදිට්ඨිජාල-**
**නිබ්බෙඨනෙ පරමකොවිදතං ගතාය.**

—— ° ——

## 1. ප්‍රමාණපාඨ හා ව්‍යුත්පාදනය.

අප බුදුන් විසින් යම් ධර්මයෙක් විනයයෙක් පෙළ විසිනුදු අර්ථ විසිනුදු වදාරන ලදද, ඒ ධර්මවිනය "මහාකාශ්‍යපස්ථවිරා"දි වූ බුදුන් ගේ පුත්‍රයන් විසින් දක්නා ලදි. ඒ බුද්ධපුත්‍රයන් ගේ පරම්පරායෙන් නො සිඳී පැවැත ආ විනිශ්චය නො පිරිහෙළමින් අටුවා කළහ. එයින් මැ අටුවා වල යම් විනිශ්චයයෙක් වදාරන ලද නම්, ඒ සියලු විනිශ්චය මේ කාරුණාශාසනයෙහි ශික්ෂාවන් කෙරෙහි ගෞරවය ඇති පඬිවරයන් හට අත්‍යර්ථයෙන් මැ ප්‍රමාණ වෙයි. වදාරන ලද මැයි "විනය අටුවා" පටන් ගනිමින්;-

**"බුද්ධෙන ධම්මො විනයො ච වුත්තො**
**යො තස්ස පුත්තෙහි තථෙ'ව ඤාතො**
**සො යෙහි තෙසං මතිම'ච්චජන්තා**
**යස්මා පුරෙ අට්ඨකථා අකංසු**

**තස්මා හි යං අට්ඨකථාසු වුත්තං**
**තං වජ්ජයිත්වාන පමාදලෙඛං**
**සබ්බම්පි සික්ඛාසු සගාරවානං**
**යස්මා පමාණං ඉධ පණ්ඩිතානං"යි**

එබැවින් විනයශික්ෂාවල අර්ථ පරීක්ෂා කරන කල අර්ථකථාව ප්‍රමාණ වෙයි. එක්බිති "විනයවිනිශ්චය" යනාදී ඉපැරැණි වූ ත් සම්භාවනීය වූ ත් විනයප්‍රකරණයෝ ද සර්වප්‍රකාරයෙන් මැ ප්‍රමාණයහ. නිර්විවාදයෙන් පිළිගත් මහාවිනයධරයන් ගේ ප්‍රකරණ වන

බැවිනි. “බුද්ධඝොෂා” චාය්‍ය්‍යයන් වහන්සේ වදාළ පරිද්දෙන් මැ විනයාර්ථකථායෙහි එන විනිශ්චය නම්, ධර්ම්‍ය සංග්‍රහ කළ රහතුන් පන්සියක් දෙනා වහන්සේ විසින් සඞ්ගෘහීත සූත්‍රාදීන් බැස ගත් විනිශ්චයකථාව යි. එයින් විනයාර්ථකථායෙහි වදාළ විනිශ්චය බුද්ධමතය මැ වෙයි. එහි දු දුර්බෝධස්ථාන සුබොධ කළ ව්‍යාඛ්‍යාන යෝ නම්, “**විනයවිනිශ්චය**” ආදී ප්‍රකරණයෝ වෙති. මෙසේ හෙයින් පෙළිනු දු, අර්ථකථායෙනු දු, විනයවිනිශ්චයාදී ප්‍රමාණාභී විනයප්‍රකරණයෙනු දු, යම් විනිශ්චයයෙක් එයි නම්, සමග මහා සඞ්ඝයා වහන්සේ විසින් මැ අත්‍යන්තගෞරවයෙන් පිළිගත යුතු යි.

## ව්‍යුත්පාදනය.

---

“උරහිස ත් ළය ත් විවෘත කර ලීම ගෙන සුපිළිසන් සිඛය වදාළ හෙයිනු දු, ගම් වදනා කල එකාංස කොට හෙවත් එකාංසයක් හා එක් මිණි බහතක් මැ වැසී යන සැටියෙන් නුවා කෙළවරින් ගලය වැසිය යුතු කොට ‘සුපිළිසන් වන සැටි’ **විනයමහඅටුවායේ** වදාළ හෙයිනු දු, **විනයවිනිශ්චය** අර්ථකථායෙහි ත් යථොක්තාර්ථය විශද කොට දක්වා ලූ හෙයිනු දු, ‘**මණිබන්ධතො පට්ඨාය හත්ථෙ**’යි වදාළ වචනයෙහි අර්ථ නම් ‘මිණිබහත පටන් දෑත (විවෘතකොට), යනු වෙයි. මෙසේ හෙයින් ඇතුළුගෙහි එකාංස කොට ඇඟ වැසීම් විසින් වර්‍ෂ දෙදහසකට අධික කාලයක් ‘**විභජ්ජවාද**’ ගණයේ පවත්වා ගෙන ආ “**ලිඞ්ගය**” වරද නො වෙයි”යනු මෙහි විනය ධර්ම්‍ය ප්‍රමාණපාඨ කොට ව්‍යුත්පාදනය කරනු ලැබේ.

මේ ව්‍යුත්පාදනයට හෙතු කිම යත්! “එකාංස කොට ඇඟ වැසීම වරද කොට ගෙන සුපිළිසන් සිඛය වදාළ හෙයිනු දු ගම් වද නා කල උභයාංස කොට හෙවත් උරහිස් දෙක ත් මිණිබහන් දෙක ත් වැසී යන සැටියෙන් සුපිළිසන් වන සැටි “**විනය මහ අටුවා**”යේ වදාළ හෙයිනු දු, **විනයවිනිශ්චයඅර්ථකථා**යෙහි ත් “**ජත්තූනි’පි උරම්පි ච**” යනාදියෙනු දු උරහිස් දෙක වැසිය යුතු බව පෙනී යන හෙයිනු දු, “**මණිබන්ධතො පට්ඨාය හත්ථෙ**”යි වදාළ වචනයෙහි අර්ථ නම් “මිණිබහන් දෙක පටන් දෑත (විවෘතකොට)” යනු වෙයි. මෙසේ හෙයින් මේ ‘විභජ්ජවාද’ ගණයේ ඇතුළු ගෙහි එකාංස කොට ගත් “**ලිඞ්ගය**” වරද වෙයි. ආචාර්‍ය්‍යවංශය සාධක කර ලිය යුතු නො වේ”යනු ආචාර්‍ය්‍යපරම්පරායෙහි එකාංස කරලීම ප්‍රතික්ෂෙප කොට ලිඞ්ගපරිවර්තනය කරමින් උභයාංසවාදය පිණිස උභයාංසවාදී තෙරවරුන් සාධක තබා ලූ සැටි යි. ශත වර්‍ෂ

කිහිපයකට පෙර බුරුම රට "සිහසූර" රජු අවධියේ වනදහම් වරදවා ගෙන මේ වාදපථය උපදවමින් "ධම්මචේතිය" රජු ලක්දිව මහාවිහාරපරම්පරාව හා සම්බන්ධ කොට බබුළුවා ලූ සඞ්ඝ සන්තතියේ "ලිඞ්ගය" ප්‍රතික්ෂෙප කාරමින් "සුනන්ද, ජයබාහු" ආදී තෙරවරු ලිඞ්ග පරිවර්තනය කළහ. ඔවුන් වාද ගත් ලක්දිව තෙරවරු ද යථොක්ත සාධක කියත්. පූර්වොක්ත වස්තුපාදනයට ලිඞ්ගාන්තර්ධානයේ මූලාරම්භය වන සඞ්ඝයා ගේ සමගිය භින්න කළ මේ දරුණු ශාසන විලෝපය කාරණ යි.

## 2. ප්‍රාවරණ වාදය.

ඇතුළුගෙට වදනා කල "ශ්‍රමණවේෂය" ගත් භික්ෂුව ගේ සැටි සෘජු වැ මැ වදාළ තැනෙක් විනයධර්මයෙහි අවිද්‍යමාන වෙසි නම්, "මෙසේ මෙසේ හැඟි යන්නේ ය"යි විවාද කළ යුතු යැ. කෙසේ නමු දු නිශ්චයට යා යුතු බැවිනි. එයින් ඒ වාදීන් ගේ විශාරද පාණ්ඩිත්‍යය ද හෙළි වෙසි.

ඇතුළුගෙට වදනා කල "ශ්‍රමණවේෂය" ගත් භික්ෂුව ගේ සැටි සෘජු ව මැ වදාළ තැනෙක් විනයධර්මයෙහි පවත්නේ වෙයි නම්, "මෙසේ මෙසේ හැඟි යන්නේ ය"යි විවාද කළ යුතු මැ නො වේ. විනිශ්චය සෘජුව මැ වදාරා ඇති බැවිනි, සෘජු ව මැ වදාරා තිබියදී ත් විවාද කෙරෙත් නම්, එයින් ඒ වාදීන් ගේ උන්මාර්ගගාමී බව හෙළි වෙයි.

පුරුෂයෙක් මුහුණ වැසී තිබිය දී, අවශෙෂ සකල ශරීරය විවෘත කර ගෙන යෙයි. හඳුනා ගත නො හැක්කේ යැ. එමෙන් මැ සුපිළිසන් නම්, මේ ය යි වදාළ පාඨය වැසී තිබිය දී, අවශෙෂ සියලු කරුණු ගත ද, 'ශ්‍රමණවේෂය' ප්‍රකාශ වූයේ නො වෙයි.

පුරුෂයෙක් අවශෙෂ සකල ශරීරය වැසී තිබිය දී, මුහුණ විවෘත කර ගෙන යෙයි, හඳුනා ගත හැක්කේ යැ. එමෙන් මැ අවශෙෂ සියලු කරුණු වැසී ගිය ද, 'සුපිළිසන් නම් මේ ය'යි වදාළ පාඨය විවෘත වුව, 'ශ්‍රමණ වේෂය' ප්‍රකාශ වූයේ වෙයි.

එයින් සුපිළිසන් සිඛයෙහි අටුවායෙහි දු, තද් විවරණය වන 'විනයවිනිශ්චය'යෙහි දු වාක්‍යජාතිය විවෘත වැ තිබිය යුතු, එයින් වාක්‍යජිතපර්යන්තය අනායාසයෙන් සිද්ධ වන් මැ මහත් වෙහෙස විඵල මැයි.

"අර්කේ චෙන්මධු වින්දෙත
කිමර්ථං පර්වතං ව්‍රජෙත්
ඉෂ්ටස්‍ය ලීලයා සිද්ධෞ
කො විද්වාන් යත්නමාශ්‍රයෙත්"

යනු ලෞකිකයන් ගේ ආභාණක යි.

## 3. ශික්ෂාර්ථපරීක්ෂණයේ රීතිය.

විනයශික්ෂාවල අර්ථ පරීක්ෂා කරන් මැ යායුතු රීතියක් ඇත් ද? කිනම්, ක්‍රමයක් ගෙන ශික්ෂාර්ථ අවබොධ කළ යුතු දැ?යි කැලැ මැ පරීක්ෂණමාර්ගය විමසිය යුතු යි. මතු දක්වන මාර්ගය එහි ලා වදාරන ලදී. මේ මාර්ගයෙන් අර්ථ පරීක්ෂා කරන කල ශික්ෂාපද වල යථාර්ථ ඥානය මුත් මිථ්‍යාඥානයෙක් නම් නො වන්නේ මැයි. එබැවින් මේ දක්වන රීතියෙන් මැ අර්ථ පරීක්ෂා කොට ශික්ෂාවන්හි යථාර්ථය උදුරා ගන්නට යතනා ධැරිය යුතු යි.

**"නිදානං පුග්ගලං වත්ථුං, පඤ්ඤත්තිවිධිමෙ'ව ච**
**ආණත්තාපත්ත'නාපත්ති, විපත්තිං අඞ්ගමෙ'ව ච**
**සමුට්ඨානවිධිං කිරියා, සඤ්ඤාචිත්තෙහි නානත්තං**
**වජ්ජකම්මපභෙදඤ්ච, තිකද්වයවිධිං තථා**
**ලක්ඛණං සත්තදසධා, ඤාතං සාධාරණං ඉදං**
**ඤත්වා යොජෙය්‍ය මෙධාවී, තත්ථ තත්ථ යථාරහං"**

විනයධර්මයෙහි අර්ථ පරීක්ෂා කළ යුතු මාර්ගය "**කඞ්ඛාවිතරණී**" අටුවායෙහි වදාළහ. එබැවින් නිදාන යැ පුද්ගල යැ වස්තු යැ ප්‍රඥප්තිවිධි යැ ආණත්ති යැ ආපත්ති යැ අනාපත්ති යැ විපත්ති යැ අඞ්ග යැ යනාදී විසින් වදාළ සප්තදශප්‍රකාර ලක්ෂණය සුදුසු පරිද්දෙන් යොදා අර්ථාවබොධ කළ යුතු යි. "නිදානය" නම්, ප්‍රඥප්තිස්ථාන යි. යම් යම් කෙනෙකු අරභයා ඒ ඒ ශික්ෂාපද, පණවන ලද ද, ඒ "පුද්ගල"යි. "වස්තු" නම්, ඒ ඒ පුද්ගලයා ගේ අධ්‍යාචාර යි. "ප්‍රඥප්තිවිධි" නම්, ප්‍රඥප්ති අනුප්‍රඥප්ති ඈ දී නව ප්‍රකාර ප්‍රඥප්ති යි. මේ ආදී නයින් යථොක්ත මාර්ගය ප්‍රකාශ වැ සිත තබාගත යුතු යි.

පළමු කොට නිදානය ද, දෙවනු කොට පුද්ගල ද, තෙවනු කොට වස්තුව ද, සතරවනු කොට ප්‍රඥප්තිවිධි දැ යි මේ ක්‍රමයෙන් එකක් එකක් පරීක්ෂා කළ යුතු යි. සොපානමාර්ගයෙක නැඟ යනුවකු සෙයින් එකකු දු නො හැර සුදුසු පරිද්දෙන් ඒ ඒ ලක්ෂණ යොදා සැලැකියයුතු මැ යි.

**"පණ්ඩිතො භික්ඛු තස්මිං තස්මිං සික්ඛාපදෙ ඉදං ලක්ඛණං යථානුරූපං යොජෙය්‍ය"** යනු දු, **"තං පන අයොජිතං දුබ්බිජානං හොති"** යනු දු අටුවායි. පූර්වොක්ත සැටියෙන් ලක්ෂණ යොදා අර්ථ පරීක්ෂා නො කළ හොත්, දුර්විඥෙය වන සැටි අටුවාහි මැ වදාළහ.

විවාදස්ථානයෙක්හි ලා මේ වදාළ මාර්ගයෙහි යෙමින් අර්ථ පරීක්ෂා කරත් කරත්, යම් මතයෙක් ඛණ්ඩනයට යේ නම්, ඒ මිථ්‍යාමතය වේ. මේ රීතිය නො ගෙන පරීක්ෂණය කරත් නම්, ඒ වනාහි විනයානභිඥයන් ගේ ලක්ෂණ යි.

## 4. අත්‍යුපයෝගීස්ථානය.

මේ වදාළ සප්තදශ ලක්ෂණයන් කෙරෙහි "වස්තුව" පරීක්ෂා කර ලීම අත්‍යුපයෝගි වෙයි. අවස්තුයෙහි ශික්ෂාප්‍රඥප්තියක් නම්, අෂ්ටගුරුධර්මප්‍රතිග්‍රහණ විසින් මෙහෙණින් නිසා වදාළ තන මිස නැති. බුදුවරයෝ අවස්තුයෙහි ශික්ෂා නො පණවති. එයින් උත්පන්නවස්තුව පරීක්ෂා කර ලීම ශික්ෂාපදාර්ථඥානයෙහි අත්‍යර්ථයෙන් මැ අර්ථකර යි.

## 5. සුපිළිසන් සිඛයේ වස්තුව.

"**තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති.**" යනාදිය "පච්තිපෙළ" යි. "**එසමයෙහි වනාහි ෂඩ්වර්ගීය භික්ෂූහු කාය විවෘතකොට ගෙන ඇතුළුගෙහි බැස යෙති.**" යනු අර්ථ යි. මේ පෙළෙහි "**කායං විවරිත්වා**" යි වදාරන ලද්දේ සුපිළිසන් සිඛයේ උත්පන්න වස්තුව යි. බුද්ධිමතුන් විසින් මෙහි ලා පරීක්ෂා කළයුතු තැන නම්, "**කායං විවරිත්වා**" යන්නට අටුවායෙහි කුමක් වදාරන ලද ද? යන මෙය නො වේ ද? මෙය මැ යි. "**කායං විවරිත්වා'ති ජත්තුම්පි උරම්පි විවරිත්වා**" යනු එහි විනයඅටුවා යි.

"කායං විවරිත්වා" යන නිදාන පෙළෙහි අර්ථ නම්:- "දසරුව හා ළය හා විවෘත කොට යැ" යනු එහි භාව යි. මෙහි 'ජත්තු' නම් කිම යත්! දසරුව යි- උරහිස යි.

"**ගලප්පමාණෙ ආවාටෙ ඨපෙත්වා ද්වින්නං ජත්තූනමු'පරි පදරානි දත්වා තෙසං උපරි නිසීදිත්වා තාලට්ඨිඛණ්ඩෙන කෙසෙ ලුඤ්චිංසු**" යනු 'ධම්මපියාටුවා'යෙහි 'ජම්බුකාජීවකවස්තු'යෙහි පාඨ යි.

"ගලපමණ වළෙක බහා උභය ජත්‍රුන් මත පුවරු දමා, ඒ පුවරු මත හිඳ ගෙන තල් ඇට කඩෙකින් හිසකේ සිඳලූහ" යනු භාව යි. මෙහි වළ බැස සිටියහුගේ '**උරහිස**' මත පුවරු ලූ බව කියන්නට '**ද්වින්නං ජත්තූනං**' යි වදාළහ. මෙසේ අර්ථකථා

වලෑ 'ජත්තු' ශබ්දයෙන් දසරුව කියත්. එනම්:- අංසකූට යි. 'උර' නම්:-ළය යි. 'කායං විවරිත්වා' යන නිදාන පෙළට වදළ අර්ථය ත් කැඳවා පවිත්තිපෙළ සිංහලයට නඟා ලුව, මෙසේ වෙයි:-

**“එසමයෙහි වනාහි ෂඩ්වර්ගීය භික්ෂූහු උරහිස ද, ළය ද, විවෘත කොට ගෙන ඇතුළු ගෙහි බැස යෙති”.**

උරහිස ද ළය ද විවෘත කොට ගෙන ඇතුළුගෙහි බැස යනු සඳෙස් වෙයි. මේ දෙෂයෙහි-වස්තුයෙහි වදළ ශික්ෂාව කිම යත්!

## 6. සුපිළිසන් සිඛය.

**“සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමී’ති සික්ඛා කරණීයා”**

යථොක්ත අධ්‍යාචාරයෙහි ශික්ෂා යි. **“සුපිළිසන් වූ යෙමි, ඇතුළුගෙහි යනෙමි යි ශික්ෂා කරණීය යෑ”** යනු අර්ථ යි. **‘කායං විවරිත්වා’** යන උත්පත්තිවස්තුයෙහි **“කායං විවරිත්වා’ති, ජත්තුම්පි උරම්පි විවරිත්වා’** යි අර්ථ වදළ හෙයින් ඒ වස්තුයෙහි ලා වදහළ මේ ශික්ෂායෙහි භාවය පෙළ බසින් කියත් හොත්, **“ජත්තුම්පි උරම්පි අවිවරිත්වා අන්තරඝරෙ ‘ගමිස්සාමී’ති සික්ඛා කරණීයා”** යි කිය යුතු.

**“උරහිස ත් ළය ත් වසා ගෙන ඇතුළු ගෙහි යනෙමි යි ශික්ෂා කරණීය යෑ”** යි භාවාර්ථය එයි. මේ උත්පත්තිවස්තුව බලත් මැ නැඟ එන අර්ථ යි. මේ ශික්ෂාප්‍රඥප්තියෙහි **“සුපටිච්ඡන්න”** ශබ්දයෙන් උරහිස ත් ළය ත් වැසී යන ලෙසින් ඇඟ වසා ගත් භික්ෂුව වදාරන ලද ද; නොහොත් උරහිස් දෙක ත් ළය ත් වැසී යන ලෙසින් ඇඟ වසා ගත් භික්ෂුව වදාරන ලද ද; යනු තමන් තමන් විසින් මැ පරීක්ෂා කළ යුතු යි. වස්තුයෙහි ලා වදළ අටුවායෙහි “ජත්තුං උරං” යනු එකවචන වන හෙයින් උරහිස ත් ළය ත් වැසී යන ලෙසින් කාය වසා ගත්තෝ “සුපටිච්ඡන්න” ශබ්දයෙන් වදාරන ලදී ඈනු චතුර්විධ අගතීන් කෙරෙහි නොවැටුණු වුන් විසින් කියයුතු වෙයි. එක්බිති පරීක්ෂා කළයුතු තැනෙක් ඇති “උරහිස ත් ළය ත් වැසී යන පරිද්දෙන් කාය වසන සැටි වදළ අටුවා පාඨයෙක් හා ඇති හො” යනු යි. ඇති.

## 7. සුපිළිසන් සිඛයේ අටුවාව.

''**සුප්පටිච්ඡන්නේනා'ති න සීසං පාරුතේන, අථ ඛෝ ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තේන ගීවං පටිච්ඡාදෙත්වා උභෝ කණ්ණේ සමං කත්වා පටිසංහරිත්වා යාව මණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තරඝරේ ගන්තබ්බං**''

''සුපටිච්ඡන්නේන'' යනු හිස පොරෝනා ලද්දහු විසිනැ යි නො වේ. වැලි ගැටය වටුගන්වා නුවාකොළවරින් ගලය වසා දෙකොළවර සම කොට කැටි කිරීමෙන් මිණිබහත දක්වා වසා ඇතුළු ගෙහි යා යුතු''යනු අර්‍ථ යි. ''**කඞ්ඛාවිතරණී**'' අටුවාහි ද මෙය මැ වදාරන ලදී.

මේ අටුවායෙහි උරහිස ත් ළය ත් වැසී යන පරිද්දෙන් ඇඟ වසනා සැටි දක්වමින් ''නුවා කොළවරින් ගලය වැසිය යුතු බව'' වදාරා තිබිය දී''**උරහිස් දෙක ත් ළය ත් වැසී යන ලෙසින් ගලය වැසීම**'' කවර විනය ධර්‍මයෙක් දැ යි බුද්ධිමතුන් විසින් පරීක්‍ෂා කළ යුතු යි. මේ අටුවායෙහි මැ රැඳී සිට බලත් මැ ''**ගීවා:වෙඨන ඨානෙ**'' යනාදි අටුවා වචන වල උරහිස් දෙක වැසී යන සැටියෙන් ''**ගලය වෙළුම නො වදාරන ලදි**'' යනු දු, ප්‍රකාශ යි.

## 8. සුපිළිසන් සිඛයේ විනයවිනිශ්චය.

දැන් ''**විනයවිනිශ්චය**'' අටුවා ගෙන පරීක්‍ෂා කළ යුතු යි. ''**බුද්ධදත්ත**'' අර්‍ථකථාචාර්‍ය්‍යයන් වහන්සේ පූර්‍වොක්ත අටුවා පාඨයෙහි අර්‍ථය අප කී ලෙසින් දුටු සේක් ද?

**''ගණ්ඨිකං පටිමුඤ්චිත්වා**
**කත්වා කණ්ණේ උභෝ සමං**
**ඡාදෙත්වා මණිබන්ධඤ්ච**
**ගන්තබ්බං ගීවමේ'ව ච''**

''ගැටය වටු ගන්වා ගෙන දෙකොළවර සම කොට ගෙන මිණිබහත ද ගලය ද, වසා ගෙන යායුතු''යනු අර්‍ථ යි. මේ ඇතුළුගෙහි යායුතු සැටි ද! නොහොත් නො යායුතු සැටි ද! යායුතු සැටි යි.

**''නාථා අඤ්ඤත්වා භික්ඛුස්ස**
**ජන්තුනි'පි උරම්පි ච**
**විවරිත්වා යථාකාමං**
**ගච්ඡතෝ හෝති දුක්කටං''**

"එසේ නො කොට උරහිස් දෙක ද, ලය ද දක්වා ගෙන යදෘච්ඡා යෙන්-කැමැති සේ යන භික්ෂුවට දුකුළා වෙයි" යනු අර්ථ යි. මේ ඇතුළුගෙහි යායුතු සැටි ද! නො යායුතු සැටි ද! නො යායුතු සැටි යි. කරුණු නිරවුල් කර ගනුව, මූල්ගය ඇතුළුගෙයි යායුතු අයුරු කී සැටිය යි ද, මේ දෙවන ගය නො යායුතු අයුරු කී සැටිය යි ද, වෙන් වෙන් කොට සිතිය යුතු යි.

ඇතුළු ගෙහි යා යුතු සැටි දක්වමින් **"යාවමණිබන්ධං පඨිච්ඡාදෙන්තා"** යි වදාළ අටුවා වචනය **"විනය විනිශ්චය"** අටුවා යෙහි දු, **"ඡාදෙන්තා මණිබන්ධකෑව"** යි එලෙසින් මැ එකවචන යෙන් තබා ලූහ. **"ජතතුම්පි උරම්පි විවරිත්වා"** යි ඇතුළුගෙහි නො යායුතු සැටි වන අද්ධ්‍යාචාරය **"ජතතූනි'පි උරම්පිච විවරිත්වා"** යි **"විනයවිනිශ්චය"** අටුවාගෙහි බහුවචනයෙන් විවරණ කොට තබා ලූහ. හෙතුව කිම යත්!

උරහිස ත් ලය ත් විවෘත කොට ගෙන ඇතුළුගෙහි නො යා යුතු යි. ඒ බව දක්වන්නට අටුවායෙහි **"ජතතුම්පි උරම්පි විවරිත්වා"** යි අධ්‍යාචාරය වදාළහ. වැසුණු උරහිස ත් ලය ත් විවෘත කරත් මැ උරහිස් දෙක ද, ලය ද විවෘත නු යි, **"විනයවිනිශ්චය"** අටුවායෙහිදී **"ජතතූනි'පි උරම්පි ච විවරිත්වා"** යි අධ්‍යාචාරය බහු වචනයෙන් විශද කොට දක්වා ලූහ. **"ජතතූනිපි'ති උභො අංස කූටානි"** යනු මෙහි ටීකා යි. ඇතුළුගෙට යායුතු සැටි නම්, විවෘත කළ උරහිස ද ලය ද වැසී යන ලෙසින් කාය වසා ගෙන යි. එකල එක් මිනිබඟතක් මැ වැසෙයි, එයින් **"ඡාදෙන්තා මණිබන්ධකෑව"** යි එක වචන මුත් බහු වචන නො කළහ.

**අධ්‍යාචාරය විසින් පෙනෙනුයේ දසරු දෙක ද ලය දූ යි අවයවයෝ තුන් දෙනෙක් පෙනි යෙන් නු යි.**

**සම්පූර්ණ ඌර්ධ්වශරීරය විවෘත කර ගෙන යාම යි. "විනය විනිශ්චය" යෙන් එය අභිව්‍යක්ත කොට දන්නේ යැ. එබැවින් "කායං විවරිත්වා'ති උද්ධකායං විවරිත්වා" යි අටුවායෙහි නො වදාරන්ට හෙතු කිමයත්; "කායං විවරිත්වා'ති උද්ධකායං විව රිත්වා" යි උපන් වරද කිව, සුපිළිසන් සිඛය සම්පූර්ණ ඌර්ධ්ව ශරීරය වැසිය යුතු කොට දෙසූ බඳැ යි සිතේ ඒ විරුද්ධ ග්‍රහණය වළහන්නට "ජතතුම්පි උරම්පි විවරිත්වා" යි ඌර්ධ්ව ශරීරයේ වැසුණු අවයව ගෙන වදාළහයි දත යුතු. ඒ එසේමැ යි. "අවයව කථනය විශෙෂප්‍රතිපත්ති පිණ්ඩ යැ" යනු ආපන**

**සම්මත යි. මේ වනාහි යථාභිඥානය පිණිස අනෘපයෙන් මැ පරීක්ෂා කළ යුතු මාර්ගය වේ.**

තමා ගේ උරහිස් දෙක ත් මිණිබහන් දෙක ත් වැසී යන පරිද්දෙන් නුවාකෙළවරින් බෙල්ල වැසුව මනා නම්, නො යා යුතු සැටි දැක්වුණු ගාථායෙහි **"ජත්තුණි'පි උරම්පි ච විවරිත්වා"** යි බහුවචනයෙන් අධ්‍යාචාරය කියා, යා යුතු සැටි දැක්වුණු ගාථායෙහි "**ඡාදෙත්වා මණිබන්ධකුව**"යි එකවචන නො කියන්නේ යැ. **"එකාංසයක් ද, එක් මිණිබහනක් ද, වැසී යන නියායෙන් නුවාකෙළවරින් බෙල්ල වෙළා ගෙන යායුතු සැටි අටුවායෙහි වදාළහ යි"** නො යායුතු අයුරු නම්, මේ යැ. යායුතු අයුරු නම්, මේ යැ යි වෙන් වෙන් කොට කීහ.

මෙසේ ඇතුළුගෙට වදනා කල එකාංස කොට පෙරෙවැ ගෙන, හෙවත් එකාංසයක් ද, එක්මිණිබහනක් ද, වැසී යන ලෙසින් නුවාකෙළවරින් ගලය වසා ගෙන යායුතුය යි සුපිළිසන් වන සැටි **"විනයමහඅටුවායේ"** වදාළ බව ද, එසේ නො කොට ඒ අංසය ද ළය ද විවෘත කොට යනුවාහට දුකුළා වදාළ බව ද, යථොක්තාර්ථය විපරීත නො වන නියායෙන් මහාවිහාරවාසීන් ගේ විනිශ්චයයෙන් මැ ප්‍රකාශ කොට "**විනයවිනිශ්චය**" අර්ථකථායෙන් යතුරු ලූ බව ද, හස්තාමලකයක් සේ දැක්ක යුතු යි.

පළමු වැ දඟඇටින් අටඟුලක් පමණ හෙළමින් පිරිමඬුලු වන සේ අඳනය ඇඳ ගෙන, පූර්වෝක්ත අටුවායෙහි වදාළ ලෙසින් එකාංස කොට කය වසා ගත්තහු ගේ හිස ද, අත් ද, පා ද, විවෘත යි. හිස විවෘත වැ පවත්නේ ගලවළුයෙහි පටනි. අත් විවෘත වැ යාම මිණිබහන පටනි. පා විවෘත වැ යාම පිඬුමස් දෙක පටනි.

එකාංසයක් වැසී යන ලෙසින් ඇඟ වැසූ කල නුවාකෙළවර වනාහි දෙපස ගලවළු දෙක පැහැර යන හෙයින් **"ගලවළුයෙහි පටන් හිස විවෘත බව"** මතු වදූරසි. මේ "**ගලය පටන්**" ය යි නො වදුරා "**ගලවළුපටනැ**"යි වදුරන්නට හෙතු යි. මේ නයින් නුවණ මෙහෙයා දතයුතු ඉතිරි තැනු දු නිරවුල් කර ගන්නේ යැ. මෙසේ සුපිළිසන් සිඛයේ අටුවාපාඨය ද, "**විනයවිනිශ්චය**"ද නිරවුල් කර ගත නො හැකි වූ යෙන් ශතවර්ෂකිහිපයක් තුළ ලොකයේ මහාවාද පහළවන්නට වියැ. මේ සුපිළිසන් සිඛයේ "අටුවා පාඨය" හා එහි "විනයවිනිශ්චය"ත් හැර ප්‍රමාණත්ව යෙන් ගත මනා "සිද්ධාන්ත"යෙක් ශාස්ත්‍රෘශාසනයේ නැති.

# 9 දෙවන ශික්ෂාව.

3. **“සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමී’ති සික්ඛා කරණීයා.”** 4. **“සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමී’ති සික්ඛා කරණීයා.”** මේ ශික්ෂාපද දෙකෙහි වෙනස පරීක්ෂා කර දන්න. **“ගමිස්සාමි-නිසීදිස්සාමි”** යන ගමනොපවෙශනක්‍රියාමාත්‍රයා ගේ භේදය මුත් සුපිළිසන්හු ගේ වෙනසෙක් මෙහි ඇති ද? නැති. “**ශික්ෂාපදයන්හි ක්‍රියාභෙදය මුත් සුපිළිසන්හු ගේ භෙද නැති හෙයින් උභයාර්ථසාධාරණයන්හි ද; ක්‍රියාභෙදය මුත් සුපිළිසන්හු ගේ භෙදකල්පනයෙක් සම්භව නො වන්නේ යැ**” මේ ද සියල්ලන් විසින් පිළිගත යුතු ඒකාන්ත සත්‍යයෙකි.

දෙවන ශික්ෂායෙහි ද; නිදාන යැ, පුද්ගල යැ, වස්තු යැ යනාදී ක්‍රමය ගෙන අර්ථ පරීක්ෂා කරන්න. එහි ද, “වස්තුව” නම් “**කායං විවරිත්වා**” යනු මැ යි. “**පවිතිපෙළ**” බලන්නේ යැ. එයට වදාළ අටුවා ද “**කායං විවරිත්වා’ති ජත්තුම්පි උරම්පි විවරිත්වා**” යනු මැ යි. එයින් උත්පන්නවස්තුව පිණිස පෙළබසින් අර්ථ කියත් හොත්:—

**“ජත්තුම්පි උරම්පි අවිවරිත්වා අන්තරඝරෙ නිසීදිස්සාමී’ති සික්ඛා කරණීයා”** යි කිය යුතු යි. **“උරහිස ත් ළය ත් වසා ගෙන ඇතුළුගෙහි හිඳින්නෙමි යි ශික්ෂා කරණීය යැ”** යි අර්ථ නැඟෙයි.

**“ගලවාටකතො පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩිකමංසතො ච පට්ඨාය පාදෙ විවරිත්වා නිසීදන්තො”** ඒ ශික්ෂායෙහි විනයඅටුවා යි. “ගලවළයෙහි පටන් හිස ද, මිණිබඳන පටන් අත් දෙක ද, පිඬුමස පටන් දෙපය ද, විවෘත කොට හිඳිය යුතු යැ” යනු අර්ථ යි.

**“ගලවාටකතො පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩිකමංසතො පට්ඨාය පාදෙ විවරිත්වා සෙසං ඡාදෙත්වා නිසින්නො සුප්පටිච්ඡන්නො නාම හොති”** යි.

**“කඞ්ඛාවිතරණී”** අටුවා යැ “ගලවළයෙහි පටන් හිස ද, මිණිබඳන පටන් අත් දෙක ද, පිඬුමස පටන් දෙපය ද, විවෘත කොට ශෙෂය (අධඃකාය වස්ත්‍ර සැටි වදහළ පරිමණ්ඩලනිවසන

ශික්ෂායෙහි ද, උඩුකය වසන සැටි වදාළ "ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යනාදි අටුවාහි ද යි දෙතැන වදාළ පරිද්දෙන්) වසා ගුන්නේ සුපිළිසන් නම්" යනු අර්ථ යි.

පොරෝනා කෙළවර පටන් දෙපය විවෘත වැ යාමෙක් ශාසනයේ නැති. අඳනා කෙළවර පටන් දෙපය විවෘත වෙයි. එයින් මෙහි "**සෙසං ඡාදෙන්තො**" යන්නෙහි යථාර්ථය නම්, පරිමණ්ඩලනිවසනශික්ෂායෙහි වදාළ ලෙසින් අධඃකාය හැඳීමෙන් හා "**ගණ්ඨිකං පටිමුඤ්චිත්වා**" යනාදීන් මූල් ශික්ෂායෙහි වදාළ ලෙසින් උඩුකය වැසීමෙන් ද යි "**සෙස්ස ඇඳීමෙන් හා පෙරෙවීමෙන් වසා**" යනු යි.

විනයානභිඥ වූ පලලවග්‍රාහිපාණ්ඩිත්‍යය ඇති ඇතැම් කෙනෙක් "**මණිබන්ධතො පට්ඨාය හෙට්ඨා**" යන තන්හි "මිණිබඟුන් දෙක පටන් දෑත විවෘත කොට"යි අර්ථ දෙති. ඒ වනාහි බුරුමරට "**සිංහසූර**" රජුන් අවධියේ පටන් පැමැත ආ "**ශ්‍රමණවේෂය**" හැර පියා අන්‍යවේෂයෙකින් බැසූ යන්නට පටන් ගත් භික්ෂූන්, තමන් කළ ලිඞ්ගපරිවර්තිතසඞ්ඛ්‍යාත භයානක ශාසනවිලෝපය තර කර ලන්නට පාළ කළ අහෙතුක ව්‍යාඛ්‍යාන යි.

අඳුරෙහි පහනක් තඹා ලූ කල්හි ඉන් පිටත් ගාජන පෙනෙයි. එමෙන් මැ ඇතුළුගෙට එකාංස කොට උඩුකය පෙරෙවැ යායුතු ය යි සුපිළිසන් වන සැටි වදාළ අටුවාව ද, "**විනයවිනිශ්චයද**"නැඟූ කල, ඇතුළුගෙහි හිඳගත්තහු ගේ නො වැසුණු තන් මසැසට ද නුවණැසට ද පෙනෙයි.

එබැවින් මැ ඒ කියන "**මණිබන්ධතො පට්ඨාය හෙට්ඨා**" යන තන්හි "**මණිබන්ධතො**" යනු ද, එකවචන බව ප්‍රකාශ වැ පෙනෙයි. එයින් "**මිණිබඟක පටන් අත් දෙක විවෘත කොට**" යන වදාළ අර්ථය මැ ගතයුතු යි. "**මිණිබඟුන් දෙක පටන්**"යි නො වදාළෙන් එසේ ගන්නට හෙතු නැති නු යි නො ගත යුතු. ශික්ෂාපද දෙකෙහි වස්තුව පරස්පරවිරුඬ නො වන හෙයිනු දු, ශික්ෂාදෙකෙහි ක්‍රියාමාත්‍රයා ගේ මුත් සුපිළිසන්හු ගේ පරස්පර විරොධ නැති හෙයිනු දු, අර්ථකථාපාඨද්වය කෙරෙහි ද පළමු අටුවායෙහි වදාළ ඌර්ධ්වකායඡාදනයට දෙවන අටුවායෙහි බාධක ඇති දැ? නැති. එයින් එක් මිණිබඟනක් වසාගන්නහුට දෙකක් විවෘත නො කළහැකි නු යි, "මිණිබඟුන් දෙක පටන් දෑත විවෘත

කොට" යන විනයානභිඥයන්ගේ අහෙතුකව්‍යාඛ්‍යානය භ්‍රම මාත්‍ර බව දතයුතු. කියේ මැ නු! "**විනයවිනිශ්චය**"යෙහි 'බුඬ දත්ත' අර්‍ථකථාචාය‍ර්‍යපාදයෝ:—

**"ගලවාටකතො උඬං-සීසඤ්ච මණිබන්ධතො**
**හත්‍ථෙ පිණ්ඩිකමංසම්හා-හෙට්ඨා පාදෙ උභො 'පි ච**
**විවරිත්වා 'වසෙසඤ්ච-ඡාදෙත්වා වෙ නිසීදති**
**හොති සො සුපටිච්ඡන්නො-දොසො වාසූපගස්ස න"** යි.

"ගලවළයෙන් උඩ හිස ද, මිණිබඳතින් යට හස්තයන් ද, පිඬුමසින් යට උභය පාදයන් ද, නො වසා ඉතිරි (උඩු කය හා යට) කය (ඇඳීමෙන් හා පෙරෙවීමෙන්) වසා හිඳී නම්, හේ සුපිළිසන් නම් වේ. වාසොපගයාහට දොෂ නැති" යනු අර්‍ථ යි.

**"මණිබන්ධතො'ති, ඉමිනා'පි හෙට්ඨා'ති යොජෙතබ්බං"** යනු ටීකා යි. 'හෙට්ඨා පාදෙ උභො 'පි ච' යන තැනින් 'උභො' යනු නිබිය දී 'හෙට්ඨා' යන්න ගෙන 'මණිබන්ධතො' යන්න හා යෙදිය යුතු බව මේ පදයොජනායෙහි දු කියත්. 'උභො' යනු යෙදිය යුතු කොට නො කීයේ කිම යත්? 'උභො' යනු පාදාපෙක්‍ෂායෙන් කීවෙකි. පාදාපෙක්‍ෂායෙන් 'උභො'යි කියනට ත්, හස්තාපෙක්‍ෂායෙන් නො කියනට ත්, හෙතු කිමය ත්? ඡාදනය එක් හස්තයෙක කී බව මුත්, උභයහස්තයෙහි නො කී බව දක්වන්නට යි. එක් හස්තයෙක්හි මැ ඡාදනය කීයේ කොතැන යැ යත්? **'සාවමණිබන්ධං පටිච්ඡාදෙත්වා'** යි වදාළ වචන ගෙන **'ඡාදෙත්වා මණිබන්ධඤ්ච'**යි උඩු කය වසන සැටි දක්වමින් 'බුඬ දත්ත' අර්‍ථකථාචාය‍ර්‍යයෝ මැ කැල මැ කිහු මැ යි.

'මණිබන්ධතො පට්ඨාය හත්‍ථෙ' යන මේ දෙවන ශික්‍ෂායෙහි වදාළ වචනයට **"මිණිබඳන් දෙක පටන් අත් දෙක විවෘත කොට"** යි අර්‍ථ දෙන්නට හෙතු නැති. ඇඟ වසන සැටි වදාළ අටුවා පාඨය හා එහි විනිශ්චය දක්වා ලූ 'විනයවිනිශ්චය' විප්‍රලාප නො වන හෙයිනි. **'අර්‍ථකථා'** යැ. **'විනයවිනිශ්චය'** යන මෙයට වඩා ප්‍රමාණවයෙන් ගත මනා විනයප්‍රකරණ නැති වන බැවින් **ලජ්ජීන්** විසින් මෙතෙකින් මැ සතුටු විය යුතු යි.

# 10 අනාපත්ති.

ඇතුළුගෙට වදනා කල සුපිළිසන් විය යුතු ය යි වදාළ හෙයින් ඒ ගෙයින් බැහැර දීර්ඝමාර්ගාදියෙහි නම්, සුපිළිසන් නො විය යුතු ද? යනු විනයධර්මයෙන් මැ පරීක්‍ෂා කළ යුතු යි. "**නිද්දානං පුග්ගලං**" යනාදීන් වදාළ පරීක්‍ෂණමාර්ගයෙහි සත් වන ලක්‍ෂණයෙන් එය පරීක්‍ෂා කළ යුත්තේ යැ. එනම්:-"අනාපත්තිවාරය" බැලීම යි. අනාපත්තිවාරයෙහි දී වාසොපගතයාහට '**අනාපත්ති**' වදාළ හෙයින් ඇතුළුගෙය වේ වා, මග වේ වා, වාසොපග නො වන සියලු තන්හි මැ සුපිළිසන් විය යුතු යි. ආපත්තික්ෂෙත්‍ර වන බැවිනි.

"**වාසූපගස්සා'ති එත්ථ කායං විවරිත්වා නිසීදතො,ති සෙසො. වාසූපගො නාම රත්තිං වාසත්ථාය උපගතො. එතෙන වාසත්ථාය අන්තරඝරං උපගච්ඡන්තෙනා'පි සුපටිච්ඡන්නෙනෙ'ව උපගන්තබ්බන්ති දීපිතං හොති**" යනු වනච්තිස ටීකා යි.

මෙහි රාත්‍රිවාසයට ගියහු උරහිස ත් ළය ත් විවෘත කළ ද, දොෂ නො වන බව ත්, වාසොපගතයාහට නිර්දොෂ වදාළ බැවින් ඇතුළුගේ තුළ මතු නො වැ ඇතුළුගෙට යන මගතෙහි දු' උරහිස ත් ළය ත් වැසී යන පරිද්දෙන් සුපිළිසන් වැ මැ යායුතු බව ත් කාපිත යි. ආපත්තික්ෂෙත්‍ර වන දීර්ඝමාර්ගාදියෙහි දු, උරහිස හා ළය නො වසා ගිය, වරද වන සැටි මෙයින් මැ දතයුතු යි. "**අයං පදෙසො මනොරමො**" යි "**මේ පෙදෙස මනරම්**" යි වෙන් කරත් මැ ඉන් "බැහැර මනරම් නො වේ" යන ප්‍රතිභා උපදී. අනාපත්ති ක්ෂෙත්‍රයෙහි දී "**වාසූපගතස්ස**" යි වෙන් කොට වදාළෙන් "**දීර්ඝ මාර්ගාදිය ද ආපත්තික්ෂෙත්‍ර යැ**" යන නියමය බුද්ධවචනයෙන් මැ උපදී. එකොක් ඇත. **එහි දෙපටසගල ගැටවටු ලූව ද, නො ලූව ද, වරද නැති. එයට එකාන්තක්ෂෙත්‍ර නම්, ශ්‍රාමය වන බැවිනි. ඒ ද බුද්ධවචනයෙන් සිද්ධ යි.**

මෙසේ හෙයින් යම් යම් තැනෙක 'පිරිමඬුලු හැදීම' කළ යුතු ද? ඒ සියලු තන්හි සුපිළිසන් සිබයෙන් වැසිය යුතු සියලු තැනු දු වැසිය යුතු. අනාපත්තිවාරය බලා එය නිශ්චය කර ගත යුතු යි.

තවද, හැදීම ත් සුපිළිසන් වීමේ අඞ්ගයෙක් මැ යි. "**සසසං ඡාදෙත්වා නිසින්නො සුපටිච්ඡන්නො නාම**" යි හැඳ පෙරෙවැ හුන්නේ සුපිළිසනැ යි ගම්‍යමාන බැවිනි. එයින් පිරිමඬුල්ලට

හැන්ද මතා සියලු තන් හි මැ පිරිමඬුල්ලට පෙරෙව ගත යුතු වේ. දෙක එක්විමෙන් සුපිළිසන් ද වේ. මෙසේ හෙයින් සුපිළිසන් සිඛය ගෙන "එමතිවිනොදනියෙහි" කියන ලද්දේ සත්‍යයෙක් මැ යි.

**"ගණ්ඨිකං පටිමුඤ්චිත්වා'ති ආදි පටිච්ඡාදනවිධිදස්සනං. ගීවං පටිච්ඡාදෙත්වා'ති ආදිනා වුත්තනයා සඤ්චිච්ච ගීවං මණිබන්ධනඤ්ච අපටිච්ඡාදෙන්තස්ස ආපත්ති. එත්ථා'පි පරිමණ්ඩල සික්ඛාපදස්ස සාධාරණත්තා ජාණුමණ්ඩලතො හෙට්ඨා චතුරඞ්ගුලමත්තං ඔතාරෙත්වා අතොලම්බෙත්වා පරිමණ්ඩල'මෙව පාරුපිතබ්බං"**

"ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යනාදිය ප්‍රතිච්ඡාදනවිධිදර්ශන යි. 'ගීවං පටිච්ඡාදෙත්වා' යනාදීන් වදාරන ලද බැවින් දනගෙන ගලය ද' මැණික්කටුව ද නො වසන්නාහට ඇවැති. මේ සුපිළිසන් සිඛයෙහි දු, "**පරිමණ්ඩලං පාරුපිස්සාමී'ති සික්ඛා කරණීයා**" යි වදාළ ශික්ෂාපදය තමා සාධාරණ බැවින් දනමඩලින් යට සතර ගුල් පමණ බහා කන් නො එල්වා පරිමණ්ඩලප්‍රාවරණශික්ෂායෙහි වදාළ ප්‍රාවරණය මැ කළ යුතු යි." යනු භාව යි.

සඞ්ඝසන්නිපාතාදියෙහි කළයුතු පරිමණ්ඩලප්‍රාවරණය මුත් තදන්‍යකායච්ඡාදනයක් සුපිළිසන්සිඛයේ නැති බව මේ ටීකාකාරයෝ ඍජුව මැ කියති. මේ වනාහි සුපිළිසන් සිඛයේ අනාපත්තිවාරය ගෙන වාසොපගත නො වත් හොත් කවර තැනෙක වුව ද සුපිළිසන්සිඛයෙන් වැසිය යුතු සියලු තැන් වැසිය යුතු සැටි දැක පරිමණ්ඩලප්‍රාවරණසිඛය ත් පිරිමඬුලු හැඳීම් සිඛය ත්, එලෙස මැ බව දැක, දෙ කෙළවර විෂම කර ලීම නිසා "පිරිමඬුලු සිඛය" ද උරහිස ත්, ළය ත්, විවෘත කර ලීම නිසා "සුපිළිසන් සිඛය" ද වදාළ බව මුත් ශික්ෂා දෙකින් ලිඟු දෙකක් නො වදාළ බව දැන ති සැටි යි. එසින් සුකාපිත සි.

## 11. අපූර්ව ව්‍යවහාරයෙක්.

---

"සුපටිච්ඡන්නයෙන්" යන්නේ යැ. "**සුපටිච්ඡන්නපාරුපනය**" මෙ ආදි අපූර්වව්‍යවහාරයෝ ලිඞ්ගපරිවර්තනයෙන් පසු පහළ වූහ. ප්‍රවචනයෙහි නම් "**සුපටිච්ඡන්න**" යනු ප්‍රාවරණක්‍රියාමාත්‍රයට මැ නම් නො වෙ. "**සුපටිච්ඡන්නො**

**අනන්තරස්සරෙ"** යනාදී බුද්ධවචන මැ එයට සාධක යි. ශබ්ද නිෂ්පත්ති යෙහු දු **"සුසම්මජ්ජනත"** ශබ්දය මෙහි දී පුරුෂද්‍රව්‍යය හැර පියා ක්‍රියාමාත්‍රය මැ නො කියයි. එයින් **"සුසම්මජ්ජනත යෙන්"** යන්මෙන් යැ" යනාදි ශාසනයෙහි පෙර නො වූ ව්‍යවහාර අභ්‍යාසියෙන් මැ හාස්‍යාස්පද යි. **ශෝධනමාත්‍රය මැ නො ගෙන අඟ වසා ගත් සිඟුව මැ** ප්‍රකාශ කොට වදාළ ද්‍රව්‍යවාචී **"සුසම්මජ්ජනත"** ශබ්දය භාවක්‍රියාමාත්‍රවාචී කොට ගෙන ද යෙදීම ප්‍රවචනයට විරොධ යි. ශබ්දනිෂ්පත්තියක් ප්‍රවචන ප්‍රයොගයේ භාෂාවිශාරදයන් විසින් බැලිය යුතු යි.

## 12. අටුවා පාඨ දෙක.

---

සුපිළිසත් සිඛයට **"ගණ්ඨිකං පටිමුඤ්චිත්වා"** යනාදීන් එකාංස කොට ඇඟ වැසීමෙන් ගලය වසා යා යුතු යැ යි අටුවා තිබියදී "ගලවාට කතො" යනාදීන් දෙවන අටුවා වදාළේ කුමට යැ යත්? හැඳීම් පමණෙකින් සුපිළිසත් නම් නො වේ. ඇතුළුගෙට අධඃකාය වසනා සැටි "පරිමණ්ඩල නිවාසන ශික්ෂායෙහි" වදාළ හ. නො හැඳ උඩුකය වසා ලූ පමණෙකිනු දු සුපිළිසත් නම් නො වේ. ඇතුළු ගෙට උඩුකය වසා ලන සැටි ප්‍රතිච්ඡාදනවිධිදර්ශනයෙහි "ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යනාදීන් වදාළහ.

හැඳීමෙනු දු පෙරෙවීමෙනු දු සුපිළිසත් නම්. එයින් දෙ තැනෙක ලා වදහළ අධඃකායච්ඡාදනවිධියෙනු දු ඌර්ධ්වකායච්ඡාදනවිධියෙනු දු යුක්ත වැ හිඳ ගන්නා කල "මේ මේ තන් විවෘත වැ පෙනී යන ලෙසින් හිඳිය යුතු යැ"යි දක්වන්නට දෙවන අටුවා යැ. එහි **"ගලවාටකතො පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ"** යන මෙතෙකින් පළමු වදාළ සැටියෙන් එකාංස කොට ඌර්ධ්වකාය වසන කල හසුවන හිම් ද විවෘත වැ පවත්නා තැන් ද කථිත යි. **"පිණ්ඩිකමංසතො ච පට්ඨාය පාදෙ"** යන මෙතෙකින් පරිමණ්ඩලනිවසනශික්ෂායෙහි වදාළ සැටියෙන් අධඃකාය වසන කල අඳනය බස්නා හිම් ද එයින් හසු නො වන පාදප්‍රදෙශ ද කථිත යි. මෙසේ "ඇඳීමෙන් හා පෙරෙවීමෙන්" සුපිළිසත් වැ හිඳ ගත යුතු අයුරු දක්වා ලීම දෙවන අටුවා පාඨයෙහි ඵල යි. මෙහි හිම් ලෙසින් "ගලවළුව" කියනු දු හිසේ හිම් නම්; සම්පූර්ණ ගලය නු යි "ගලය වටා" ගතයුතු ය යි දු, ඌර්ධ්ව ශරීරයා ගේ දු අධඃශරීරයා ගේ

ද දැක්වුණු හිමි වසා ලීම "ඇඳීමෙන් හා පෙරෙවීමෙනැ"යි මනා ගෙන අඳනා සිවුරට වඩා දිග පලලින් ගත් පොරෝනයෙකින් කළයුතු ය යි ද, ලිඞ්ගපරිවර්තනය කළවුන් ගත් සැටි යි. ඔවුන් මෙහි අළු ගන්නා සැටියෙන් ඇතුළු ගේ පිණිස "පිරිමඬුළු හැඳීම්" ශික්ෂාව නිෂ්ප්‍රයොජන යි. අධඃශරීරයේ දැක්වුණු හිම ඌර්ධ්ව ශරීරය වැසිය යුතු පොරෝනයෙන් මැ වැසිය යුතු නම් හැඳීමේ පිරිමඬුලු නියමින් කම් නැති හෙයිනි. සුපිළිසන් වන සැටි වදළ අටුවා පාඨය වන "සිද්ධාන්තය" ද නිෂ්ප්‍රයොජන යි. මෙ තන්හි "මිණි බහන් දෙකක්" ගන්නා බැවිනි.

## 13 චීවරබන්ධය.

---

**"තෙන හි භික්ඛවෙ භික්ඛූනං භත්තග්ගෙ වත්තං පඤ්ඤපෙස්සාමි. යථා භික්ඛූහි භත්තග්ගෙ වත්තිතබ්බං. සචෙ ආරාමෙ කාලො ආරොචිතො හොති, තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො"**

**"සුළුවග පෙළෙහි"** භක්තාග්‍ර වත දක්වමින් වදළ වචන යි. මේ පෙළෙහි භක්තාග්‍රයට වඩනා කල අඳනය ඇඳ පටිය බැඳ ගැටය වටු ගන්වා ගෙන සඟළ දෙක පෙරෙ වැ ගෙන යා යුතු බව වදළහ. එයින් මෙහි ලා කරන අටුවායෙහි අඳනය ඇඳ පටිය බැඳ ලිය යුතු බව නම්, වදුරා ලිය යුතු මැ නො වේ. අන් යමක් ඇත හොත් වදුරා ලිය යුතු යි. මේ පෙළෙහි අටුවා නම්:—

**"භත්තග්ගවත්තෙ:— අන්තො ගාමො වා හොතු විහාරො වා මනුස්සානං පරිවෙසනට්ඨානං ගච්ඡන්තෙන චීවරං පාරුපිත්වා කායබන්ධනං බන්ධමෙව වට්ටතී'ති අට්ඨකථාසු වුත්තං"** යන මෙතෙකි.

"භක්තාග්‍රයට යන කල සිවුර ද පෙරවැ කාබහනක් බඳනා ලද්දේ මැ වටනේ යැ" යනු අටුවාවල වදළ බව මෙහි වදරති. දැක්වුණු පෙළ ත් එහි මේ අටුවා ත් සසඳ බැලිය යුතු යි. සසඳ බලත් මැ මේ අටුවාහි වදළ චීවරබන්ධය නම් "සුපිළිසන් වැ පෙරෙවි සිවුර මත බැඳ ලිය යුතු කාබහන යැ" යනු ව්‍යක්ත වැ පෙනේ මැ යි.

සුපිළිසන්සිඛයෙහි වදහළ "අන්තරඝරය" නම් භක්තාග්‍රය ද සඞ්ග්‍රහ කරයි. ගම වේ වා, වෙහෙර වේ වා, යම් තැනෙක භක්තාග්‍රය ද එ ද "අන්තරඝර" නමි. "**මෙහි අතුරුඝර නම් ගම් එව් වෙහෙර එව් මිනිසුන් බිඳ ලක්නා තැනි**" යනු "සුපිළිසන්සිඛයෙහි දී" කියන ලද "**සිඛවළඳ විනිස**" වචන යි.

සුළුවග පෙළෙහි "**භත්තග්ග**" යි වදාරන ලද්දේ ත් "අන්තරඝරය" වෙයි. එයට වදහළ අටුවායෙහි "**මනුස්සානං පරිවෙසනට්ඨානං**" යි වදාරන ලද්දේ ත් "අන්තරඝරය" වෙයි. එයින් මැ පෙළෙහි වදාළ "භත්තග්ග" යනු දු අටුවාහි වදාළ "**මනුස්සානං පරිවෙසනට්ඨානං**" යනු දු සමානාර්ථ යි. අන්තරඝර යි.

අන්තරඝරයට යන් මැ අඳනය ඇඳ පටිය බැඳ ලීම භක්තාග්‍ර වන වදාළ පෙළෙහි ත් එතු දු, වෙහෙර වේ ව යි, ගම වේ ව යි, ඒ අන්තරඝරයට සඟළ මත පටිය බැඳ ලීම පෙළෙහි නැත. එනුයේ කවර තැනෙකැ දූ යි නැඟ එන චොදනාව සිත තබා "**චීවරං පාරුපිත්වා කායබන්ධනං බන්ධෙව වට්ටති'ති පාළියං වුත්තං**" යි නො වදාරා "**අට්ඨකථාසු වුත්තං**" යි වදාරන ලදී. අන්තරඝරයට චීවරබන්ධය අර්ථකථාසම්මතය බව එයින් ඥාපිත යි.

අන්තරඝරයට චීවරබන්ධය ත් වටනා බව වදාළ මේ අටුවා පාඨයෙහි එනුයේ "අඳනයට බැඳ ලිය යුතු පටිය වේ යැ" යි කිය හැකි නම්, මාතෘවිවාහක්‍රමොපදෙශසාර්ථනය මෙන් **නිෂ්ප්‍රයො**ජන අටුවායෙකි. යම් පෙළක් ගෙන මේ අටුවා වදාරන ලද ද, ඒ පෙළෙහි මැ අඳනය ඇඳ පටිය බැඳ ලිය යුතු බව වදාළ බැවිනි. "**අට්ඨකථාසු වුත්තං**" යන මේ වචනයෙන් මැ "**චීවරබන්ධය**" පෙළෙහි නො එන බව ත් අර්ථකථාසම්මතය බව ත් අටුවාපාඨය මැ කියන්නේ යැ.

ඇතුළුගෙට යන් මැ සුපිළිසන් වැ සඟළ මත පටිය බැඳ ලීම අටුවානියම්. පූර්වොක්ත පෙළට වදාළ අටුවායෙන් එය දන්නේ යැ. අප විසින් සුපිළිසන්සිඛයට දෙන ලද ව්‍යාඛ්‍යානය එහි භූතාර්ථය වෙයි ද? නො වෙයි ද? යනු මේ "චීවරබන්ධ" යෙනු දූ, විමසිය යුතු යි. "**අංසබන්ධ**" ද පෙළෙහි නැති. ඒ ද අටුවානියම යක් වැ තිබිය දී, උභයාංසගණයෙහි භික්ෂූන් එය පිළිගෙන "චීවර බන්ධය" ගරහමින් "අටපිරිකෙරෙහි පටි දෙකක් නැති" යි ආක්ෂීණ කරන්නට හෙතුව නම්;– බුදුන් රහතන් ගෙන් පැවත ආ ආකල්පයට නිගා දී අන්‍ය චිහනයක් රචනා කර ගැනුම්. මේ

“චීවරඛන්ධය” වදාළ අටුවා ඔවුන් රචනා කළ ලිඛිතයට බාධක යි.

මේ අටුවානියමය ලක්දිව භික්ෂූන් කෙරේ පැවැත ආයේ වියැ. විදෙශ වල කිසි විටෙක නො පැවැතිය හැකි ද වෙයි. එයින් මැ “විමතිවිනොදනීකාරං” දීත් මෙය ප්‍රසංශිත කළ බව පෙනේ.

ලක්දිව අතීතපයඞ්ාපතිධරයන් දවස ඇතුළුගෙට යත් මැ යථොකත නියමය ගරු කළ බවට සාධකත්වයෙන් “**සැපිලියානේ ශිලාලිපිය**” බලන්නේ යැ. එහි එක් තැනට තුන් සිවුරු දු, දත් කඩ දු, **වකබඳනා** දෙසකු දු, දෙන්නට නියමි. බුරුම රට “**කල්‍යාණීශිලාලිපිය**” ද බලන්නේ යැ. ඇත හොත් “**චූල ගණ්ඨි පදය**” ද බලන්නේ යැ. “**සිඛවලඥවිනිස**” ද බලන්නේ යැ. “අලෞංප්‍රා” රජු දවස දක්වා බුරුමශාසනයේ පැවැති බව දැන ගනු පිණිස “**සාසනවංසප්පදීපිකාව**” ද බලන්නේ යි. මෙයට විරුඩ වනුවන් විසින් “ඇපි යැ විනයමහඅටුවා නො පිළි ගනුමෝ” යනු මිස කියයුත්තක් මැ නැති සේ සිතිය යුතු.

# 14. සුගත් තුන් සිවුර.

“**තත්‍රි'දං සුගතස්ස සුගතචීවරප්පමාණං. දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා. තිරියං ඡ විදත්ථියො. ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණං**”

එහි මේ සුගතයන් ගේ සුගතචීවරප්‍රමාණ යැ. සුගත් වියතින් දිගින් නව වියති. සරස ස වියති. මේ සුගතයන් ගේ සුගතචීවර ප්‍රමාණය වේ.

මේ බුඩභාෂිතයෙහි “සුගතන්තරවාසකප්පමාණං” යි හෝ, “සුගතුත්තරාසඞ්ගප්පමාණං” යි හෝ, “සුගතසඞ්ඝාටිප්පමාණං” යි හෝ, නො වදුරා “සුගතචීවරප්පමාණං” යි වදුරන ලදී. “චීවර” යනු සිවුරු තුනට මැ සමාන යැ. එයින් මේ අප බුදුන් ගේ තුන් සිවුරෙහි ප්‍රමාණය වෙයි. මෙයින් අප බුදුහු එක තරම් දිගැති එක තරම් පලලැති තුන් සිවුරු ධැරූසේකැ යි ද, එයින් මැ ඔබ ගේ අඳනා සිවුරට වඩා පොරෝනා සූත්‍රමාත්‍රයකිනු දු, දිගින් හෝ පලලින් අධික නො වී යැ යි ද, දතයුතු. මේ සූත්‍රයේ අප බුදුන් ගේ ත්‍රිචීවරප්‍රමාණය වදාළ බව අතිදීර්ඝකාලයෙක සිට නො දත්හ.

## 15. සුගත් වියත.

බුදුන් ගේ තුන් සිවුරු වලැ පමණ "**සුගතවිදත්‍ථි**"යෙන් වදාරන ලදී. "**සුගත විදත්‍ථි**" යනු කිම? සුගතයන් ගේ වියති. ඔබ ගේ දෙලොසඟුලි.

**"දීඝසො ච පමාණෙන**
**නව තස්ස විදත්ථියො**
**තිරියං ඡ විනිද්දිට්ඨා**
**සුගතස්ස විදත්ථියා"**

පූර්වෝක්ත සූත්‍රය ගෙන "විනයවිනිශ්චය"යෙහි විවරණ කළ සැටි යි. "තස්ස විදත්ථියා-සුගතස්ස විදත්ථියා" යි බුදුන් ගේ වියතින් ඔබ ගේ චීවරප්‍රමාණය වදහළ බව දර්ශිත යි.

මෙසේ තමන් වියතින් අට වියත් වන සුගතයන් වහන්සේ ඔබ මැ ගේ වියතින් සවියත් උසැති පොරෝනය කෙසේ පෙරෙවි සේක් ද? සුපිළිසන් සිබයේ අා ලෙස මිස අන් ලෙසෙකින් පෙරෙවැ ගන්නට මේ මඳ වෙයි. බුදුන් ගේ මේ චීවරප්‍රමාණයෙනු දු, අප බුදුන් ගේ '**වෙෂය**' දෙවුර වැසුම නො වන බව දතයුතු යි.

### මානභෙදය.

---

සුගතයන් ගේ වියත එන ශික්‍ෂා අතුරින් කුටිකාරශික්‍ෂායෙහි වෙනසෙක් වෙයි. එහි නියමිත මානය කෙසගකිනු දු අඩු කර ලුව ද, වැඩි කර ලුව ද, වරද වෙයි. අන් සියලු තන්හි හිම්පත්වා මිනුව, වරද වෙයි. යම් තැනෙක 'සුගත් වියතින්' මැ ගත යුතු ද, 'මධ්‍යමපුරුෂප්‍රමාණ'යෙන් මැ මිනිය යුතු ද, ඒ තන්හි පෙළෙහි දු අටුවාහි දු වෙනස ඇති. අන් සියලු තන්හි තමන් තමන් ගේ කායප්‍රමාණයෙන් මැ මිනිය යුතු හෙයින් කිය යුත්තෙක් නැති නු යි අටුවාහි කිසි දු නො වදාළහ. තුන් සිවුරට සමාන ශික්‍ෂා සමාන අර්‍ථකථා තිබිය දී 'අඳනා සිවුර' උසත දෙරියන් වියත් ගැනුම අද දක්වා ගෙන ඊමෙන් මෙ කී අදහස පොරණැදුරන් ගිය මඟ බව දතයුතු. පොරෝනා විශාල කිරීමෙන් අතිදීර්‍ඝ කාලයෙක සිට ලොකායේ මෙ කාරුණ හෙළි නො වුණු බව දතයුතු.

මේ භේදය පරීක්‍ෂා නො කළ ඇතම් නවීන ටීකාකාරයන් කළ අවුල ඉමහති. 'කුටිකාර' ශික්‍ෂායෙහි මධ්‍යමපුරුෂප්‍රමාණය ගත යුතු බව අටුවාහි වදාරන්නට ත්, ඉතිරි තන්හි කිසි ත් නො වදාරන්නට ත්, හෙතුව කිම් ද? යනු ඇතැම් ටීකාකාරයෝ නො සිතුහු. මේ පරීක්‍ෂා නො දත් නවීනයෝ 'විනය අටුවා' ප්‍රතික්‍ෂෙප කොට නානාමත උද්භාවනා කෙරෙති. "සුගතවිදත්‍ථිවිධානා"දිය බැලිය යුතු සි. මේ මෙහි දිඞ්මාත්‍ර සි.

## 16. භික්‍ෂූන් ගේ තුන් සිවුර.

තමන් ගේ අඳනා සිවුරට වඩා පොරෝනා දෙක දිගින් හෝ පලලින් අධික විය යුතු යැ යි ලජ්ජියකු විසින් නො කිය හැකි සි. **"තුන් සිවුරට සමානශික්‍ෂා යැ. සමානඅභිසාථා යැ."** මේ තුන් සිවුරු එක තරම් බවට හෙතු සි. **"යො පන භික්ඛු සුගත චීවරප්පමාණං"** යනාදීන් තුන් සිවුරට සමානශික්‍ෂා වදාළ සැටි දු **"තිචීවරං අධිට්ඨහන්තෙන"** යනාදීන් තුන් සිවුරට සමානාභිසාථා වදාළ සැටි දු, **"දීඝස්ස භික්ඛුනො පමාණෙන සතං සඞිනං තත්‍ථ රස්සස්ස භික්ඛුනො චීවරං පාරුපියමානං නප්පහොති.-පෙ-තස්ස මජ්ඣිම ඉතරස්ස භික්ඛුනො පමාණෙන"** යනාදීන් සුළුවග අටුවාහි වදාළ වචනයෙන් තමන් තමන් ගේ දෙහප්‍රමාණයෙන් සිවුරු මිතිය යුතු කොට දැක්වුණු සැටි දු දත්තේ යැ. "තුන් සිවුරට සමානශික්‍ෂා යැ, සමානඅභිසාථා යැ" යනු දු, අතිදීර්ඝකාලයෙක සිට ලොකයේ නො දන්හ. **"සුළුවග අටුවා"** යෙහි දී සිවුරු කරන් මැ උස භික්‍ෂුව ගේ දෙහප්‍රමාණය මිටි භික්‍ෂුවට විරුඬ බව වදාළෙන් තුන් සිවුරේ ගත මනා ප්‍රමාණය තමන් තමන් ගේ දෙහප්‍රමාණයෙන් මැ දන්නේ යැ. යම් තරම් විශාල අඳනයක් තමනට සරි ලසි ද, පොරෝනා දෙකෙහි ප්‍රමාණ ය ද එය මැ වෙසි දතයුතු. අන් පමණෙකි සි වදාළ පෙළ අටුවා නැති හෙයිනි.

අඳනයේ පොරෝනයේ සැටි සැටියෙන් පරිමණ්ඩලශික්‍ෂා-සුප්‍රතිච්ඡන්නශික්‍ෂා වෙනස් විය හැකි නම්, අඳනා පොරෝනා වලැ දිග පලල පිළිබඳ පරීක්‍ෂායෙන් වැඩ නැති. අටුවාහි වදාළ සැටියෙන් මැ ඇඳීම පෙරවීම කළයුතු නම්, අඳනා පොරෝනා වල දිග පලල නියම වියයුතු සි. පමණ ඉක්ම ගිය පොරෝනය අන් සැටියෙකිනු දු, පමණැති පොරෝනය අන් සැටියෙකිනු දු, වත් මුත් එක් සැටියෙකින් නො පිහිටන බැවිනි. මෙසේ හෙයින්

අඳනා පොරෝනා සැටි නියම කොට වදාළ අටුවා වචන මැ තුන් සිවුරේ ගත මනා ප්‍රමාණයක් ඇති බව ද නියම කළ බව සියලු තෙරවරුන් විසින් සිතිය යුතු යි. "**ත්‍රිචීවරය නම්, පරිමණ්ඩල නිවසන ප්‍රාවරණ ශික්ෂා පූරා ලන්නට වෙයි. එසින් යථොක්ත ශික්ෂාපදද්වයයෙන් මැ ත්‍රිචීවරප්‍රමාණය ද සිද්ධ නු යි." අඳනයේ පමණින් පොරෝනා දෙකෙහි දු පමණ දන්නේ යැ. අඳනය තරම් පොරෝනය පරිමණ්ඩලප්‍රාවරණයට ප්‍රමාණ යි.**" බුදුන් වහන්සේට සවියත් උසැති තුන් සිවුරු පමණ වැ තිබිය දී, තමන් හට එතරම් සිවුරු පමණ නො වන්නට හෙතු කිම දැ යි කියා හෝ, තුන් සිවුරට සමානශික්ෂා සමානඅර්ථකථා වැ තිබිය දී ත්, තමන් ගේ දෙහප්‍රමාණයෙන් තුන් සිවුරේ පමණ මිනිය යුතුයැ යි වදාරා තිබිය දී ත්, පරිමණ්ඩල නිවසන-ප්‍රාවරණශික්ෂාපදද්වයයෙනු දු, චීවරප්‍රමාණය සිද්ධ වැ තිබිය දී ත්, අඳනා සිවුරට වඩා පොරෝනා අතිවිශාල වියයුතු යැ යි කියන්නට හෝ, හෙතුව කිම් දැ යි ප්‍රශන කළ, "**ලිඞ්ග විපර්‍ය්‍යාසය**" හා "**ලිඞ්ගපරිවර්තනය**" හෙතු විසින් කිය යුතු වෙයි. අන් හෙතුවක් කියන්නට සිතුව' යටත් පිරිසෙසින් මුඛයට ශබ්දමාත්‍රයෙක් වත් නැඟ නො එයි. ත්‍රිචීවරය සමප්‍රමාණ වන හෙයින් මෙ කල භික්ෂූන් ගේ පොරෝනා ශාසන සමයට සර්‍වප්‍රකාරයෙන් විරොධ යි. ශාසනසමයට විරොධ පොරෝනයෙන් "**කඨින**" අතුරා ලීමට වඩා නො අතුරා ලීම මැනවි. එසින් මෙ මේ ශාසනසමයට විරුද්ධ වැ නො ගියේ වෙයි. පොරෝනය ක්‍රමවිරුද්ධ වන කල විනයධර්‍මයෙහි වදාළ සැටියෙන් ගැටවටු පස්වටු පවා නො බැඳ ලිය හේ නු යි. කොසේ 'කඨින'යට අහි වෙයි ද?

## 17. තුන්සිවුරුවල ප්‍රමාණය.

"**තිචීවරස්සා'පි සුගතචීවරප්පමාණතො ඌනකත්තං උක්කට්ඨප්පමාණමෙ'ව. පච්ඡිමං පන විසුං සුත්තෙ වුත්තං නත්ථි**"යි විනයඅටුවා යි.

"ත්‍රිචීවරයා ගේ ද සුගතචීවරප්‍රමාණයෙන් ඌනු බව උත්කර්ෂ ප්‍රමාණය මැ වන්නේ යැ. පශ්චිමප්‍රමාණයෙක් වනාහි වෙන මැ සූත්‍රයේ වදාරන ලද්දේ නැත" යනු අර්ථ යි.

"**පච්ඡිමං පන සුත්තෙ වුත්තං නත්ථි**"යි මෙතෙක් නො වදාරා "**විසුං සුත්තෙ වුත්තං නත්ථි**"යි "**විසුං**" ග්‍රහණය කිම යත්? ඉදින් "**සුත්තෙ වුත්තං නත්ථි**"යි කිව, ත්‍රිචීවරයා ගේ ගත මනා පශ්චිම

ප්‍රමාණයක් සූත්‍රයෙන් අසිද්ධ බව ප්‍රකාශ වන්නේ යැ. සූත්‍රවිරොධ වුව, ත්‍රිචීවරයා ගේ පශ්චිමප්‍රමාණය ඉටනට අහී නො ද වෙයි. අහී වෙයි නම්, සූත්‍රඝටිත න් විය යුතු යි. ත්‍රිචීවරයා ගේ ගත මතා ප්‍රමාණය සූත්‍රයෙන් මැ සිද්ධ යි. ඒ එසේ මැ යි.

**“පරිමණ්ඩලං නිවාසෙස්සාමී’ති සික්ඛා කරණීයා” “පරිමණ්ඩලං පාරුපිස්සාමී’ති සික්ඛා කරණීයා”** යනු සූත්‍ර යි.

**“පරිමණ්ඩලනිවසනය ද, පරිමණ්ඩලප්‍රාවරණය දැ යි උභය ශික්‍ෂා පිරිය යුතු බව සූත්‍රයෙහි වදාළහ. තුන් සිඹුරින් වෙන් වැ ඒ ශික්‍ෂාපදද්වය නො පිරිය හෙයි. එසින් අටුවාහි වදාළ පරිද්දෙන් ඒ ශික්‍ෂාපදද්වය පුරන්නට ගත මනා වසනප්‍රමාණය ත්‍රිචීවරයා ගේ ප්‍රමාණය වන්නේ යැ.”** මෙසේ පූර්වෝක්ත ශික්‍ෂාපදද්වයයෙන් ත්‍රිචීවරයා ගේ ගත මතා ප්‍රමාණය ද නය විසින් සිද්ධ වන්නේ යැ. ප්‍රමාණ වනුයේ උසත මුෂ්ටිත්‍රිකයෙකි. දිගත මුෂ්ටිපඤ්චකයෙකි. යථෝක්ත ශික්‍ෂාපදද්වය පුරන්නට මේ ප්‍රමාණ යි. මෙසේ හෙයින් මුෂ්ටිත්‍රිකත්‍රිචීවරය පරිමණ්ඩලනිවසන-පරිමණ්ඩලප්‍රාවරණශික්‍ෂාසඞ්ඛ්‍යාත සූත්‍රද්වයයෙන් මැ නය විසින් සිද්ධ නු යි, එකාන්තයෙන් අප බුදුන් ගේ අභිප්‍රායානුකූල න් වෙයි. වදාළෙ මැ නො අටුවායෙහි දු:–

**“තිචීවරස්ස පච්ඡිමප්පමාණඤ්ච ඡිද්දප්පමාණඤ්ච ඡිද්දුප්පත්තිදෙසප්පමාණඤ්ච සබ්බං අට්ඨකථාසුයෙ’ව පරිච්ඡින්දිත්වා වුත්තං. තස්මා සෙව’ව වාදෙ පමාණං අද්ධා හි සො භගවතො අධිප්පායං අනුගන්ත්වා වුත්තො”**යි.

ත්‍රිචීවරයා ගේ පශ්චිම ප්‍රමාණය අටුවා වල වදාළ බව ද, එකාන්තයෙන් ඒ බුදුන් ගේ අභිප්‍රාය අනුගමනය කොට වදාළ බව ද, මෙහි ප්‍රකාශිත යි. මෙසේ පරිමණ්ඩලනිවසන-ප්‍රාවරණශික්‍ෂාපදසඞ්ඛ්‍යාත සූත්‍රද්වයයෙන් මැ ඝටිත නු යි බුද්ධමතානුකූල වන මුෂ්ටිත්‍රිකත්‍රිචීවරය සිද්ධ හෙයින් “**පච්ඡිමං පන සුත්තෙන වුත්තං නත්ථි**”යි නො කිය හැකි යි. එසින් “**විසුං සුත්තෙන වුත්තං නත්ථි**”යි යනු යොදා වදාළහ යි දත යුතු.

## 18. මුෂ්ටිත්‍රික හා මුෂ්ටිපඤ්චක.

:

**“සඞ්ඝාටියා උත්තරාසඞ්ගස්ස ච දීඝතො මුට්ඨිපඤ්චකං තිරියං මුට්ඨිත්තිකං පමාණං වට්ටති. අන්තරවාසකො දීඝතො**

**මුට්ඨිපඤ්චකො තිරියං විහත්ථො'පි වට්ටති. පාරුපනෙන'පි හි සක්කා නාභිං පටිච්ඡාදෙතුන්ති**"යි විනයඅටුවායෙ හි වදාළ හ.

"සඞ්ඝාටියා ගේ ද උත්තරාසඞ්ගයා ගේ ද දිගින් මුෂ්ටිපඤ්චක වූ ත් සරස මුෂ්ටිත්‍රික වූ ත් ප්‍රමාණය වටනේ යැ. අඳනය දිගින් මුෂ්ටිපඤ්චක යි. සරස දෙරියන් වුව ද, වටී. පොරෝනයෙනු දු නැබ වසා ලන්නට හැකි යැ" යනු අර්ථ යි. මෙහි තුන් සිවුර මැ දිගත මුෂ්ටිපඤ්චක බව ත් උසත මුෂ්ටිත්‍රික බව ත් වදාරති. විශෙෂ නම් (වස්ත්‍ර දුර්ලභ වුව) අඳනය මතු සරස දෙරියන් වුව ද, වටනේ යැ යනු යි.

"**එවං නිවාසෙන්තස්ස පන නිවාසනං පමාණිකං වට්ටති. තත්‍ර'දං පමාණං දීඝසො මුට්ඨිපඤ්චකං, තිරියං අඩ්ඪතෙය්‍යහත්ථං. තාදිසස්ස පන අලාභෙ තිරියං ද්විහත්ථපමාණම්පි වට්ටති. ජාණුමණ්ඩලපටිච්ඡාදනත්ථං. නාභිමණ්ඩලම්පන චීවරෙනා'පි සක්කා පටිච්ඡාදෙතුන්ති**"යි. අන් තැනෙක පරිමණ්ඩල නිවසනශික්ෂායෙහි දී අන්තරවාසකයේ මතු ප්‍රමාණය වදාරන විනය අටුවා යි.

පළමු කොට අල අටුවාපාඨය පරීක්ෂාකාරී වැ බලත් මැ එහි "**තිරියං විහත්ථො'පි වට්ටති**"යි "**අපි**" ශබ්දය කිමර්ථ දැ යි දැන ගන්නට අභිලාෂය උපදී. අඳනයේ උසත ත් සඟළ දෙකට කියන ලද "**මුට්ඨිත්තිකය**" බව ද, දෙරියන ප්‍රමාණාන්තරයක් බව ද කියන්නට "**අපි**" ශබ්දය යෙදිණ යනු ප්‍රකාශ යි. වස්ත්‍ර දුර්ලභ වුව, දෙරියන් අඳනය වුව ද, දඟ ඇටින් අටඟුල් පමණ හෙළා පරිමණ්ඩලනිවසනශික්ෂා පිරිය හැකි යි. එයින් නැබ නො වැසු ව ද, වරද නැති. නැබ නම් පොරෝනයෙනු දු වසා ලිය හෙයි.

දෙවන අටුවා පාඨයෙහි "**තිරියං අඩ්ඪතෙය්‍යහත්ථං තාදිසස්ස පන අලාභෙ තිරියං ද්විහත්ථපමාණම්පි වට්ටති**" යනු වචනාන්තරයෙකින් තත් ප්‍රමාණය මැ වදාළ සැටි යි. එයින් "**මුට්ඨිත්තිකං**" යනු දු, **අඩ්ඪතෙය්‍යහත්ථ**" යනු දු, සමානාර්ථ යි. "**අඩ්ඪතෙය්‍යහත්ථ**" නම් දෙරියන් වියති. මිටි රියතින් නම් තුනෙකි. මෙසේ "**මුෂ්ටිත්‍රිකයේ**" ප්‍රමාණය නම්, "**දෙරියන් වියති**" යනු අර්ථකථායෙහි මැ වචනාන්තරයෙන් අන් තැනෙක වදාරන ලදී.

"**මුට්ඨිපඤ්චකානීති, මුට්ඨියා උපලක්ඛිතානි පඤ්චකානි, චතූහත්ථෙ මිනිත්වා පඤ්චමං හත්ථං මුට්ඨිං කත්වා මිනිතබ්බානි, අධිප්පායො – පෙ – මුට්ඨිත්තිකානීති එත්ථා'පි එසො'ව නයො**"යි

“**විමතිවිනොදනීටීකා**”යෙහි “**මුෂ්ටිත්‍රිකා**” නම් දෙරියන් මිටි රියනැ යි කළ විවරණය ටීකාකාරයන් ගේ මතිමාත්‍ර යි. ශබ්ද ලක්ෂණයෙනු දු, නො ලැබිය හෙත සේ ඔවුන් කළ ව්‍යාඛ්‍යානය අටුවායෙහි වදහළ වචනයට සර්වප්‍රකාරයෙන් විරොධ හෙයින් වනධරයන් විසින් නො පිළිගත යුතු යි. මේ ටීකාකාරයන් “**මුෂ්ටිත්‍රිකයේ**” අර්ථ දුන් සැටි දුෂ්ට හෙයින් “**මුෂ්ටිපඤ්චකයේ**” අර්ථ දුන් සැටි දු දුෂ්ට යැ යනු කිය යුතු මැ නොවන්නේ යැ. මෙසේ මේ ටීකායෙහි එන ඇතැම් විවරණ අනුපාදෙය බවට කරුණු කියක් ඉතා බෙහෙවි. මේ ටීකාව නම් විනයඅටුවායෙහි ඇතැම් තැනෙක භූතාර්ථය වරදවා ලන්නකු විසින් ලියන ලදු. ඒ එසේ මැ යි. පළමු වැ සුපිළිසන් සිඛයේ උපන් වරද වදාරන තැනැ “**කායං විවරිත්වා’ති, ජතතුම්පි උරම්පි විවරිත්වා**” යි “කායං විවරිත්වා” යනු “උරහිස ත් ළය ත් විවෘත කොට යැ”යි විනයඅටුවායේ වදාළහ. එක්බිති ගෘහොපවෙශශික්ෂායෙහි අනාපත්තිවාරයෙහි දී “**වාසූපගතස්සා’ති, වාසත්‍ථාය උපගතස්ස රත්තිභාගෙ වා දිවසභාගෙ වා කායං විවරිත්වා නිසීදතො අනාපත්ති**” යි අටුවායේ “වාසූපගතස්ස” යනු “වාසය පිණිස එළඹියාහට යැ, රාත්‍රි භාගයෙහි වේ ව යි, දිවා භාගයෙහි වේ ව යි, කය විවෘත කොට හිඳිනහුට අනාපත්ති යැ”යි වදාරත්.

මෙ තැන්හි අටුවායේ වදාළ අර්ථය පාළ කරනට කැමැති ටීකාකාරයකු විසින් “**කායං විවරිත්වා නිසීදතො’ති, ජතතුම්පි උරම්පි විවරිත්වා නිසීදතො’ති, වුත්තං හොති**”යි ටීකා කළ යුතු. අටුවායේ මුල දී වදාළ අර්ථය මැ මෙතන්හි දු එළවා ලිය යුතු හෙයිනි. මෙය මෙසේ වතු දු, විමතිවිනොදනීකාරයෝ “**විවරිත්වා නිසීදතො’ති, විහාරෙ විය එකංසපාරුපනං සන්‍ධාය වුත්තං**” යි. “**කායං විවරිත්වා නිසීදතො**” යනු “විහාරයෙහි මෙන් එකාංස ප්‍රාවරණය සඳහා වදාරන ලදැ”යි යෙත්. තමන් ඌහා කොට ගත් මතිමාත්‍රය අටුවායේ අර්ථ යැ යි යෙති.

මෙ තන්හි මොවුන් කී වචන සත්‍ය වෙයි නම්, “කායං විවරිත්වා, ති, ජතතුම්පි උරම්පි විවරිත්වා”යි වදාළ අටුවා වචනය අසත්‍ය වියයුතු, අසත්‍ය නො වෙයි.

එකොක් ඇත. වාසොපගතයා ඇතුළුගෙහි උරහිස ත් ළය ත් විවෘතකළ ද, වරද නො වේ යැ ‘යි අටුවායේ වදාළ ද, එසේ වසනු ශ්‍රමණයන් ගේ ධර්මතා නො වෙයි. අරමෙහි වසන ලෙසින් විසීම ධර්මතා යි එයින් එහි “උරහිස ත් ළය ත් විවෘත කළ ද, වරද නො වේ යැ යි වදාළ ත්, අරමෙහි වසන සැටියෙන් විසීම කළයුතු යැ.” යනු

ටීකාකාරයන් ගේ අදහස යි. ඒ "**ම්වජිතා භික්ඛූනො**'ති **ඒකංස පාරුපනා සජ්ඣාය වුත්තා**"යි මෙතෙක් නො දත් වා "විහාරෙ වියැ"යි විශෙෂණය හෙළිමෙන් සපණට යි. මේ අදහස මැනැවි. වරද නම්, මේ අර්ථය අටුවායේ-අර්ථය යි දැක්වීම යි.

"**ඒකං පාරුපනං**" යි ටීකාහි ආ සැටි යැ. "එක පොරෝනයක්" යනු අර්ථ යැ. පසු **කලෙක** ලිඛපරිවර්තනය කළාහු "**ඒකංස පාරුපනං**" යි ලියා ගත්හ, යනු දූ යෙති පෙර කෙසේ වුව ද; මෙ කාල නම් ඇතැම් තෙරවරු ලා හෙළා පත පොත විසංවාද කිරීමෙහි බිය නො වෙති. මේ එයට සාධක යි:-

"**තිචීවරං අධිඨහන්තෙන රජිත්වා කප්පබින්දුං දත්වා පමාණයුත්තමෙ'ව අධිඨාතබ්බං තස්ස පමාණං**......" කඞ්ඛාවිතරණී යි "ත්‍රිචීවරය සිවුරු නමින් ඉටන්නහු විසින් රඳ, කප් බිඳු දී ප්‍රමාණ යුක්ත වූයේ මැ ඉටියැ යුතු. ඒ ත්‍රිචීවරයා ගේ ප්‍රමාණය නම්..." යනු අර්ථ යි. මෙහි "**තිචීවරං**" යි ආරම්භ කළ හෙයින් "**තස්ස**" යි වදාළේ "ඒ ත්‍රිචීවරයා ගේ" යන අර්ථය පාළි කරන්නට මැ යි.

අටුවායේ වදාළ ඇතැම් වචනවලට මගධබසින් මැ ලීනාර්ථ දක්වා ලිම "පිට පොතේ" සිරිති. "පාසාදෙ - දීඝපාසාදෙ" යි මේ ආදී විසින් පාඨය "ඉති" ශබ්දයෙන් වෙන් නො කොට ද එහි ලීනාර්ථ කිහ. පූර්වෝක්ත අටුවාපාඨයෙහි ලීනාර්ථ කියමින් "**තස්ස-තිචීවරස්ස**" යි කිහ. මේ **කඞ්ඛාවිතරණී** පිටපොතේ ආ සැටි යි. "පිට පොත" ශුද්ධ කළාහු "තස්සා" 'ති-චීවරස්ස' යි සකස් කළහ. තුන් සිවුරු එකතරමැ යි කිව, "ඒ එසේ නො වෙයි, '**තස්ස**' යන්නට පිටපොතේ අර්ථ කී සැටිය සාධක යි. "තස්ස" යි තුන් සිවුරු ගත මනා නම්, ලීනාර්ථවශයෙන් එය කිය යුතු නො! යි යථාර්ථය වළහා කියන්නක්හට මේ සංස්කරණය කාරණ වෙයි. මෙසේ මෙ කාල විනයප්‍රකරණ වල අර්ථය බෙහෙවින් වළහන බව කිය යුතු. විනයප්‍රකරණ වෙනස් කර ලීම දරුණු පාපයෙකි. මතු පරපුර විපතෙහි වැටීම ද ලොවී ලොවුතුරා සැප පිණිස පවත්නා ශාසනයේ විනයප්‍රකරණ පරස්පර විරුද්ධාර්ථ වීමෙන් හෙළා දැකිය යුතු තත්ත්වයට වැටීම ද වන පොත් වෙනස් කර ලීමෙන් වන ඵල යි.

විමතිවිනොදනියෙහි පළමු කී පාඨය වේ ව යි, දෙවනුව කී පාඨය වේ ව යි, එකෙක් වත් අටුවායේ අර්ථය නො වෙයි. මෙසේ බොහෝ තන්හි සවකීය මතිමාත්‍රය අර්ථකථාවට නගා කියන

මේ ටීකාකාරයෝ **“කෙචි පන මුට්ඨිහත්ථානං ඡක්කං මුට්ඨි පඤ්චකං, තස්මා පඤ්ච'පි හත්ථෙ මුට්ඨිං කත්වා'ව මිනිතබ්බන්ති, වදන්ති, මුට්ඨිතතියකන්ති, එත්ථා'පි එසෙ'ව නයො”** යි තමන් කළ විවරණයට විරොධ වන පැරණීයන් ගේ විවරණයක් ඇති බව කීහු ද, එය මැ අටුවායෙහි මත සි.

මෙසේ පරිමණ්ඩලනිවසන-ප්‍රාවරණශික්‍ෂා පුරන්නට සම් ප්‍රකාරයෙන් ප්‍රමාණ වන හෙයින් **“ප්‍රමාණචීවර”** යන විශිෂ්ටාභි ධාන ලත් බුද්ධමතානුකූල වූ තමන් මිටින් මිටි තුන් රියන් උසැති මිටි පස්රියන් දිගැති තුන් සිවුරක් විනයධර්මයෙහි වදාළ බව දත යුතු සි.

සුපිළිසන්සිඬය නැත ද, මේ චීවරප්‍රමාණය මැ උභයාංසච්ඡාද නය නම් “ස්ථවිරවාද” නම් ලද අප උතුම් ශාසනයේ ආ “ශ්‍රමණ **වෙෂ”** නො වන බව කියන්නේ යැ. **“පරිමණ්ඩලං පාරු පිස්සාමි”** යනාදී සූත්‍රයෙන් මැ මේ චීවරප්‍රමාණය සිද්ධ වුව ද, මෙසින් දෙවුර වසන්නක්හට යටත් පිරිසෙයින් මණ්ඩලාකාර ය වත් නො දක්වා ලිය හෙන්නේ යැ. බොහෝ කොට කිමෙන් කිම?

## 19. ප්‍රාවරණාඞ්ග.

**“යථා ච පාලිකාරකො භික්ඛු එකංසපාරුපනෙන පාරුතං වාමබාහුං විවරිත්වා චීවරං අංසකූටෙ ආරොපෙති, එවං අපාරුපිත්වා-පෙ-නිබ්බිකාරං පරිමණ්ඩලං පාරුපිතබ්බං. තථා අපාරුපිත්වා ආරාමෙ වා අන්තරඝරෙ වා අනාදරෙන යං කිඤ්චි විකාරං කරොන්තස්ස දුක්කටං.”**

“යම් සේ සඞ්ඝයා පෙල සදන මහණ එකාංසකොට ඇඟ වැසීමෙන් පොරෝනා ලද වාමබාහුව චීවර කොට පොරෝනය අංසකූටයෙහි පෙරළා නගයි ද-පෙ-එ ලෙසින් පොරෝනය දස රියෙහි නො නගා නිර්විකාර පිරිමඬුලු පෙරෙවුම කළ යුතු සි. එසේ පෙරෙව ගෙන මුත්, සඞ්ඝසන්නිපාත—බුද්ධොපස්ථානාදි කාලයෙහි හෝ ඇතුළුගෙහි හෝ අනාදරයෙන් කිසියම් වියරු වක් කරනුවානට දුකුළා වෙසි.” යනු දක්වුණු ‘පරිමණ්ඩලය’ බිඳෙන සැටි වදාළ විනයඅටුවාපාඨයෙහි හාව සි.

මේ අටුවාපාඨයෙන් නැඟ එන අර්ථ කිහිපයෙකි.

2. සඞ්ඝසන්නිපාත—බුද්ධොපට්ඨානාදියෙහි ත් ඇතුළු ගෙහි ත් ඒකාංස කොට ඇඟ වසා විසිය යුතු බව යැ.

(ඇතුළුගෙහි ප්‍රාවරණදෙශය නම්, ඒකාංස කොට ඇඟ වැසීම ය යි නො වදාරා ඒකාංස කොට ඇඟ වැසීමෙන් පොරෝනා ලද වාමහස්තය විවර කිරීම ය යි වෙන් කොට වදාළෙන් මේ අර්ථය ලබ්ධ යි.)

2. ඇතුළුගෙහි ත් පරිමණ්ඩලය පිණිස සම කළයුතු දෙකොළවරින් එකෙක් නම්, වාමහස්තය වසා සිටි සිවුරේ කොළවරක් බව යැ.

(පරිමණ්ඩලය නම්, දෙකොළවර සම කිරීමෙන් වෙයි. වාමහස්ත යෙන් සිවුර අංසකූටයෙහි නහත් මැ, පරිමණ්ඩලය බිඳී යන බව මෙහි වදාළෙන් වාමහස්තය වසා සිටි සිවුරේ කොළවර දෙකොළ වරින් එකක් බව ලබ්ධ යි.)

“වනවිනිසටීකායෙහි”දු ඒකාංසයෙහි කළ පොරෝනයා ගේ පිටිපස බඩපස එල්බෙන දෙකොළවර ඇතු පිට ලූ ගොටු සෙයින් සම කළයුතු බව කියත්. වාසොපගතයා දසරියෙහි සිවුර නඟා ගෙන වසත් මැ, දෙපස දෙකොළවර එල්බෙයි. ගම් වදනා කල වමත මිණිබඳත වසනු පිණිස පිටිපස එල්බ ගත් කොළවර උදර පාර්ශ්වයෙහි කොළවර හා ගොටු සෙයින් සම කළයුතු බව එහි කී අදහස යි. දැක්වුණු අටුවාහි වදාළ මඟ මුත්, අනෙකක් එහි නො කීන යි දතයුතු. මුෂ්ටිත්‍රිකා චීවරයෙන් මැ මෙය සිතිය යුතු යි.)

“සුප්පමාණං චීවරං පාරුපන්තෙන සංහරිත්වා බාහාය උපරි ඨපිතා උභො අන්තා බහිමුඛා තිට්ඨන්ති” යි

“සුප්‍රමාණ පොරෝනය පොරෝනහු විසින් හකුළා බාහුව මත තබන ලද උභයාන්තයෝ බහිර්මුඛ වූවාහු සිටිත්” යි විනය අටුවාහි වදාළ වචනය ද, “මෙ චීවරානි පාරුපන්තස්ස වාමහත්ථෙ සංහරිත්වා ඨපිතානෙ” යි “සඟළ දෙක පොරෝනහු ගේ වම් අතෙහි හකුළා තබන ලද තන්හි”. යි විනයඅටුවාහි වදාළ වචනය ද ගෙන “බාහාය උපරි” යනු දු “වාමහත්ථෙ” යනු දු, සමානාර්ථ බව දැකැ, මුෂ්ටිත්‍රිකප්‍රමාණචීවරය ගෙන සුපිළිසන් සිඛයෙහි දී “පටිසංහරිත්වා යාව මණිබන්ධං පටිච්ඡාදෙත්වා” යි වදාළ සැටියෙන් හැකිළීමෙන් මිණිබඳත දක්වා වසමින් හකුළා වමතෙහි තබන ලද, උභයාන්ත “බාහවන්ත” ලක්ෂණ එළඹෙන බව ද, දතයුතු යි.

මෙ ආදිවිසින් දෙකොළවර සම කිරීම යැ, බාහවන්තලක්ෂණ යැ, ප්‍රතිසංහරණ යැ, මිණිබහත දක්වා වසා ලීම යැ, ගැටය වටුවේ ලීම යැ, යනාදී ප්‍රාවරණාඞ්ගයෝ විනයමහාඅටුවාව ප්‍රමාණ කොට යථෝක්ත තුන් මිටිරියන් පොරෝනය ගෙන "කෙසේ කෙසේ වියයුතු දැ" යි විමසිය යුත්තෝ වෙති. මේ සියලු අඞ්ගයෝ මේ පොරෝනයෙන් ලැබිය යුත්තාහ. තනාමාගීය මැ කවර පොරෝනයක් කෙරෙහි වුව ද, යෙදෙන්නේ යැ. **"පොරෝනයේ හ්‍රස්ව දීර්ඝභෙද පිණිස ප්‍රාවරණාඞ්ග වෙනස්වන බවක් නො වදූරන ලදි. පෙළ යැ අටුවා යැ විනයවිනිශ්චය යැ යන මෙසීන් සිද්ධ ශ්‍රමණවෙෂයට විරොධ වූ කාරුණ්‍ය ගැලපූ අන් ග්‍රන්ථයෙක් නො වන්නේ යැ,"** එයින් ඒ ප්‍රමාණ කොට සියල්ල දතයුතු සි. ගෙන ගිය සඟළ ගම ළඟ දී ගැටවටු ගන්වා පෙරෙ වැ ගැනුම යැ, සඟළ දෙක සගුණ කිරීම යැ, ගැටවටු පස්වටු බැඳලීම යැ, මේ ආදිය ද දන්නේ යැ.

## 20. හැඳීම.

දහ ඇටෙහි පටන් ගෙන වඩුඅඟුලින් අටඟුලක් පමණ අඳනය ද, සතරඟුලක් පමණ පොරෝනය ද, යොළා හැඳීම පෙරෙ වීම කළ යුතු සි. එකල අඳනය සතරඟුල් පමණ තැන් පොරෝනයෙන් වෙන් වැ පෙනේ.

අවසතුයෙහි ශික්ෂාප්‍රඥප්ති නැති. "හැඳීමෙහි පිරිමඬුලු නැතැ" යි **නැඟි** දෙස් පිණිස පරිමණ්ඩලතිවසනශික්ෂා පැනවිණ. එයින් මැ හඳනය වෙන් වැ පෙනී යන බව ව්‍යක්ත වැ ලැබේ. එය නො පෙනී ගිය, දෙස් නනන්නට මං නො ලැබෙන හෙයිනි. තවද, මඳකු දු, නො පෙනී යන සේ අඳනය ඇතුළු කොට ගෙන පොරෝනය බසී නම්, හැඳීම ගෙන වඳුළ **"පරිමණ්ඩලං නිවාසෙස්සාමී'ති සික්ඛා කරණීයා"** යන ශික්ෂාපද මැ තිරම්ඹ වන්නේ යැ.

හැඳ පෙරෙවැ ගත් කල සතරඟුල් පමණ පොරෝනයෙන් වෙන් වැ අඳනය පෙනී යන්නට හෙතුව නම්, දෙන් සිවුරු එක තරම් වීම සි, තුන් සිවුරු එක තරම් වන හෙයින් හැඳ පෙරෙ වැ ගත් කල අඳනය වෙන් වැ සතරඟුල් පමණ පෙනී යනු ස්වයං සිද්ධ යි.

මේ අප පරීක්ෂා කාර පැමිණි නිගමනය යි.

උභයාංසවාදී ඇතැම් කෙනෙක් අඳනාසිවුරට වඩා දිගින් පලලින් අතිවිශාල කොට පොරෝනය ගෙන, අඳනය සතරඟුල් පමණ වෙන් වැ පෙනී යන පරිද්දෙන් ඇඟ දවටා ලති. එසේ දවටත් මැ, වැඩි වූ තාක් ජත්‍රු දෙක වැසී යන සැටියෙන් ගලය වටා රැස් කරත්. තුන් සිවුරු එක තරම් බවට අඳනය සතරඟුල් පමණ වෙන් වැ පෙනී යාම පවා සාධක බව ඔවුන් නො දන්නා සැටි යි.

## 21. විදෙශ වල පැරණි බුද්ධරූප.

---

ධර්මද්වීපයෙහි පෙනී යන පැරණි බුද්ධරූපවලට විරුද්ධ වුව ද, '**බුද්ධරූප**' නමින් දන්නා රූපවිශෙෂයෙක් **ගන්ධාරාදී** විදෙශ වල එයි. එය කිම? දෙවන සඞ්ගායනායෙහි දී පන්නා හළවුන් අතිශය බලසම්පන්න වැ "**ගොකුලිකා**"දී නානානිකායනාමයන්ගෙන් භින්න වැ ගිය බව ද, එසේ මැ "**ලිඞ්ගපරිවර්තනය**" කළ බව ද, "**දීපවංස**"යෙහි කියන බැවින් ඔවුන් කළ "ලිඞ්ගපරිවර්තනය" නම්, මේ ය යි දක්වන රූප යි. මේ රූප මෙ කල ධර්මද්වීපයෙහි දු සංවාදපත්‍රද්වාරයෙන් පළ වෙයි.

"මහාසඞ්ඝිකා"දි සප්තදශනිකායවාසී බුදුසතුරන් තන්තන් සූත්‍රප්‍රදෙශයෙහි අයොනිශොමනස්කාරයෙන් අර්ථ වරදවා ගෙන අනෙකප්‍රකාර දුර්ලබ්ධි උද්භාවනා කළ බව ත්, පසුව 'හෛමවතා'දි නවනිකායවාසී භික්ෂුප්‍රතිරූපක තීර්ථකයන් ස්වදර්ශනානුප්‍රවෙශයෙන් ශාස්තෘශාසනය බිඳ සද්ධර්මප්‍රතිරූපක කොට "වර්ණපිටකා"දි ගත් කළ බව ත්, "ධර්මප්‍රදීපිකා"දියෙන් දතයුතු. මොවුන් කළ ලිඞ්ගපරිවර්තනය දක්වන විදෙශීය රූප මෙ කල අප රට සැදැහැති නුවණ නැති ලොකයාට දක්වමින් බුදුන් හා සමක්ෂ ශ්‍රාවකයන් සඞ්ගායනා කොට ස්ථාවිරීයනිකාය නමැති රත්නමඤ්ජූෂායෙහි නිධාන කළ "ශ්‍රමණලිඞ්ග"ය ත් එය වදාළ විනයධර්මය ත් පෙරළා ලන්නට යතනා ධැරිම දරුණු මැ අපරාධයෙකි. මේ බුදුසතුරන්ගේ "විකාරරූප" පිළිගතයුතු නම්, ඔවුන් ගේ ග්‍රන්ථ ද පිළිගතයුතු.

**"නාමං ලිඞ්ගං පරික්ඛාරං**
**ආකප්පකරණීයානි ච**
**පකතිභාවං ජහෙත්වා**
**තඤ්ච අඤ්ඤං අකංසු තෙ"** යි "දීපවංස" යි.

# 22. වර්තමාන බුද්ධරූප.
## ලක්දිව.

---

ලක්දිව පෙනී යන පැරණි බුද්ධරූපවලට ත්, ගන්ධාරාදිදෙශ වල රූපවලට ත් විරුද්ධ වූ රූපවිශෙෂයක් "බුද්ධරූප" නමින් මෑ මෙ කල අප දිවයිනෙහි බඳිත්. ඒ කිම යත්?

**"තස්ස පන රඤ්ඤො කාලෙ සල්ලවතියා නාම නදියා පච්ඡිමභාගෙ තුනනනාමකො ගාමෙ"** යනාදීන් කියමින් **"විරූපං ආපජ්ජිත්වා උභයංසිකගණො නාම විසුං භිජ්ජි"** කියයුතු තන්හි **"විරූපං ආපජ්ජිත්වා එකංසිකගණො නාම විසුං භිජ්ජි"** යි යොදා පටන් ගන්නා ලද "සාසනවංසප්පදීපිකා" යෙහි එන කථාමාර්ගයෙන් ශාසනද්‍රොහීන් කළ ලිඞ්ගපරිවර්තනයට ද වඩා බියකරු පරිද්දෙන් බුරුම භික්ෂූන් "ලිඞ්ගපරිවර්තනය" කළ බව පෙනී යන හෙයින් ඔවුන් කළ "ලිඞ්ගපරිවර්තනය" නම් මේ ය යි දක්වන රූප යි.

මැටිගල් ඈ කිසියම් ද්‍රව්‍යයෙකින් රූපයක් තනා ලිය හෙයි. එහි අප බුදුන් ගේ ආකල්පය පැණේ නම්, ඒ "බුද්ධරූප" සඞ්ඛ්‍යා යෙහි වැටේ. ඒ ආකල්පය මැ නො පැණේ නම්, මැටිරුවක් හෝ ගල්රූ ආදියක් වත් මුත්, එහි "බුද්ධරූපයෙක්" නැති.

මැටියෙන් වේ ව යි, ගලින් වේ ව යි, අනෙකෙකින් වේ ව යි, බුරුම භික්ෂූන් කළ ලිඞ්ගපරිවර්තනය දක්වන රූප කෙසේ "බුද්ධ රූප" වෙයි ද? බුදුන් ගේ ආකල්පය මැ නැති රූපවලට "බුද්ධරූප" ය යි නම් කර ලීම බියකරු පවෙකි. ඈග වසන සැටි වදහළ අටුවාපාඨයෙහි බුදුන් සියැසින් දැකා ගත් බුද්ධමහාඥ මහරහතුන් "ශ්‍රමණවෙෂය" දක්වා ලූ හෙයිනු දූ, බුදුන් ගේ චීවරප්‍රමාණය බුද්ධ වචනයෙහි මැ පෙනී යන හෙයිනු දූ, මේ අද ඊයේ දෙවුර වසා කළ රූප මේ "විභජ්ජවාදයේ" එන ලෙසින් බුද්ධරූපාකාර නො වන බව පෙනේ. ස්වර්ගමොක්ෂ සම්පත් පිණිස මැ පින් කැමැති සැදැහැතියන් ලවා සියදහස් මිල වියදම් කරවමින් මිථ්‍යාඥානය නිසා "බුද්ධරූපා"කාර නො වූවත් "බුද්ධරූප" ය යි තනවා ලීමෙන් අප බුදුන්ට අගෞරව කරන කල, මාහම්මදීකාදී විරුද්ධලබ්ධි ගත්තා වුනු දූ, සසුනට පහර දෙති යනු කිම සිතිය යුතු ද? නුවණැතියන් විසින් තමන් සතු සියදහස් සුවහස් මිල වියදම් කොට අකාරණයේ "බුද්ධරූපා"කාර නො වූවත් "බුද්ධරූප" ය යි නුවණමඳ

ලෝකයාට පිළිගන්වාලීමෙන් නිරා වැද පැසෙන්නට නො සිතිය
යුතු යි. දඹදිව ව්‍යාප්ත වුණු "ගොකුලික-වෛතුල්‍ය" ආදි ශ්‍රමණ
ප්‍රතිරූපකයන් ගේ නිකායවලින් කිලිටි නො වූ මේ උතුම් "විභජ්ජ
වාද"යට අයත් සද්ධර්මශාසනය ශාස්තෘ මෙන් දක්නා කවරකුට
වුව ද, මේ භයානක දරුණු අපරාධය වැටහිය යුතු යි. තමන් ධන
ය ත් වියදම් කොට ස්වකීය ශාස්තෘවරයාට මැ අගෞරව කිරීමෙන්
අනෙක වර්ෂ කොටිසහස්‍රයක් නිරා වැද පැසිය හැකි හෙයින්
කාරුණායෙන් මැ මෙය මතු කර ලියුම්හ. මේ රූප දැක බුද්ධානු
ස්මෘතිය පහළවතොත් නුවණ මඳ වූවන් තුළම යි. බුද්ධිමතුන් තුළ
නම්, මේ රූප දකුත් මැ බුරුම භික්ෂූන් කළ ලිඞ්ගපරිවර්තනය මුත්
අනෙකක් පහළ නො වේ. මේ ආකාර රූප බඳවා ලීමෙන් තමන්
ධනය වියදම් වැ යාම ත්, පරලොව අපායගතවීම ත් ඵල යි. "ධර්මා
ශොක" මහරජුන් ගේ ආධාර ලැබැ ශාසනද්‍රොහී පාපභික්ෂූන්
බැහැර කරමින් තුන් වන සඞ්ගායනායෙනු දු පවිත්‍රනාවයට ගිය
"ථෙරවාදය" දහම්සෝ රජුපුත් "මිහිඳු"මහරහතුන් විසින් ලක්
දිව පිහිටුවන ලදී. ඒ විභජ්ජවාද පරම්පරායෙහි භික්ෂූන් විසිනු දු,
සිංහලීයබෞද්ධගෘහස්ථයන් විසිනු දු, මත්තෙහි වන කුලදරුවන්
ගේ ත් ප්‍රයොජනය පිණිස මේ ශාසනපරම්පරාව පවිත්‍ර වැ
රැකිය යුතු යි. මිහිඳු මහරහතුන් වහන්සේ පිහිටුවා ලූ ශාසන
පරම්පරාවට ගෞරව කරන්නට කැමති භික්ෂූන් විසින් විනය
අටුවා ද විනයවිනිශ්චය ද, බුරුම රට "**සිහසූර**" රජු දවස දක්වා
අසම්භින්න වැ ආචාර්‍යාඩයෙහි ලිඞනය පැවත ආ සැටි ද, ප්‍රමා
ණවයෙන් ගෙන අද ඊයේ "බුද්ධරූප" නමින් දෙවුර වසා කළ
මේ රූප බුද්ධරූප නො වේ ය යි වර්ජනය කළ යුතු යි. මේ රූප වලැ
විනයධර්මයෙහි වැදැලා වූ ත් බුද්ධපුත්‍රවංශයෙහි පැවත ආවා වූ ත්
ලිඞනය නො පෙනී යන බැවිනි. ලිඞ්ගපරිවර්තනය කළ භික්ෂූහු
නානාප්‍රමාණයෙන් තමන් තමන් ගේ චිහන යොදා රූප බඳවා
ලමින් බුද්ධරූප හඳුන් වන රශ්මිමාලාදි චිහන ද යොදවා "දැන් මේ
බුද්ධරූපය" යි ලොකයාට පිළිගන්වා ලූහ. පැරණි විහාරයකට
පැමිණ බැලිය යුතු. අතීත වර්ෂදෙදහස තුළ මේ ධර්මද්වීපයෙහි කිසි
තැනෙක මෙ බදු රූපයක් සපයා ගත නො හේ. අතීතයෙහි
නො වුණු රූපවිශෙෂයක් මෙ කල විහාර වල වන්නට හෙතුව
රහත්කලට වඩා මෙ කල විනයධරයන් ඇති බව නො වේ. පුහු
දුන් වන සියල්ලෝ මැ වරදින සුල්ලහ. එසින් අප ගේ විභජ්ජවාදීවූ
මැ සබ්‍රම්සරු විනයධර්මය වරදවා ගැනුමෙන් මූලායෙහි වැටුණු
බව යි. ඔවුන් ස්වකීය සන්තානියට විරුද්ධ වැ අධිශීලය හැර පියා
"මණායාතා"දී නිකාය වැළඳ ගැනුම් කළ බව ද නො වේ. සතර

අපායට භය ඇති භික්ෂූන් විසින් මේ ආකාර රූප "බුද්ධරූප" විශයෙන් බඳවා ලීම හළ යුතු. බුද්ධප්‍රතිමාකරණය ඛ්‍යාත කුශලය කැමැති නම්, ශ්‍රීලඞ්කාද්වීපයෙහි පැරණි බුද්ධරූප බලා කළ යුතු සි.

සඳහන් කළ ඒ ඉතිහාසකාරයෙන් ලිඞ්ගපරිවර්තනය කළවුන් ගැන **"විනයපසන්නතිං යථාභූතං අජානන්තස්ස"** යි මහා නරපතීන් අවඥ බිණූ සැටි ද, **"දූරගාමිනො මාළුකං ආනෙත්වා තස්ස උපාසකස්ස ගෙහසමීපෙ ඔකිරාපෙසි"** යනුයෙන් ශාසනවංශපාලක මහ තෙරවරුන් ඔවුනට පරිභූත කොට වැලි දඬුවම් දුන් සැටි ද, **"රාජා තං රට්ඨන්තරං පෙසෙසි"** යනුයෙන් පරමබෞද්ධමහානරපතීන් ලිඞ්ගපරිවර්තනය කරනුවන් බුදු සතුරන් වශයෙන් ගෙන රටින් නෙරපූ සැටි ද, **'ආචරිය පවෙණිදස්සනවසෙන පාරුපනවාදං පතිට්ඨපි"** යනුයෙන් ආචාර්‍ය්‍යවංශපාලකතෙරවරුන් ආකාශගංගාව සේ නො සුන් වැ එන ආචාර්‍ය්‍යපරම්පරාව ඇද දක්වමින් "ඇපි ද ලිඞ්ගපරිවර්තනය කළ, එයින් ආකල්පය අනුරූදහන් වන හෙයින් මහාපරාධකාරයමෝ වම්හ. එන දවස ද සසුන් වැදගන්නා කුල දරුවෝ ත් වරදවා ගෙන අපායගත වෙති"යි බිය වැද "ලිඞ්ගපරිවර්තනය" ප්‍රතික්ෂෙප කළ සැටි ද, **"තතො පට්ඨාය යාවජ්ජතනා සකලෙ'පි මරම්මරට්ඨෙ පාරුපනවසෙන සමානවාදකා හොන්ති"** යනුයෙන් "අලෞංප්‍රා" රජු දවස උභයාංසවාදීන් ගේ වෛරනිර්‍ය්‍යාතනය නිසා සම්පූර්ණ බුරුමශාසනය ලිඞ්ගපරිවර්තනයෙන් අඳුරු වූණු සැටි ද, දන්නේ යැ. මේ ඉතිහාසකාරයෝ නම්, "මොවුන් කළ ලිඞ්ගපරිවර්තනය අශාසනතික බව යළි ත් මේ බුද්ධොත්පාදයේ නො කියත්වා" යි සිතමින් තමන් මැ ගේ ගුරුපරම්පරාවට ද, පැවති ශ්‍රමණවෙෂ"යට ද, නරයේ ගරහමින් වෛරශුද්ධියට ග්‍රන්ථය ලියූහ. එසේ වතු දු, ඔවුන් කී වචනයන්ගෙන් මැ ශාසනානුශාසනයේ වර්ෂ දෙදහසකට ද අධික කාලයක් "ලිඞ්ගය" පැවත ආ සැටි නම්, මේ පින්වතුන් ගේ නව්‍ය රචනාව නො වන බව පෙනේ මැ යි.

"මහළු පැරකුම්බා" රජු දවස අඛණ්ඩ වැ ආ සඞ්ඝසන්තතියේ ලජ්ජීන් වහන්සේ වහල් කොට ගෙන පාපභික්ෂූන් බැහැර කරමින් ලඞ්කාශාසනය ශුද්ධ කොළේ යැ. ඔවුන් ගේ ශාසන ශුද්ධිය බුරුමයේ ද, පිහිටුවනු කැමැති "ධම්මචෙතිය" රජු බොහෝ වෙහෙස විඳ ලක්දිවට දූත භික්ෂූන් එවමින් අධිශීලය ගෙන්වා ගෙන බුරුම ශාසනය ද ශුද්ධ කොළේ යැ. මෙසේ

ලඞ්කාශාසනය හා බුරුමශාසනය සමානවිහාර පරම්පරාව වියැ. මේ විහාරපරම්පරායෙහි පැවැති එකාංසලක්ෂණ "ලිඞ්ගය" හැරපියන්නට පටන් ගැනුම බුරුමයේ "සිහසූර" රජු අවධියේ වියැ. මෙසේ ශාසනානුශාසනයේ පැවත ආ "ලිඞ්ගය" අතුරුදහන් වෙමින් අන්‍ය ලිඞ්ගයක් පහළ වන බව දුටු පරම බෞද්ධ මහානරපතීන් විලෝපය ආරම්භ කළවුන් රටින් පිටුවහල් කළ බව පෙණේ. මේ උභයාංසවාදීන් ගේ වෛරයට කරුණු වියැ. මෙ කල ලක්දිව වසන අමරපුර රාමඤ්ඤ නිකායවල තෙරවරු— **"ධම්මචෙතිය"** රජුන් වහලින් වුණු ශාසන ශුද්ධිය හා මහාවිහාර පරම්පරාව තමන් කෙරේ ඇති බව සිතත්. ඔවුන් මැ මඟ යන්නාහු ඒ විහාරයේ පැවැත ආ **"ලිඞ්ගය"** තමන්හට නැතිබව නොදනිත්.

කවුරුන් විසින් වුව ද, විනයධර්මයේ අර්ථ පරීක්ෂා කරන කල පළමු වැ නිදාන යැ, පුද්ගල යැ, වස්තු යැ යන මේ පරීක්ෂා කළ යුතු සි. එය මෙහි කැලැ මැ දැක්වූම්හ. එක්බිති ආචාර්‍ය පරම්පරාව පරීක්ෂා කළ යුතු සි. එහින් ඈපි අමරපුර - රාමඤ්ඤ නිකායවාසීන් ගේ ඒ ආචාර්‍යවංශය දක්වන්නට මේ අවසරයෙහි මැ සඞ්ක්ෂෙපයෙන් මේ ඉතිහාසය ද, ප්‍රකාශ කළම්හ.

## 23. වාදස්ථානයෝ.

1. "කායං විවරිත්වා'ති ජත්තුම්පි උරම්පි විවරිත්වා" යනු යැ.
2. "ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යනු යැ.
3. "අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා- ගීවෙය්‍යකන්ති ගීවාවෙඨනධානෙ" යනු යැ.
4. "උභො කණ්ණෙ සමං කත්වා" යනු යැ.
5. "පටිසංහරිත්වා" යනු යැ.
6. "යාව මණිබන්ධං පටිච්ඡාදෙත්වා" යනු යැ.
7. "ජත්තූනි'පි උරම්පි ච විවරිත්වා" යනු යැ.
8. "ගලවාටකතො පට්ඨාය සීසං" යනු යැ.
9. "මණිබන්ධතො පට්ඨාය හත්ථෙ" යනු යැ.
10. "සගුණං කත්වා'ති වෙ චීවරානි එකතො කත්වා" යනු යැ.
11. "සංහරිත්වා බාහාය උපරි ඨපිතා උභො අන්තා බහිමුඛා තිට්ඨන්ති" යනු යැ.
12. "චීවරං පාරුපිත්වා කායබන්ධනං බන්ධමෙ'ව වට්ටති', යනු යැ.

මේ දෙලොස් වාදස්ථානයෝ යි. මේ ස්ථානවලට තුඩු ලනු කොට ගත් තන් වැදෑරුම් පාඨයෝ ද වෙති. මේ වාදස්ථානයන් කෙරෙහි අට්ඨකථායෙහි එන පාඨයෝ මැ ගතයුත්තාහ. එයින් ඉෂ්ටාර්ථසිද්ධිය වත් මැ අන්‍ය පාඨයෝ නිෂ්ප්‍රයොජන වෙති. එහි දු, **"කායං විවරිත්වා'ති ජත්තුම්පි උරම්පි විවරිත්වා"**යි වදාළ වස්තුයෙහි භූතාර්ථය දත, එතෙකින් "ශ්‍රමණවෙෂය" එකාංස කොට වෙයි ද? නො වෙයි ද? යනු නිශ්චය වන්නේ යැ. එය මූලස්ථාන යි. වාදීහු එහි මැ භූතාර්ථය නො දුටුහු. උභයාංස වාදීහු මෙහි ප්‍රථම වැ දැක්වුණු වාදය මෙසේ ගනිති. ("සුඛවජ්ජාද විභාවිනී" ආදිය බැලිය යුතු.)

**"කායං විවරිත්වා'ති, කායං විවරිත්වා යනු; ජත්තුම්පි උරම්පි විවරිත්වා; එකාංස කොට ගෙන"** යනු ඔවුන් භාවය ගන්නා සැටි යි. ගත වුණු වර්ෂවල ඔවුන් පළ කළ පත පොත බැලිය යුතු. "උපන්වරද" එකාංස කොට ගෙන ඇතුළුනෙහි යාම යැ. ඒ වරදෙහි වදාළ සුපිළිසන්සික නම්, එකාංස කොට ගෙන යාම වරද බව කියයි. එයින් ශාසනූශාසනසඞ්ඛ්‍යාත මේ විභජ්ජවාදයේ ආචාර්‍ය්‍යවංශයේ පැවැත ආ සැටි වරද යැ. මෙසේ උභයාංස වාදීහු වස්තුව වරදවා ගනිමින් වර්ෂ දෙදහසකට අධික කාලයක් ගම්වැදීමෙහි පැවැත ආ එකාංසලක්ෂණලිඞ්ගය හැරපීහ. මේ ව්‍යාඛ්‍යානයෙන් මුළා වුණු ලිඞ්ගපරිවර්තනය නො කළ ප්‍රවේණි පාලක භික්ෂූහු එහි යථාර්ථය හෙළි කිරීමෙහි අසමර්ථ වැ ආචාර්‍ය්‍ය වංශය තරයේ ඇරපෑහ. ඉතරයන් ආචාර්‍ය්‍යවංශය තෘණපතක් තරම් වත් වටනා කොට නො සිතූබදැයි සිතේ. ඔවුන් ආචාර්‍ය්‍ය වංශය නො තකාලීම අශ්‍රද්ධායෙන් නො වේ. ආරම්භයෙහිදී අටුවා පාඨය ත් විනයවිනිශ්චය ත් වරදවා තේරුම් ගැනුම්. ඒ එසේ මැ යි. **"ජත්තූනි'පි උරම්පි ච විවරිත්වා"** යි කී "වනවිනිසත්" එයට කළ **"ජත්තුනිපි'ති උභො අංසකූටානි, විවරිත්වා'ති, අපටිච්ඡාදෙත්වා"** යි ටීකා ත් ගෙන උරහිස් දෙක නො වසා යන්නාහට ඇවැත් කීහයි ද, එයින් උරහිස් දෙක වසා යන්නාහට ඇවැත් නැතැ යි ද ව්‍යාඛ්‍යාන කළහ. ගත වුණු වාද වලැ මොවුන් පළ කළ පත පොත ගෙන බැලිය යුතු. මොවුන් ගේ ව්‍යාඛ්‍යානයෙන් මුළා වුණු ප්‍රවේණිපාලකයෝ මෙ තන්හි මුව නගන්නට මහක් නො දුටුවෝ දෙපසෙකින් අසමර්ථ වූහු. ත්‍රිපිටකධාරී කුශාග්‍රීය බුද්ධිමත් මහා අට්ඨකථාචාර්‍ය්‍යවරයන් ගේ වචන හෙයින් සාවද්‍ය යි බැහැර ලන්නට ත් අසමර්ථ වූහු. එහි යථාර්ථය හෙළි කරලන්නට ත් අසමර්ථ වූහු. මේ ප්‍රවේණිපාලකයන් ලියා පළ කළ පත පොත බැලිය යුතු.

මේ උභයපක්ෂයෙහි මැ වූවෝ තුන් සිවුරු එකතරම් බව ගැන කවරලෙසකින් වත් නො සිතූහු මැ යි. එයින් දෙකොළවර සම කිරීම යැ, බාහුවන්තලක්ෂණ යැ, ගැටවටු පස්වටු බැඳලීම යැ යනාදිය වරදවා ගත්හ යනු කියයුතු ම නො වේ.

විනයශික්ෂා අවබොධ කර ගන්නට නම්, ශික්ෂාප්‍රඥප්තියෙහි ලා උපන් වරද පරීක්ෂා කරලීම කාරණ වුව ද, එය මැ වරදවා ගැනුමින් මෙහි එළවුණු ස්ථානයෝ "විවාදස්ථානයෝ" නම් වූහ. "උපන් වරද නම් මේ යැ" යි දන්නක්හට මේ ස්ථානයෝ "විවාද ස්ථානයෝ" නම් නො වෙති. මේ කරුණු ගැන ඔවුනොවුන් ගත වුණු ශතවර්ෂ තුනසතර තුළ ලොකයේ විවාද කරමින් තෝරා ගත් සැටි ඒ වාද ඇසුවන් අතිනුදු, ලියා පළ කළ "සුධච්ඡාද විභාවිනී" ආදි පතිනු දු, පොතිනු දු, දන්නේ යැ. "විභජ්ජවාදයේ ලිඞ්ගය පැවැත ආ සැටි දන්නට කැමතියන් විසින් විනය අටුවා වත්, විනයවිනිශ්චය ත් බැලියයුතු" යැ යි ශුද්ධභාදයෙන් කියන්නට නො බාන භික්ෂූහු වෙත් නම්, ඒ "පාරුපනපාළිය" නිකුත් වීමෙන් වූ ඵලයෙකි. එතෙක් ඒ පොත්වලැ "එක් දසරුවක් වසන සැටි මැ කීහ" යනු කවර දෙශයෙක වත් නො දන්හ.

## 24 සමාහාරය.

අග්‍ර දක්ෂිණාගී **"මහාකාශ්‍යප"**දි **ස්ථ**විරොත්තමයන් නිසා පවිත්‍රිත වූ ද, වෛතුල්‍යාදී නිකායාන්තරයන් ගෙන් අසම්මිශ්‍ර වූ ද, **"ථෙරියනිකාය"** නම් ලද මහාසඞ්ඝපරම්පරාව අද දක්වා නො සුන් වැ එයි. මේ සඞ්ඝපරම්පරායෙහි නිර්මල ධර්මවිනය නම්, පෙළබසින් යුත් තෙවළා දහම්. සියම් යැ, අමරපුර යැ, රාමඤ්ඤ යැ, යන හෙදකල්පනය දෙශබීල්‍යයෙකි. ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙකුන් ගේ වාද පිණිස හෙද වුව ද, මේ සියල්ලෝ මැ තෙවළා දහම්හි සමානවාදීයහ. උපසම්පදාකර්මයෙනු දු, සමානයහ. නිකායවිසිනු දු, ථෙරවාදීයහ.. එයින් සියල්ලන් කෙරෙහි සමාන **"ශ්‍රමණවෙෂය"** පැවැතිය යුතු යැ. ලිඞ්ගයෙන් සමාන වත් මැ. යළි දු, මේ **"ථෙරියනිකාය"** නභො මධ්‍යගත සූර්‍ය්‍යමණ්ඩලය සේ බබළන්නේ යැ.

මේ **"ථෙරියනිකාය"**යෙහි උභයාංසවාදී යැ, එකාංසවාදී යැ යි දෙදෙනෙක් නො වූහ. සමානලිඞ්ගධර අප ගේ සබ්‍රම්සරුන් කෙරෙනි කෙනෙක් අටුවායෙහි මූළා වැ තමන් සබ්‍රම්සරුනට විරොධ වැ පැන නැඟ ලිඞ්ගපරිවර්තනය කරමින් තමන් මැ ගේ

සබ්‍රම්සරුනට පහර දෙන්නට වන්හ. යකඩින් නැඟි මල යකඩය කාදමන්නේ යම්සේ ද, එමෙන් මැ අප ගේ සබ්‍රම්සරු මැ අප උතුම් ශාසනයේ ආ **"ශ්‍රමණවෙෂය"** කාදමමින් ලිඞ්ගපරිවර්තන සඞ්ඛ්‍යාත භයානක ශාසන විලොපය කළහ.

**"අයසා'ව මලං සමුට්ඨිතං, තදුට්ඨාය තමෙ'ව ඛාදති**
**එවං අතිධොනචාරිනං, සකකම්මානි නයන්ති දුග්ගතිං"**

යනු මෙ බදු තන්හි සිතිය යුතු යි. "තුන්සිවුරට සමාන ශික්ෂා යැ සමාන අර්ථකථා යැ" යනු නො දත ත්, මූල දී සුපිළිසන් සිඛයේ අටුවාපාඨයේ යථාර්ථය දැන ගත්තු නම්, ශාසනයේ පැවැත ආ ඒකාංසලක්ෂණ ලිඞ්ගය හැර පියා අන්‍ය වෙෂයෙකින් මඟ බැස නො යෙත් මැ යි. අප විසින් විනයධර්මයෙහි අර්ථ පරීක්ෂා කරන්නට වදළ රිතීන් රෙඛාමාත්‍රයකු දු බැහැර නො ගොස් නිදෘත පුද්ගල වස්තු ආදිය ගෙන තදනුරූප කොට සුපිළිසන් සිඛයේ අටුවා යෙහි භූතාර්ථය හෙළි කරන ලදී. ලිඞ්ගපරිවර්තනය පටන් ගත් තන් පටන් ගෙන, ඒ පිළිගත්තන් තමන් ගේ ග්‍රන්ථ වල ද, අත් ලිපි වල ද, ශතවර්ෂ තුන සතරක් තුළ ලොකයා මුළා කරන දැය ලියූ හෙයින්, අප විසින් මෙය හෙළි නො කරන ලද නම්, ථෙරවාද යේ ආ **"ශ්‍රමණවෙෂය"** හැර පියා අන්‍ය වෙෂයක් රචනා කළ බව මතුයෙහි දු නො දනිත්. එයින් අප විසින් අත්‍යුදාර ශාසන සඞ්ග්‍රහයක් කරන ලදැයි සිතම්හ.

මෙසේ හෙයින් තමන් බුදුන් ගේ පුත්‍ර බව දන්නා, ශාස්ත්‍රෘ ශාසනය වහල් කොට පරලොව අර්ථසිද්ධිය ත් කෙළවර මොක්ෂ ය ත් පතන, ශාස්ත්‍රෘශාසනයේ අන්තර්ධානය කැමති නො වන, තමන් නිසා වසන කුල දරුවන් විපතට හෙළනට නො කැමති, සසුන් වන් බුද්ධිමත් ආචාරකුලපුත්‍රයන් විසින් මේ **"විනය විනිශ්චය"** අත්‍යාදරයෙන් ග්‍රහණධාරණාදීන් පිළිගෙන අවා දුකින් නිදහස් වන්නට ද, ලොවී ලොවිතුරා සැප පිණිස පවත්නා ශාස්ත්‍රෘශාසනය හොබවා ලන්නට ද යතන ධැරිය යුතු. පෙළ අටු වාහි ආදර බහුමාන උපදවමින් ශාසනයේ පැවැත ආ වා වූ ත් විනයධර්මයෙහි වදළා වු ත් ලිඞ්ගයෙන් මැ මඟ බැස යන්නට, උත්සාහ ධැරිය යුතු යි. ඥරා ගේ සිඟු පසින් යැපෙතු දු, **"යමක් පිරිසෙයින් ආකල්පමාත්‍රය පවා නිසි සේ නැති"** යි සැදැහැති බුද්ධිමත් ජනයන් අතරින් නැඟිය හැකි නිග්‍රහයෙන් මිදී යන්න ට සයත්න විය යුතු යි. සුපිළිසන් සිඛයේ අටුවා පාඨයෙහි යථාර්ථය හෙළි කෙරෙමින් **"ස්ථවිරවාදයෙහි"** ශ්‍රමණවෙෂය පැවැත ආ සැටි දු, ලිඞ්ගපරිවර්තනයෙන් එය අතුරුදහන් වන්

නට පටන් ගත් සැටි දු, පාදැළිම අද වුව ද, මත්තේ වුව ද, ලජ්ජීන් වහන්සේට අර්ථ පිණිස මැ වන්නේ යි. අහසෙහි අත් නගා ලූ කල වාතමාත්‍රය ස්පර්ශී වන බව මුත් අත්ලා ගත යුතු දැයෙක් නො ලැබෙයි. ලිඞ්ගපරිවර්තන සඞ්ඛ්‍යාත උභයාංසවාදය **''ශ්‍රමණවෙෂයැ''** යි දක්වන්නට සාධකත්වයෙන් සුපිළිසන් සිඛයේ අටුවා පාඨ යට නුවණ ලුව' එයට ගිනකර නොම්බු මාත්‍රයෙක් වත් එහි නො ලැබෙයි. එයින් බුරුම භික්ෂූන් විසින් ශාස්ත්‍රශාසනයේ පැවත ආ එකාංසලක්ෂණ **''ශ්‍රමණවෙෂය''** සාදමමින් අන්‍ය වේෂයක් රචනා කර ලීමෙන් කරන ලද්දේ බලවත් අයුත්තෙකැ යි ද, නිශ්චය විසින් දතයුතු යි. මෙසේ මේ ලේඛනයෙහි ගත වූණු ශතවර්ෂ තුන සතර තුළ **''සංවිජ්ජියනිකාය''** යෙහි වූ සියලු බුද්ධමතුන් විසින් මැ අවුල් කරන ලද සියලු විවාදස්ථාන අනාර්ථයෙන් මැ භ්‍රමමාත්‍ර යැ යි දක්වා ලූ සැටි නුවණැතියන් විසින් පරීක්ෂා කළ යුතු යි.

මෙහි දී ඇපි ලිඞ්ගපරිවර්තනය කළවුන් ගේ ත් නො කළවුන් ගේ ත් වාදස්ථාන ගෙන පෙළ බලමින්, පෙළට අටුවා සසඳ බලමින්, අටුවාවට ටීකා සසඳ බලමින්, ශාසනයේ පැවැත ආ සැටි බලමින්, අනත්ථානය පටන් ගත් අවධි බලමින්, සුපිළිසන් සිඛයේ අටුවාපාඨයෙහි වදහළ ''සුපිළිසන්'' නම් ශ්‍රමණවෙෂධරයා මේය යි වෙන් කර ලන්නට යතනා ධැරුම්හ. එසේ මැ සියල්ලන් නිර්විවාදයෙන් පිළි ගන්නා විනයප්‍රකරණවල එන පාඨ ප්‍රමාණත්වයෙන් ගෙන, නාදනාප්‍රකරණ වල ඇතැම් ව්‍යාකුලාර්ථ නිරාකුල කරනට යතනා ධැරුම් හ.

එයින් අද වේව යි, මත්තේ වේව යි, විනයධර්මයෙහි හසළ බුද්ධි ඇති බුද්ධ පුත්‍රයන් ගේ චිත්තාරාධනයට මෙය ප්‍රමාණ වේව යි ද, පතම්හ.

මේ ලේඛනය ආත්මෝත්කර්ෂය සඳහා නො වෙයි. පරවම්භනය සඳහා නො ද වෙයි. නිකායකට ගණයකට පහර දෙන්නට නො ද වෙයි. ධර්මයෙන් විනයෙන් ශාස්ත්‍රශාසනයෙන් කරුණු දක්වමින් පස්වාදහස තුළ මේ ''විභජ්ජ වාද'' යේ පිහිටිය යුතු. ''ලිඞ්ගය'' අතුරුදහන් නො වේව යි, ව්‍යාකූල නො වේවා යි සිතමින් මෙය ලියුම්හ.

අධිගම සද්ධර්මයට කරුණු වන මේ දුර්ලභ ප්‍රතිපත්ති සද්ධර්ම ශාසනයෙන් තමහට ත් පරහට ත් වැඩ පසස්නා උගත් දෑ විසින් ලිඞ්ගපරිවර්තනය නො කට යුතු යි. තමන් ලිඞ්ගපරිවර්තන දීන් ශාස්ත්‍රශාසනය නො නසානු වන් දැකැ ශිෂ්‍ය ප්‍රශිෂ්‍යයෝ ත්

ශාසනෘශාසනය නො හකත්. ඒ එසේ මැ යි. එකකු ගේ ගර්හිත ක්‍රියාව දක අන්‍යයෝ ත් ඒ ගර්හිත ක්‍රියාව කෙරෙත් මැ යි. එහි බිය නො වෙති. ලොකයෝ නම් ගතානුගතිකයෝ යැ.

කීයේ මැනු:-

"එකස්‍ය කර්ම සංවීක්‍ෂ්‍ය
කරොත්‍ය'න්‍යො'පි ගර්හිතම්
ගතානුගතිකො ලොකො
න ලොකඃ පාරමාර්ථිකඃ" යි.

## 25. පයඅීවසානය.

1. වීයැ "**සිහසුර**" නම්—තිරිදෙක් බුරුම රට පෙර
එ සදෙහි "**සුනද, දිසබා—කැලණි**" ඈ මේ තෙරවරු
2. ඈදුරු පරපුර එන—කියමින් ඈවිදි වෙසැ දෙස්
පෙරළා බුදුන් වදහළ—වතදම් කළෝ වියකත්
3. ඔවුන් හෙපුලින් ලිහු—පෙරළු මෙ ලක සමහරු
බුදුරු නමින් තැන තැන—නම තම රු ද බැන්දෙ
4. මෙ වේ "**පරපුර**" නම්—මේ "**සුසිළිසන්සිය**" නම්
"**වනවිනිස**" නම් මේ වේ—බලව් ඇහි හපු නුවණින්
5. මෙ ලෙස හෙලි කොරෙමින්—කොළෙම්"පෙරෙවුම්පෙළ" පෙර
දක්මින් අතුරුදන් වන—සැටි "**ලිහු**" සසුන ගොයුම්
6. පෙළ බස නො දතුවන්—පිණිස යලි මේ සගරා
නෙතිණි ගෙන "**පෙල අටුවා—වනවිනිස**" පොත් හෙළු
යෙන්
7. කලෙක සිට ලෝකුස—පහළ වියතුන් පළ කළ
විනිස ද, බලා මුනිදුන්—සසුන දියුණුව සඳහා
8. "**සුසිළිසන්සිය පද—ගැටනැනු**" දු හෙලි කොරෙමින්
අහංගම් පුර "**විදුසඳ—සිරුවන් හිමිහු**" කොළෙ මේ
9. මහ මිහිදු පරපුර—"**ලිහු**" වනවළා වදහළ
සම් සෙ නොසිතාව් වියතිති—ලිහු ද "**මහයන්**" ඇදුරන්
10. මෙ පිනින් මතු සසර—නො ලබම් දුදන සෙවුමක්
ලබම් නුවණක් පිරිසිදු—පරනට මැ වැඩ සඳහා.

— සිඬම්. —

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු